**2019/02/12 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව**

2019/02/12 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 11. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 12. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 13. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 14. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 16. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 17. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 18. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 19. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 21. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 22. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | වී.ජී.අරුණ ශාන්ති මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

2019.02.12 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

සුභ උදෑසනක් වේවා සියලුම දෙනාට. ප්‍රථමයෙන්ම අද දින උපන්දිනය සමරන ධනංජය විලේගේ මන්ත්‍රීතුමාට අපි සියලු දෙනාගෙම සුභ පැතුම් දීර්ඝායුෂ නිදුක් නිරෝගී සුවය ප්‍රාර්ථනා කරමින් සුභ උපන් දිනයක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම උප සභාපතිතුමා ඇතුළු පැමිණ සිටින සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ඉතා ගෞරවයෙන් පිළිගනිමින් 2019 පෙබරවාරි මාසයට අදාල සැසි වාරය ආරම්භ කිරීමට බලාපොරොත්තු වෙනවා.

**(අ)01. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

නැත.

**(අ)02. 2019.01.08 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

ඒ අනුව සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස **ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ආ). සභාපති තුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

01 . ගරු මන්ත්‍රී ගයාන් මධුසංක මහතා නිවාඩු අනුමත කර දෙන ලෙස ඉල්ලා එවන ලද ලිපිය සභා ගත කරන ලදී.

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, නාගොඩ විසින් යොමු කරන ලද සුඛිත පුරවර කුඩා නගර සංවර්ධන වැඩසටහන 2019 සම්බන්ධව 2019.02.07 දිනැති ලිපිය සභාගත කරන ලදී.

02. කසුන් නාමල් ලියනගේ ඌරල වදුරඹ, මහවත්ත කරා කුඹුර මාර්ගය සකසා ගැනීම සම්බන්ධදව 2019.02.05 යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

- තාක්ෂණ නිලධාරියෙකු යොදවා පරීක්ෂාකර බලා ප්‍රාදේශීය සභාවේ ප්‍රතිපාදන නොමැති බැවින් මන්ත්‍රී කෙනෙකුගෙන් ප්‍රතිපාදන ලබා ගෙන මෙම පාර සංවර්ධනය කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.
- මෙම මාර්ගය දෙපස සින්නක්කර ඉඩම් පවතින බවද, පතිනායක මන්ත්‍රීතුමා විසින් පෙන්වා දෙන ලදී.

03. යුනයිටඩ් ග්ලාස් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය මගින් යොමු කරන ලද 2019.01.22 දිනැති ලිපිය සභාගත කරන ලදී.

- මේ සම්බන්ධව එම ආයතනය සමග කතා කොට ඉදිරි කටයුතු කරන බවද, එමෙන්ම අවශ්‍ය වුව හොත් ඇප්තොප් වත්ත කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ භාවිතයට යොදා ගැනීමට හැකි බවද ගරු සභාපති තුමා විසින් ප්‍රකාශ කරන ලදී.

04 පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් තාක්ෂණික දීමනා වැඩි කර දෙන ලෙස ඉල්ලා 2019.02.06 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

- මුදල් නොමැති බැවින් මේ අවස්ථාවේ දී දීමනා වැඩි කළ නොහැකි බවත්, ඉදිරියේදී ඒ සම්බන්ධව සලකා බැලිය හැකි බවත් ගරු සභාපති තුමා විසින් ප්‍රකාශ කරන ලදී.

05.ඩබ්.ජී.සී.මදූෂානි ප්‍රාදේශීය සභාව නාගොඩ තැපැල් ගාස්තු ලබා ගැනීම සඳහා ඉල්ලීම් කරන ලද 2019.02.06 දිනැති ලිපිය සභා ගත කරන ලදී.

06. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී විලේගේ අමර ධනංජය මහතා විසින් උඩුගම නගර ශාලාව නොමිලේ ලබා ගැනීම සඳහා යොමු කරන ලද 2019.02.06 දිනැති ලිපිය සභා ගත කරන ලදී.

- සභාවේ ඒකමතික තීරණය අනුව නොමිලේ ලබා දීමට ගරු සභාපති තුමා විසින් තීරණය කරන ලදී.

07. අවන්ත පද්ම මහතා විසින් ප්‍රධාන කාර්යාලයේ පරිගණක සම්බන්ධව යොමු කරන ලද 2019.02.08 දිනැති ලිපිය සභාගත කරන ලදී.

- කාර්යාලයේ අවශ්‍යතා සඳහා පරිගණක ලබා ගැනීම සුදුසු බව සභාවේ ඒකමතික තීරණය විය.

08. LL7650 කෘ කැබ් රථයේ දැනට පවතින අඩුපාඩු හා අලුත්වැඩියා කිරීම් සම්බන්ධව ආදේශක රියදුරු කැලුම් මහතා විසින් යොමු කරන ලද 2019.02.12 දිනැති ලිපිය සභාගත කරන ලදී.

- තාක්ෂණ නිළධාරි වාර්තාවක් ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට ගරු සභාපති තුමා විසින් තීරණය කරන ලදී.

09.252-6478 කැබ්රථය සේවා කිරීම හා අලුත්වැඩියා කටයුතු සම්බන්ධව රියදුරු පියතිලක මහතා විසින් යොමු කරන ලද 2019.01.31 දිනැති ලිපිය සභාගත කරන ලදී.

- තාක්ෂණ නිළධාරි වාර්තාවක් ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට ගරු සභාපති තුමා විසින් තීරණය කරන ලදී.

10.බී.ඩී.එල්.දිල්රුක්ෂි කුමාරි, පුස්තකාලයාධිපති, නාගොඩ විසින් යොමුකරන ලද නාගොඩ මහජන පුස්තකාලයට අවශ්‍ය උපකරණ ලබා ගැනීම සම්බන්ධ 2019.01.24 දිනැති ලිපිය සභාගත කරන ලදී.

11.එස්.කේ.ජී.මදූසංඛ, සිකි හාර්ඩ්වෙයාර්, උඩුගම දකුණ කන්ටේනර් ටැංකියක් තබා ගැනීමට අවසර ඉල්ලීම 2019.02.12 දිනැති ලිපිය සභාගත කරන ලදී.

- ගරු මන්ත්‍රීවරුන් වන අජිත් එඩේර ආරච්චි මහතා, චන්ද්‍ර සහබන්දු මහතා, චන්ද්‍රසිරි වනිගරත්න මහතා හා ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා මේ සම්බන්ධව අදහස් දැක් වූ අතර අදාළ පුද්ගලයාගෙන් ලිපියක් ලබාගෙන මාස 06ක කාල සීමාවකට අවසර ලබා දීමට සභාවේ ඒකමතික එකගතාවය පලවිය.

12.නො: 20, මානගොඩ පාර, මාපලගම මධ්‍යම ලිපිනයේ පදිංචි ගම්වාසින් විසින් නො:20 ගම්මානයට කරදරයක් වන පරිදි තල්ගස්වල වතු යායේ කටුපොල් වගාව සම්බන්ධව 2019.02.12 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

13.බද්දේගම නාගොඩ හරහා උඩුගම බස් ධාවනය පිළිබඳව අනුෂා තුඩුගල මිය, දිසා/මාහේස්ත්‍රාත් අධිකරණය උඩුගම විසින් යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

14. PF-7360 දරණ කැබ් රථය සේවා කිරීම සම්බන්ධව රියදුරු එම්.ඒ වසන්ත මහතා යොමු කරන ලද 2019.02.08 දිනැති ලිපිය සභාගත කරන ලදී.

15.නිදැල්ලේ හැසිරෙන ගවයන්ගෙන් සිදුවන වගා හානි සම්බන්දව ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, නාගොඩ විසින් යොමු කරන ලද 2019.01.29 දිනැති ලිපිය සභාගත කරන ලදී.

**(ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**නැත.**

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ)1 ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා**

01. වර්තමාන සමාජයට මහත් ව්‍යසනයක්ව පවතින මත් උවදුර සමස්ත සමාජයෙන් තුරන් කිරීමේ අරමුණ පෙරදැරිව මත් උවදුර මර්ධනය කිරීම සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහනක් පාසල් දරුවන් 250 දෙනෙකු ඉලක්ක කර ගනිමින් සිදු කිරීමට යෝජනා කරන අතර ඒ සදහා දැරීමට සිදුවන රු:20,000.00 ක මුදල සභා අරමුදලෙන් දැරීමට යෝජනා කරමි.

- මේ සම්බන්දව ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා දීර්ඝ ලෙස අදහස් දැක්වූ අතර ගරු සභාපති තුමා ප්‍රකාශ කර සිටියේ අපි මේ වැඩසටහන අපේ බල ප්‍රදේශයේ පොදුවේ සෑම පාසලක්ම නියෝජනය වන පරිදි කරමු යනුවෙනි.
**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

02. 2019 වර්ෂයේ නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වෙසෙන ජනතාවට ප්‍රජා සත්කාරයක් කිරීමේ අරමුණ ඇතිව බෝ නොවන රෝග කල් ඇතිව හඳුනා ගැනීමට ප්‍රදේශවාසී ජනතාව යොමු කිරීම මගින් රෝග වලින් ඇතිවන සංකූලතා අවම කිරීමට ආයුර්වේද වෛද්‍ය සායනයක් පැවැත්වීමට අපේක්ෂා කරන අතර ඒ සදහා රු:10,000.00 ක මුදලක් සභා අරමුදලින් වියදම් දැරීමට යෝජනා කරමි.

- මේ සම්බන්දව ගරු සභාපති තුමා කියා සිටියේ ආයුර්වේද වෛද්‍යවරු සායනය නොමිලේ සිදු කරන අතර අපට එය සංවිධානය කර ගැනීමට පමණක් සිදු වන බවයි.ගරු මන්ත්‍රී රංජිත්

ජයවීර මහතා කියා සිටියේ මෙවැනිම සායනයක් පළමු වැනිදා කුඹුරුහේන පන්සලේ සංවිධානය කර ඇති බවයි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

03. සභාපතිතුමන් ඇතුළු ගරු මන්ත්‍රීවරුන් පත් වී අවුරුද්දක් සපිරීම නිමිති කර ගනිමින් ඊට සමගාමීව ප්‍රාදේශීය සභාව සංස්ථාපනය වූ දින සිට ධුර දැරූ ගරු සභාපතිවරුන්, ගරු මන්ත්‍රීවරුන් සහ ලේකම්වරුන් හට උපහාර පිරිනැමීමේ උපහාර උත්සවයක් පැවැත්වීමට යෝජනා කරන අතර, ඒ සඳහා වැය වන මුදල වන රු:150000.00 ක මුදල සභා අරමුදලෙන් වියදම් දැරීමට යෝජනා අතර එදිනම අලුතින් ඉදිකරන ලද කාර්යාල කාමර කොටසේ වැඩ අවසන් වී ඇති බැවින් ඒ සඳහා ගෙවදීමට ගිහි පිරිතක් සංවිධානය කිරීමටත්, ඒ සඳහා වැය වන මුදල් සභා අරමුදල් මගින් දැරීමටත් යෝජනා කරමි.

- ගරු සභාපතිතුමා අදහස් දක්වමින් කියා සිටියේ 1991 සිට මේ දක්වා ඔබ තුමන්ලා ඇතුලුව මන්ත්‍රීවරු මන්ත්‍රීවරුන්ගේ ලැයිස්තුවක් සකස් කළ බවත් ඉන් දෙදෙනෙකු ජීවතුන් අතර නැති බැවින් ඒ සඳහා පවුලේ අයෙකු සමබන්ද කරගැනීමට අදහස් කරන බවයි.

**ගරු සභපතිතුමා විසින් ගෙනෙන ලද යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

04. ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ තැපැල් ගාස්තු සඳහා මාසිකව රු.7000.00 ක මුදලක් ලබා දීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

05. තාවකාලික පදනම මත විදුලි කාර්මිකයෙකු හා සෞඛ්‍ය කම්කරුවන් කිහිපදෙනෙකු බඳවා ගැනීමට යෝජනා කරමි.

- විදුලි කාර්මිකයෙකු පමණක් සභාවේ සිටින අතර ඔහු හදිසි අවශ්‍යතාවයකදී නිවාඩු ලබා ගත්විට සේවය ලබා ගැනීමට අපහසු බැවින් විදුලි කාර්මිකයකු හා , කොම්පෝස්ට් ව්‍යාපෘතියේ කටයුතු විධිමත්ව පවත්වා ගෙන යාම සඳහා සෞඛ්‍ය කම්කරුවන් දෙදෙනකු බඳවා ගැනීමට බලාපොරොත්තු වන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපතිතුමා විසින් ගෙනෙන ලද යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

06. 2019 වර්ෂය සඳහා රක්ෂණ වාරික ලබා නොගත් RA-8570 ට්‍රැක්ටරය, RA-8569 ට්‍රැක්ටරය RH-2239 සුදු යකඩ බවුසරය, RW-9115 ටේලර් බවුසරය, RW-9116 ටේලර් බවුසරය,

RV-5013 ට්‍රැක්ටර් ටේලරය, 340- 4321 අත්ට්‍රැක්ටරය සඳහා මුළු මුදල රු.13683.78 ක් වැය කර රක්ෂණ සහතික ලබා ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

07. නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් මාපලගම වෙළඳ සංකීර්ණයේ උඩුමහළ කාමර අංක 05 තේනුවර ආචාරිගේ නුවන් තරංග චමින්ද ලියාපදිංචි හිමිකරු වන අතර මෙම කඩ කාමරය ඔහුගේම බාල සහෝදරයා වන තේනුවර ආචාරිගේ නන්දන යන අයට පවරා දීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

08. මාපලගම පැරණි කඩ කාමර කාමර අංක 04 හි ලියාපදිංචි හිමිකරු වන ජේ.පී.ඉන්ද්‍රසිරි මයා, (ජයමිණි සයිකල් වර්ක්ස්) මියගොස් ඇති බැවින් ඔහුගේම පුත්‍රයා වන ජාගොඩගේ තිලක් ජයමිණි යන අයට මෙම කඩ කාමරය පවරා දීමට යෝජනා කරමි.

- මෙහිදී ගරු මන්ත්‍රී බන්දුල සමන්ත හිරිමුතුගොඩ මහතා කියා සිටියේ මෙම වෙළඳ සැලෙන් හා ප්‍රියංකා වෙළඳ සැළෙනුත්,පෙට්ටි කඩෙනුත් සභාව බදු අය නොකරන බවයි.ගරු උප සභාපතිතුමා,ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා මේ සම්බන්දව අදහස් දැක්වූ අතර ගරු මන්ත්‍රී නන්දන නිශාන්ත මහතා කියා සිටියේ ගිවිසුම් ගත වීමට කැමති නම් ගිවිසුම් ගත වන ලෙසයි.ගරු සභාපති තුමා අදහස් දක්වමින් ලබන සභා වාරයට මේ පිළිබඳව සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරන ලදී.

09. උනන්විටිය අගහරුවාදා සතිපොලෙහි ජල අවශ්‍යතාවය සඳහා නළ ලිදක් ස්ථාපිත කිරීමට යෝජනා කරමි.

- මේ සම්බන්දව ගරු සභාපති තුමා කියා සිටියේ මෙම පොල වෙන්දේසි නොවුන බැවින් සභාව මගින් කරන බවත් එමගින් පෙරට වඩා ලාභයක් ද ලබා ගන්නා බවත් වෙළඳුන්ගේ ජල අවශ්‍යතාවය සපුරාදීම මගින් මීටත් වඩා වැඩි ලාභයක් ලබා ගත හැකි බවයි.ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා කියා සිටියේ මීට පෙර මෙම ස්ථානයේ නල ලිදක් ස්ථාපිත කළ බවයි.ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා,ගරු උපසභාපති ගාමිණී සුසන්ත මහතා අදහස් දැක්වූ අතර ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා කියා සිටියේ අසල්වැසි නිවසේ ළිඳ අයිතිකරු ජලය ලබා දීමට කැමති බැවින් එම ලිදට බටයක් යොදා නල ලිදක් ලෙස සකස් කළ හැකි බවයි.ඒ අනුව එම ලිදෙන් ජලය ලබා ගැනීමට කටයුතු කිරීම සුදුසු බවට තීරණය විය

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

11. නාගොඩ ප්‍රාදේශීය සභාවේ SC-3570 අංක දරණ හාඩ්මෙක් රථය වීථි ලාම්පු අලුත්වැඩියාව සඳහා යොදා ගැනීමට හාඩ්මෙක් රථය අලුත්වැඩියා කළයුතුව ඇති බැවින් එය අලුත්වැඩියා කිරීමට යෝජනා කරමි.

යෝජනාව ඉදිරිපත් කරමින් ගරු සභාපතිතුමා කියා සිටියේ ගමනාගමන මණ්ඩලයේ ඉංජිනේරු මහතාගෙන් වාර්තාවක් ලබා ගෙන මෙම රථය අළුත්වැඩියා කල යුතු බවයි. පසුගිය දිනවලද මෙම රථය මුදල් වැය කොට අත්වැඩියා කල බවද කියා සිටියේය. මේ සම්බන්ධව ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා , ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත, ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා අදහස් දක්වන ලදී. ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා නැවතත් කියා සිටියේ එහි වගකීම භාරගෙන අළුත්වැඩියාව සිදු කර දිය හැකි බවයි.

ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින් කියා සිටියේ මීට පෙරත් මෙම රථය අළුත්වැඩියා කිරීම සඳහා හා කිහිප ස්ථානයකට ගෙන ගියද , ඔවුනට අළුත්වැඩියා කර ගත නොහැකි වූ අතර අවසානයේ මෙම රථය නිපදවා ඇති අයම අළුත්වැඩියා කර දුන් බව හා ඔවුන්ගේ තාක්ෂණය සහ අමතර කොටස් පමණක් මෙම රථයට ගැලපුනු බවයි. මිළ අධික වුවත් එම තාක්ෂණය මිස වෙන ආයතන නොගැලපෙන බව ප්‍රකාශ කලේය.

පළාත් පාලන ඉංජිනේරු විසින් එම ආයතනයට ලබා නොදෙන ලෙස දන්වා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කල අතර ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා කියා සිටියේ පළාත් පාලන ඉංජිනේරුවරයාගෙන් මෙම රථය අළුත්වැඩියාව සඳහා කුමන ආයතනයකට ලබා දිය යුතුද යන්න විමසන ලෙසයි.

12. 2018.12.31 දිනට සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පිළිගැනීමටත් සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බවටත් යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

13. 2018.12.31 දිනට සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මගින් ලබා දී ඇති තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අපහරණ හා වෙන්දේසි කමිටුවට පහත නම් සඳහන් සාමාජිකයන් පත් කිරීම සුදුසු බව යෝජනා කරමි.

**අපහරණ හා වෙන්දේසි කමිටුව**

| | | |
|---|---|---|
| **01** | ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා | |
| **02** | ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා | |
| **03** | ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා | |
| **04** | ඩබ්.ජේ.අයේශ් ශානක මයා | - ආදායම් පරීක්ෂක |
| **05** | දිලිනි දිසානායක මිය | - තාක්ෂණ නිළධාරී |
| **06** | කේ.ජී.එදිරිසිංහ මයා | - තාක්ෂණ නිළධාරී |
| **07** | කේ.ජී.ජයනි මිය | - ප්‍රජා සංවර්ධන නිළධාරී |
| **08** | පී.ජී.ප්‍රිමාලි ශ්‍රීනිකා මිය | - රා.කළමනාකරණ සහකාර |
| **09** | කේ.ජී.මානෙල් සුදර්ශනී මිය | - සංවර්ධන නිළධාරී |

**10** අයි.චතුරි චින්තිකා මිය - සංවර්ධන නිළධාරී
**11** චන්දිමා සෙනෙවිරත්න මිය - රා.කළමනාකරණ සහකාර

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

14. ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය හා රැස්වීම් ශාලාව සඳහා තිරරෙදි යෙදීමට සහ කාර්යාලයේ මේස රෙදි සඳහා වැය දැරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

15. උඩුගම උප කාර්යාල ගොඩනැගිල්ල වහල හා ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සඳහා යෝජනා කරමි. (දළ ඇස්තමේන්තුව රු.1000000.00)

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

16. **PF-7360** දරණ කැබ් රථය සේවා කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එන්.ඩබ්.පතිනායක මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

17. **RA-8570** අංක දරණ ට්‍රැක්ටරයේ රියදුරු අසුන අලුත්වැඩියාව සහ වහල සෑදීම සඳහා යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එන්. වී. සමන් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

18. ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී විලේගේ අමර ධනංජය මහතාගේ ඉල්ලීමට අනුව උඩුගම නගර ශාලාව නොමිලේ ලබා දීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

19. LL7650 කෘ කැබ් රථයේ දැනට පවතින අඩුපාඩු හා අලුත්වැඩියා කිරීම් සිදු කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

20.252-6478 කැබ්රථය සේවා කිරීම හා අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

21. නාගොඩ මහජන පුස්තකාලයට අවශ්‍ය පොත් රාක්ක ලබාදීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

22. මුදල් ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම

## 2019.01.24 මුදල් කමිටුව -ඉදිරි ගෙවීම් වාර්තාව.

**ඉදිරි ගෙවීම් (පොදු අරමුදල්)**

**01.2019 ජනවාරි මස විදුලි බිල්පත්**

| | | | |
|---|---|---|---|
| I. | 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු. 5327.40 |
| II. | 8617046104 | - උඩුගම බහු කාර්ය මධ්‍යස්ථානය | - රු. 441.30 |
| III. | 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු. 1777.20 |

**2018 ඔක්තෝම්බර් මස විදුලි බිල්පත්**

| | | | |
|---|---|---|---|
| I. | 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු. 1411.20 |

**ගෝණදෙනිය පෙර පාසලේ හිඟ විදුලි බිල්පත් පියවීම (4599064300)**

| | | |
|---|---|---|
| 2018 මැයි | -294.90 | |
| 2018 අගෝස්තු | -240.00 | |
| 2018 නොවැම්බර් | -258.30 | |
| 2018 දෙසැම්බර් | -240.00 | - රු. 1033.20 |

**02. ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී.**
**2018 දෙසැම්බර් මස දුරකථන බිල්පත් ගෙවීම්**

| | | |
|---|---|---|
| 0912296537 | - ප්‍රධාන කාර්යාලය | - රු.3092.34 |
| 0912296433 | - ප්‍රධාන කාර්යාලය | - රු.8106.70 |
| 0912296537 | - මාපලගම උප කාර්යාලය | - රු. 475.09 |

**03. මොබිටෙල් පුද්ගලික සමාගම**

පුරනැගුම ව්‍යාපෘතියේ කෙටි පණිවිඩ සේවාව සඳහා බිල්පත (2018.10.25) - රු. 69.35

**04.ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව**

I. 2019 වර්ෂය සඳහා සුළු අක්මුදල් අත්තිකාරම් ලබා ගැනීම - රු. 3000.00

**05.අතිකාල දීමනා ගෙවීම**

**2018 දෙසැම්බර් මස**

| | | |
|---|---|---|
| ඩබ්.ඒ.සී. මධුෂානි මිය | - කාර්යාල කාර්ය සහායක | - රු. 716.00 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 6198.75 |

**06.2018 දෙසැම්බර් මස පරිවර්ජිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)**

| | | |
|---|---|---|
| ආර්.ඒ.ඒ.එල්.රත්නායක මිය | - සංවර්ධන නිලධාරී | - රු. 3000.00 |

**07. එම්. එච්. ෆර්සියා ෆර්වීන් මිය, ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව**

සති අන්ත නිවාඩු දිනයන්හි සේවයේ යෙදීම හේතුවෙන් වැටුප් ගෙවීම - රු. 3595.50
(2018.12.29/ 2018.12.30)

**08. එච්. ඩබ්. ප්‍රියන්ත මයා, ම.සෞ.ප**

I. ආහාර පනතේ නඩු සඳහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම වෙනුවෙන් ගෙවීම
II. (2018/12/14) - රු. 504.00
III. ආහාර පනතේ නඩු සඳහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම වෙනුවෙන් ගෙවීම
IV. (2018/12/07) - රු. 504.00

**09. යූ.කේ.ජයන්ත මයා, ම.සෞ.ප**

I. ආහාර පනතේ නඩු සඳහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම වෙනුවෙන් ගෙවීම
II. (2019/01/11) - රු. 500.00

**10.ආර්. ඒ.රංජිත් මානෙල් මයා, හොටෙල් සීගිරි,නාගොඩ**

I. 2019.01.08 දින පැවති මහ සභා රැස්වීම සඳහා සංග්‍රහ කිරීමේ වියදම්
(කට්ලට්, සැන්විච්, කෙසෙල්) - රු.1850.00

**11. ලියනගේ ට්‍රේඩ් සෙන්ටර්, ගා/ නාගොඩ**

i. 2019 ජනවාරි මස 08 පැවති මහ සභා රැස්වීමට අදාල සංගීහ වියදම් බිල්පත (තේ සඳහා) - රු. 2298.00

**12. ලක්දිව් එන්ටර්ප්‍රයිසස්, කොට්ටවගම**

i. වීථි පහන් අලුත්වැඩියාව සඳහා අවශ්‍ය 1.044 වයර් රෝල් 05 ක් ලබා ගැනීමේ බිල්පත
ii. පියවීම - රු. 9500.00
iii. වීථි පහන් අලුත්වැඩියාව සඳහා අවශ්‍ය තම්බලර් ස්විච් 50 ක් ලබා ගැනීමේ බිල්පත පියවීම -රු. 7250.00

**13. බී.එල්. සුරංග දිනේෂ් මයා, පනංගල**

2019 වර්ෂය සඳහා උඩුගම සඳුදා සතිපොළ වෙනුවෙන් ගෙවන ලද ටෙන්ඩර් තැන්පතු මුදල ආපසු
ගෙවීම - රු. 5000.00

**14. ඒ.ඩී. කරුණාරත්න මයා, සරත් ස්ටෝර්ස්, යටලමත්ත**

2018 දෙසැම්බර් මාසය සඳහා නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම
වෙනුවෙන් ගෙවීම - රු. 6380.00

**15. අයි ඇන්ඩ් ආර්. ටෙලිකොමියුනිකේෂන් සොලියුෂන්, තලවතුගොඩ**

රැස්වීම් ශාලාවේ ශබ්ද විකාශන පද්ධතියේ අලුත්වැඩියා කිරීමේ බිල්පත පියවීම - රු.24000.00

**16. යුනයිටඩ් මෝටර්ස්. පී.එල්.සී., මාතර**

PF 7360 අංක දරණ කැබ් රථයේ අළුත්වැඩියාව සඳහා බිල්පත් පියවීම - රු.160945.76

**17. එල්.එස්.ආර්. විජේතිලක මයා**

ප්‍රාදේශීය සභා නාගොඩ කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බදු පදනම
මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා ජනවාරි මස මාසික කුලීය ගෙවීම - රු..4000.00

රජයේ ආධාර

**18. උඩුගම බටහිර ග්‍රාම සංවර්ධන සමිතිය**

**(උපමාන පාදක ප්‍රදාන - 2018)**

උඩුගම දකුණ ළමා ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම කර්මාන්තයේ පළමු හා අවසාන ගෙවීම - රු. 459545.82

**19. තල්ගස්වල සතිපොළ සංවර්ධනය**

**(උපමාන පාදක ප්‍රදාන - 2018)**

තල්ගස්වල සතිපොළ සංවර්ධනය කිරීමේ කර්මාන්තය පළමු හා අවසාන ගෙවීම - රු. 726880.39

**මුදල් කමිටු වාර්තාව සභාවට ඉදිරිපත් කල අතර එය සළකා බැලීම සිදු විය.**

## 2019.02.12 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යතු ඉදිරි ගෙවීම් වාර්තාව.

**ඉදිරි ගෙවීම් (පොදු අරමුදල්)**

**01.2019 ජනවාරි මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 8616373802 | - උඩුගම පොළ | - රු. 240.00 |
| 8616374000 | - උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් | - රු. 240.00 |
| 2810125104 | - දීප්ති පෙර පාසල | - රු. 276.60 |
| 4501090200 | -මාපලගම වෙළඳ සං.කොරිඩෝව | - රු. 3277.80 |
| 2810236100 | -මාපලගම ක්‍රීඩාංගනය | - රු. 294.90 |
| 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු. 642.00 |
| 4509082800 | -උදාර පෙර පාසල | - රු. 404.70 |
| 4507357802 | -සමනළ පෙර පාසල | - රු.313.20 |

**02. ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී.**

**2019 ජනවාරි මස දුරකථන බිල්පත් ගෙවීම**

| | |
|---|---|
| 0912296537- ප්‍රධාන කාර්යාලය | -රු.3092.34 |
| 0912296433- ප්‍රධාන කාර්යාලය | -රු.8360.74 |
| 0912296577-මාපලගම උප කාර්යාලය | -රු. 489.45 |

**03. සී/ස ලංකාබෙල් සමාගම**

0915701722 උප සභාපතිතුමාගේ නිවස (2018.11.16- 2018.12.15) - රු. 688.50

**04.ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව**

I. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2019 ජනවාරි මස ඉන්ධන දීමනා ලබා පියවීම දීමේ බිල්පත - රු.81000.00

II. ආදායම් පරීක්ෂක නිල ඇඳුමට අදාලව සපත්තු හා මේස් මිලදී ගැනීමේ බිල්පත පියවීම. -රු.3450.00

2019.01.29 දින ප්‍රධාන කාර්යාලයේ පැවති පරිසර හා තාක්ෂණික සමාලෝචන කමිටුවට සහභාගී වූ නිළධාරීන් සඳහා ගෙවීම් සිදු කිරීම. -රු.3000.00

III. සභාපතිතුමාගේ රාජකාරි කටයුතු සඳහා කැබ් රථය අධිවේගී මාර්ගයේ ධාවනය කිරීම වෙනුවෙන් බිල්පත් මුදල් ප්‍රතිපූර්ණය 2018.11.16 කොළඹ පළාත් පාලන අමාත්‍යාංශයට යාම වෙනුවෙන් - රු. 850.00

2018.12.20 රජයේ මුද්‍රණාලයට කොළඹ යාම වෙනුවෙන් - රු. 400.00

2019.01.09 ඉඩම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවට යාම වෙනුවෙන් -රු. 750.00

2019.01.28 ඉඩම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවට යාම වෙනුවෙන් - රු. 750.00
2019.01.30 ඉඩම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවට යාම වෙනුවෙන් -රු. 700.00
2019.02.07 ඉඩම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවට යාම වෙනුවෙන් -රු. 800.00

**05.අතිකාල දීමනා ගෙවීම**

**2018 දෙසැම්බර් මස**

| | | |
|---|---|---|
| යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු. 8335.25 |
| ඩබ්.ඒ.සී.මදූෂානි මිය | -කාර්යාල කාර්ය සහායක | -රු. 716.00 |

**2019 ජනවාරි මස**

| | | |
|---|---|---|
| යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු. 9788.00 |
| බී.ජී. පියතිලක මයා | - රියදුරු | - රු. 8031.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 8031.00 |
| එන්.එම්.රජිත මයා | -අනියම් මුරකරු | - රු.3232.00 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු.5660.49 |
| එස්.කේ.මල්ලවආරච්චි මයා | - කළමනාකරණ සහකාර | - රු. 686.32 |
| එච්.එම්.හේවාවිතාන මෙය | - කළමනාකරණ සහකාර | - රු. 909.76 |
| ජී.පී.පී.ශ්‍රීනිකා මෙය | - කළමනාකරණ සහකාර | - රු. 900.80 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 5016.00 |

**06.2019 ජනවාරි මස පරිවර්ථිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 4000.00 |
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 4000.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 3000.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 3000.00 |
| ආර්.ඒ.ඒ.එල් රත්නායක මිය | -සංවර්ධන නිලධාරී | - රු. 3000.00 |

**07.ගමන් වියදම් ගෙවීම**

**2018 දෙසැම්බර් මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම**

| | | |
|---|---|---|
| යූ.වී.මධුර ප්‍රභාත් මයා | - කළමනාකරණ සහකාර | -රු. 476.00 |
| එස්.කේ.මල්ලවආරච්චි මයා | - කළමනාකරණ සහකාර | - රු. 440.00 |

**2019 ජනවාරි මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම**

| | | |
|---|---|---|
| බී.ජී. පියතිලක මයා | - රියදුරු | - රු. 1400.00 |
| යූ.වී.මධුර ප්‍රභාත් මයා | - කළමනාකරණ සහකාර | -රු. 815.00 |
| එස්.කේ.මල්ලවආරච්චි මයා | - කළමනාකරණ සහකාර | - රු.1390.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 5760.00 |
| එච්.එම්.හේවාවිතාන මෙය | - කළමනාකරණ සහකාර | - රු. 460.00 |
| එම්.එච්.ෆර්සියා ෆර්වින් මිය | -ලේකම් | - රු. 530.00 |

**පුහුණු වැඩසටහන් සඳහා**

| | | |
|---|---|---|
| කේ.ඒ. එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 866.00 |
| එච්.එම්.හේවාවිතාන මෙය | - කළමනාකරණ සහකාර | - රු.2385.00 |

**2019 පෙබරවාරි මස ගමන් වියදම් (2019.02.01 – 2019.02.11 දක්වා)**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම**

| | | |
|---|---|---|
| ආර්.ඒ.ඒ.එල් රත්නායක මිය | -සංවර්ධන නිලධාරී | - රු. 460.00 |
| එස්.කේ.මල්ලවආරච්චි මයා | - කළමනාකරණ සහකාර | - රු. 840.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 450.00 |
| එම්.එච්.ෆර්සියා ෆර්වින් මිය | -ලේකම් | - රු.1165.00 |

**08. දිලිනි දිසානායක මිය, තාක්ෂණ සේවා නිලධාරී, නාගොඩ ප්‍රාදේශීය සභාව**

සති අන්ත නිවාඩු දිනයන්හි කර්මාන්ත වැඩ බිම් පරික්ෂාවෙහි යෙදීම හේතුවෙන් වැටුප් ගෙවීම (2018.12.09/12.22) - රු. 2564.30

**09. එච්.ඩබ්.පී.අමරනාත් මයා, ම.සෞ.ප**

I. ආහාර පනතේ නඩු සඳහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම වෙනුවෙන් ගෙවීම (2019/01/11) - රු. 504.00

II. ආහාර සාම්පල් පරික්ෂාවට කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනයට යාම වෙනුවෙන් (2019.01.31) - රු. 800.00

III. මාමණදොළ ඇළෙන් ජල සාම්පල් රැගෙන බත්තරමුල්ල රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට යාම (2019/01/09) -රු. 800.00

**10.සී/ස යක්කලමුල්ල විවිධ සේවා සමූපකාර සමිතිය**

**2018 දෙසැම්බර් මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 521ක් | - රු. 54381.00 |
| LL 7103 ටිපර් රථය ඩීසල් ලීටර් 210 ක් | - රු. 22010.00 |
| 252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 250 ක් | - රු. 25975.00 |
| LL 7366 ට්‍රක් බවුසරය ඩීසල් ලීටර් 50 ක් | - රු. 5050.00 |
| RD 9457 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 75 ක් | - රු. 77900.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 139 ක් | - රු. 14734.00 |
| ඩෙංගු ධූමායන කටයුතු සඳහා පෙට්‍රල් ලීටර්40 | - රු. 4140.00 |
| ගබඩාවට ලීටර 8 (තණකොළ කපන මැෂින් සඳහා) | - රු . 1040.00 |

**11.තෙල් පිරවුම්හල, ගා/නාගොඩ, කේ.ජී. ධනසිරි මයා**

**2019 ජනවාරි මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 187ක් | - රු. 18513.00 |
| LL 7103 ටිපර් රථය ඩීසල් ලීටර් 140 ක් | - රු. 13860.00 |
| 252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 248 ක් | - රු. 24552.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 60 ක් | - රු. 5940.00 |

**12.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2019 ජනවාරි මස දුරකථන පෙර
ii. ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු.28500.00
iii. 2019 ජනවාරි මස සභා වාර්තා පිටපත් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම - රු. 1950.00

**13. බංගම සමරවික්‍රම ආරච්චිගේ සුමනසිරි, උඩුගම**

ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගය පළුදු කර ජල නළ එළීම සඳහා තැන්පත් කල මුදල නැවත ගෙවීම - රු. 2000.00

**14.සී/ස අතුකෝරල ඉලෙක්ට්‍රිකල්ස් පුද්. සමාගම, පිටිගල**
විථි පහන් සඳහා CFL බල්බ් මිලදී ගැනීමේ බිල්පත (2019.01.25 බි.අංක 21440) - රු.44000.00
**15. සී/ස අතුකෝරල ඉලෙක්ට්‍රිකල්ස් පුද්. සමාගම, පිටිගල**
විථි පහන් සඳහා CFL බල්බ් මිලදී ගැනීමේ බිල්පත (2019.02.11 බි.අංක 21483) - රු.44000.00

**16.එම්.ඒ. ආරියවංශ, නාගොඩ**
252-6478 දරණ කැබ් රථයේ ඉදිරිපස බ්රේක් හෝස් අලුතින් යෙදීමේ හා බ්‍රේක් සෑදීමේ බිල්පත පියවීම- රු. 800.00

**17.එස්.ජී.ජයලාල්ද සිල්වා, වක්වැල්ල පාර,ගාල්ල**
ආදායම් පරීක්ෂක නිල ඇඳුම් කට්ටල 03 ක් ඊට අදාල බැජ් සහිතව මසා නිම කිරීමට අදාල ගාස්තු ගෙවීම.-රු.26820.00

**18.ඒ.ජේ.ජී.ස්ටේෂනර්ස්, ගාල්ල**
2019 වර්ෂය සඳහා ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීමේ බිල්පත පියවීම. -රු.74612.50

**19.රේණුල ස්ටේෂනර්ස්, ගාල්ල**
2019 වර්ෂය සඳහා ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීමේ බිල්පත පියවීම. -රු.3577.50

**20. එල්.එස්.ආර්. විජේතිලක මයා**
ප්‍රාදේශීය සභා නාගොඩ කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා පෙබරවාරි මස මාසික කුලීය ගෙවීම -රු.4000.00

**21.ඒ.ඩී කරුණාරත්න මයා, සරත් ස්ටොර්ස්, යටලමත්ත**
නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම 2019 ජනවාරි -රු.5970.00

**22.එම්.ඒ.සිරිපාල,සේසිරි ස්ටෝර්ස්,මාපලගම**
මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම 2019 ජනවාරි -රු.2780.00
**23.එච්.එල්.කේ. ශ්‍රීනිත් රුක්ෂාන්, උඩුගම**
උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම 2019 ජනවාරි -රු.5210.00

**24. විදුහල්පති, උඩුගම ප්‍රාථමික විද්‍යාලය**
2018.11.27 දින ත්‍යාග ප්‍රධානෝත්සවය සඳහා බහුකාර්ය ගොඩනැගිල්ල වෙන් කිරීම වෙනුවෙන් ලබා දුන් තැන්පතු මුදල් ආපසු ගෙවීම -රු.5000.00

**25. ලක්දිව් එන්ටර්ප්‍රයිසස්, කොට්ටවගම**
විථි පහන් අළුත්වැඩියාව සඳහා වූ පින් හෝල්ඩර්ස් මිළදී ගැනීමේ බිල්පත -රු.5625.00

**26.ඔරියන්ට් ඉලෙක්ට්‍රිකල්ස්, මාලිගාවත්ත, කොළඹ 10**
විථි පහන් අළුත්වැඩියාව සඳහා බණ්ඩල් ක්ලිප් මිළදී ගැනීමේ බිල්පත -රු.14800.00

**27.බන්දුල ග්ලාස් සෙන්ටර් ඇන්ඩ් ෆැබ්රිකේටින්,මාපලගම,නාගොඩ**
ප්‍රධාන කාර්යාලය,මාපලගම ආයුර්වේදය,පුස්තකාලය සඳහා අවශ්‍ය ග්ලාස් පැඩ් මිලදී ගැනීමේ බිල්පත පියවීම. -රු.9295.00

**28.පී.එල්.රන්ජන්,ඇල්බට් චිත්‍ර ශිල්පියෝ ,ගාල්ල.**
නගොඩ මහජන පුස්තකාලයේ පුස්තකාලයාධිපතිනිල මුද්‍රාව සකස් කිරීමේ බිල්පත පියවීම. -රු.450.00

පොදු අරමුදල් කර්මාන්ත

**29.පී.ජී.සමන්ත ,ඉහළනාරංගොඩවත්ත,නාගොඩ**

I. J.C.B. යන්ත්‍රය යොදා කන්ද උඩවත්ත මාර්ගයේ කාණු කැපීම වෙනුවෙන් ගෙවීම් සිදු කිරීම. (පැය 05) රු.12500.00

**II. නීල් ද අල්විස් මාවත දෙපස පිළිසකර කිරිම සඳහා**

J.C.B. යන්ත්‍රය යොදා ගැනීම වෙනුවෙන් ගෙවීම් සිදු කිරීම. (පැය 08) -රු.20000.00

**III. ලෙහුවල බෝධිය අසල මාර්ගය සිලින්ඩර් දමා සැකසීමට**

**IV.** J.C.B. යන්ත්‍රය යොදා ගැනීම වෙනුවෙන් ගෙවීම් සිදු කිරීම. (පැය 03) -රු. 7500.00

රජයේ ආධාර කර්මාන්ත

**30. මාමනදොල ප්‍රජා මූල සංවිධානය, මාමනදොළ**

නාගොඩ යටලමත්ත මාමනදොල වතු මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ පළමු හා අවසාන ගෙවීම - රු.893856.88

**රජයේ ආධාර (මන්ත්‍රී ප්‍රතිපාදන)**

**31.පළාත් පාලන කොමසාරිස්, දකුණු පළාත**

**අදාල විෂයය ඉටු කිරීමෙන් පසු ඉතිරි මුදල් නැවත ප්‍රධාන ලේකම් වෙත බැර කිරීම**

i. දකුණු පළාත් සභා ගරු මන්ත්‍රී සුමනසිරි ලියනගේ මැතිතුමාගේ ප්‍රතිපාදන
   - වීථි පහන් නඩත්තුව සඳහා ලැබී ඇති ප්‍රතිපාදනවලින් - රු. 280.00
   - ගංවතුර හා නාය යෑම් වලින් හානියට පත් වූ මාර්ග අළුත්වැඩියාව සඳහා ලැබී ඇති ප්‍රතිපාදන - රු. 550.00

ii. දකුණු පළාත් සභා ගරු මන්ත්‍රී ඉසුරු දොඩංගොඩ මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පුස්තකාලවලට අවශ්‍යා පොත් ලබා දීම සඳහා ලැබී ඇති මුදල් - රු. 108.00

iii. දකුණු පළාත් සභා ගරු මන්ත්‍රී ඉසුරු දොඩංගොඩ මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේ වීථි පහන් නඩත්තු කිරීම CFL බල්බ් සඳහා ලැබී ඇති මුදල් - රු.200.00

iv. දකුණු පළාත් සභා ගරු මන්ත්‍රී සිසිර කුමාරරත්න මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පුස්තකාලවලට අවශ්‍යා පොත් ලබා දීම සඳහා ලැබී ඇති මුදල් - රු. 35.50

v. දකුණු පළාත් සභා ගරු මන්ත්‍රී පද්මසිරිද සිල්වා මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේ වීථි පහන් නඩත්තු කිරීම CFL බල්බ් සඳහා ලැබී ඇති මුදල් - රු. 280.00

vi. දකුණු පළාත් සභා ගරු මන්ත්‍රී නලීන් හේවගේ මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේ වීථි පහන් නඩත්තු කිරීම CFL බල්බ් සඳහා ලැබී ඇති මුදල් - රු. 80.00

vii. නාගොඩ යටලමත්ත මාමනදොල වතු මාර්ගය සංවර්ධනය කිරීම. වැඩිපුර ලැබී ඇති මුදල් නැවත යොමු කිරීම. -රු.6825.69

- ඉදිරි ගෙවීම් වාර්තාවේ අඩුපාඩු කිහිපයක් ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා සහ ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් පෙන්වා දෙමින් අදහස් දැක්වූ අතර ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා සහ ගරු මන්ත්‍රී සුභාෂී මධුමාලි මෙනවිය, ගරු මන්ත්‍රී අරුණ ශාන්ති මහත්මිය යන මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන්ද ඉදිරි ගෙවීම් වාර්තාවේ ඇතැම් ගෙවීම් පිළිබඳ අදහස් දැක්වූහ.

**ඉහත පෙන්වා දෙන අඩුපාඩු සකස් කර ඉදිරිපත් කරන ලෙස දන්වමින් සභාව වෙත ඉදිරිපත්වී ඇති අංක 01 සිට 31 දක්වා ඇති ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපති තුමන් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී එන්. වී. සමන් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

- **(ඉ).2 කර්මාන්ත යෝජනා**

**2.1. ගරු සභාපතිතුමන් හා මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා**

**2.2.ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

01.යටලමත්ත වෙළඳ සංගමයට පානීය ජල ව්‍යාපෘතියක් ලබා දීම

02.මාපලගම කොළඹ කඩේ ලඟ සිට තල්ගස්වල දක්වා ඇති වීථි ලාම්පු ප්‍රතිසංස්කරණය කිරීම

03.කුඹුරුහේන පෙර පාසල ප්‍රාදේශීය සභා පෙර පාසලක් හැටියට ලියාපදිංචි කිරීම

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා ගේ යෝජනා ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**2.3.ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ඉදිරිපත් කරන යෝජනා**

01.මාර්ග සංවර්ධනය සඳහා වෙන් කර ඇති මුදලින් ඉතිරි රු. 40000.00 න්ගම්මැද්දේගොඩ බොකටියවෙල මාර්ගය සංවර්ධනය කිරීම

- තාක්ෂණ නිලධාරී වාර්තාවක් ලබා ගෙන ඒ අනුව කටයතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.

**ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මහත්මියගේ යෝජනාව ගරු මන්ත්‍රි ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**2.4.ගරු මන්ත්‍රී එම්.එම්. දිසානායක මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

01.ඌරල පහළ ආරලිය මාර්ගය සංවර්ධනය කිරීම සඳහා බෝසර්පැය 05 ක් ලබා ගැනීම.

**ගරු මන්ත්‍රී එම්. එම්. දිසානායක මහතා ගේ යෝජනාව ගරු මන්ත්‍රි වී.වී. සහබන්දු මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**2.5.ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් එඩේර ආරච්චි මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

01.උඩුගම උප මහජන ක්‍රීඩාංගනයේ ජලය බැස යාම සඳහා JCB යන්ත්‍රක් යොදා කානු කපා අඩුපාඩු සකස් කිරීම.

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා ගේ යෝජනාව ගරු මන්ත්‍රි එන්.වී. සමන් මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

i. කැප්පිටියගොඩ ග්‍රාම නිලධාරී වසමේ උණවටුනගෙදර වත්ත මාර්ගයට අවශ්‍ය හියුම් පයිප්ප ලබා දීම **පූජ්‍ය බද්දේගම සමිත හිමියන්ගේ ප්‍රතිපාදන** - රු.25000.00
ii. නාගොඩ වළකුඹුර අත්කම් නිවාස 11 අදියර සඳහා ප්‍රවේශ මාර්ගය සඳහා සිළිංඩර ලබා දීම **යූ.ජී.ඩී. ආරියතිලක මැතිතුමාගේ ප්‍රතිපාදන** - රු. 35100.00
iii. 70 කන්ද මාර්ගය සංවර්ධනය කිරීම - රු. 10000.00
iv. යටලමත්ත විනිමුල්ල කන්ද මාර්ගය සංවර්ධනය කිරීම **ඉසුරු දොඩංගොඩ මැතිතුමාගේ මන්ත්‍රී ප්‍රතිපාදන** - රු. 20000.00
v. කුඹුරුහේන නාවින්න මාර්ගය සංවර්ධනය කිරීම **ඉසුරු දොඩංගොඩ මැතිතුමාගේ මන්ත්‍රී ප්‍රතිපාදන** - රු. 20000.00
vi. ඌරල පහළ කන්ද උඩවත්ත මාර්ගය සංවර්ධනය කිරීම **ඉසුරු දොඩංගොඩ මැතිතුමාගේ මන්ත්‍රී ප්‍රතිපාදන** - රු. 20000.00

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් කුමාර එඩේරආරච්චි මහතාගේ ඉල්ලීම පරිදි පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමාගේ ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා නව මිළ ගණන් යටතේ සකස් කර ඇති ඇස්තමේන්තු

i. උඩුගම අලුත්වත්ත, පැණිගලයාය මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම.රු.2000000.00
ii. උඩුගම අලුත්වත්ත, 18 කන්ද මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම. - රු.2000000.00
iii. උඩුගම දකුණ සුදුවැලිපොතකැකිල්ලකන්ද මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම. -රු.2000000.00

**ඉහත ඇස්තමේන්තු පිළිගැනීම සුදුසු බවට ගරු උප සභාපතිතුමා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

## (ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම

### *01. Hard ware උපකරන සඳහා ලැබී ඇති මිළ ගණන්*

| විස්තරය | හොද හිත හාඩ්වෙයාර්, තල්ගස්වල | සමන්ත හාඩ්වෙයාර්, මාපලගම | චාමින් හාඩ්වෙයාර්, තල්ගස්වල |
|---|---|---|---|
| ➢ ඇස්බැස්ටෝ ශීට් (රයිනෝ) අඩි 6 | 1425.00 | 1390.00 | 1375.00 |
| • අඩි 8 | 1850.00 | 1810.00 | 1795.00 |
| • අඩි 10 | 2200.00 | 2150.00 | 2140.00 |
| • අඩි 12 | 2325.00 | 2570.00 | 2560.00 |
| ➢ සිවිලිම් ශීට් (රයිනෝ) 4x4 | 540.00 | 515.00 | 510.00 |
| ➢ ජොයින්ට් | | | 165.00 |
| ➢ ජීලි කොකු | | | 35.00 |

| | | | |
|---|---|---|---|
| ➢ වැහි පීලි PVC | 880.00 | 850.00 | 840.00 |
| ➢ | | | 360.00 |
| ➢ ඩවුන් පයිප්ප එල්බෝ | | | 180.00 |
| ➢ රතු ගඩොල් ලොකු | 27.50 | 27.50 | 26.50 |
| ➢ රතු ගඩොල් පොඩි | 21.00 | 19.50 | 18.75 |
| ➢ ෂීට් ඇණ | 15.00 | 14.00 | 13.50 |
| ➢ ෂීට් කොකු | 25.00 | 25.00 | 24.50 |
| ➢ ඩවුන් පයිප්ප | 495.00 | 475.00 | 465.00 |
| ➢ 110 mm T 600 PVC Pipe | 8150.00 | 7600.00 | 7350.00 |

**හාඩ්වෙයාර් උපකරණ සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අඩුම මිළ ගණන් ඉදිරිපත් කල තල්ගස්වල චාමීන් හාඩ්වෙයාර් වෙතින් එම උපකරණ මිළදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල තල්ගස්වල චාමීන් හාඩ්වෙයාර් වෙතින් එම උපකරණ මිළදී ගැනීමට ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා ස්ථීර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

***02. ලේඛනාගාරය සහ පුස්තකාල සඳහා අවශ්‍ය භාණ්ඩ සඳහා ලැබී ඇති මිළ ගණන්***

| විස්තරය | දම්රෝ ඉන්ඩස්ට්‍රීස්, උඩුගම | හසාරෝ එන්ටර්ප්‍රයිසස්, ගාල්ල | සිංහගිරි ෆර්නිචර්, උඩුගම |
|---|---|---|---|
| • පුස්තකාල කබඩ් | රු. 22657.50 | රු. 12990.00 | රු. 12700.00 |
| • කාර්යාල කබඩ් | රු. - | රු. 12790.00 | රු. 12300.00 |
| • ලියන මේස | රු. 9247.50 | රු. 5690.00 | රු. 5250.00 |
| • පොත් රාක්ක | රු. 12577.50 | රු. 10990.00 | රු. 10500.00 |

**ඒ අනුව අඩුම මිළ ඉදිරිපත් කල උඩුගම සිංහගිරි ෆර්නිචර් වෙතින් එම උපකරණ මිළදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල උඩුගම සිංහගිරි ෆර්නිචර් වෙතින් එම උපකරණ මිළදී ගැනීමට ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා විසින් යොජනා කළ අතර ගරු මන්ත්‍රී එන්.වී.සමන් මහතා ස්ථීර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

## *03. අයදුම්පත් මුද්‍රණය සඳහා ලැබී ඇති මිළ ගණන්*

| විස්තරය | චන්දිම ප්‍රින්ටර්ස්, අල්පිටිය | කෙත්සිරි කමියුනිකේෂන්, තල්ගස්වල | අතුකෝරල ප්‍රින්ටර්ස්, පිටිගල |
|---|---|---|---|
| • *සාමාජික*, වැඩිහිටි අයදුම්පතක් මුද්‍රණයට වැය වන මුදල | 7.30 | 6.90 | 7.50 |
| • සාමාජිකත්වය අලුත් කිරීමේ අයදුම්පතක් මුද්‍රණයට වැය වන මුදල | 4.90 | 4.00 | 5.00 |
| • ප්‍රමාද ලිපි එකක් මුද්‍රණයට වැය වන මුදල | 3.20 | 2.75 | 3.25 |
| • ඇපකරු ලිපි එකක් මුද්‍රණයට වැය වන මුදල | 3.20 | 2.75 | 3.25 |
| • නිතිමය ලිපි එකක් මුද්‍රණයට වැය වන මුදල | 3.20 | 2.75 | 3.25 |
| • පෙර පාසල් අයදුම්පතක් මුද්‍රණයට වැය වන මුදල | 3.20 | 2.75 | 3.25 |

**ඒ අනුව අඩුම මිළ ඉදිරිපත් කල කෙත්සිරි කමියුනිකේෂන්, තල්ගස්වල වෙතින් මුද්‍රණ කටයුතු සිදු කිරීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල කෙත්සිරි කමියුනිකේෂන්, තල්ගස්වල වෙතින් මුද්‍රණ කටයුතු සිදු කිරීමට ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් යොජනා කළ අතර ගරු මන්ත්‍රී එන්.ඩබ්.පතිනායක මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

## 04.වීථි පහන් අලුත්වැඩියාව සඳහා අවශ්‍ය උපකරණ මිළදී ගැනීමට ලැබී ඇති මිළ ගණන්

| අනු අංකය | විස්තරය | අතුකෝරල ඉලෙක්ට්‍රිකල්ස්, පිටිගල | යූ.කේ.ඉලෙක්ට්‍රිකල්ස්, කොළඹ 11 | එම්යන් ඉලෙක්ට්‍රිකල්, කොළඹ 11 |
|---|---|---|---|---|
| 01 | පී. වී. සී. 1/1.13 වයර් SLS 733 (කොයිල් 01) | 1900.00 | 1950.00 | 1950.00 |
| 02 | පී. වී. සී. 7/0.53 (1.5 $mm^2$) වයර් SLS 733 තනිපට/ දෙපට (කොයිල් 01) | 3815.00<br>7760.00 | 4080.00<br>7760.00 | 4080.00<br>7760.00 |
| 03 | පී. වී. සී. 7/0.67 (2.5 $mm^2$) වයර් SLS 733 තනිපට/ දෙපට (කොයිල් 01) | 6000.00<br>11000.00 | 6040.00<br>11320.00 | 6000.00<br>11250.00 |
| 04 | පී. වී. සී. 7/0.85 (4 $mm^2$) වයර් SLS 733 තනිපට/ දෙපට (කොයිල් 01) | | 9440.00<br>17840.00 | 9400.00<br>17700.00 |
| 05 | පී. වී. සී. 7/1.04 (6$mm^2$) වයර් SLS 733 තනිපට/ දෙපට (කොයිල් 01) | | 13680.00<br>25000.00 | 28000.00 |
| 06 | පී.වී.සී. කන්ඩියුට් 18 mm (1/2) (4m) | 65.00 | 75.00 | 60.00 |
| 07 | පී.වී.සී. කන්ඩියුට් 20 mm (3/4) (4m) | 90.00 | 95.00 | 90.00 |
| 08 | පී.වී.සී. කන්ඩියුට් 25 mm (1) (4m) | 115.00 | 105.00 | 110.00 |
| 09 | ටම්බලර් ස්විච් 10A (Tumbler switch) SLS 1000 | 130.00 | 135.00 | 199.00 |
| 10 | 16 Amp වීදි ලාම්පු වහරු (metal clad) | | | 1350.00 |
| 11 | 32 Amp වීදි ලාම්පු වහරු (metal clad) | | | 3500.00 |
| 12 | 1 .ගැන්ග් වන්වේ ස්විච් 10A (One gang one way) SLS 1000 | 150.00 | 130.00 | 125.00 |
| 13 | ස්විච් පෙට්ටි (Sunk switch box) | 45.00 | 25.00 | 35.00 |
| 14 | ඒරියල් බන්ඩල් කනෙක්ටර්ස් (T- Off Connectors) | | 195.00<br>295.00 | 130.00<br>200.00 |
| 15 | B22/E27 18 W/20W CFL බල්බ SLS 1231 අවම තරු 4 සහ වගකීම් කාල සීමාව මාස 18 | 420.00 | 450.00 | 500.00 |
| 16 | 23 W CFL බල්බ - SLS 1231 අවම තරු 04 සහ වගකීම් කාල සීමාව මාස 18 | 440.00 | 485.00 | 444.00 |
| 17 | 110 W සෝඩියම් වේපර් බල්බ් E 27 | | 395.00 | 1600.00 |
| 18 | 150 වොට් සෝඩියම් බල්බ් | | 395.00 | 1940.00 |
| 19 | 250 W සෝඩියම් වේපර් බල්බ් E 40 | | 1250.00 | 990.00 |
| 20 | 125 W MV චෝක් කොයිල් (Ballast) | | 1250.00 | 640.00 |

| | | | | |
|---|---|---|---|---|
| 21 | 150 වොට් චෝක් | | 1450.00 | 1240.00 |
| 22 | 250 W MV චෝක් කොයිල් (Ballast) | | 1450.00 | 1300.00 |
| 23 | B 22 – පෝසිලේන් සෙරමික් හෝල්ඩර් (ටු පින් / ත්‍රී පින්) | 85.00 | 95.00 | 55.00 |
| 24 | E 27 – පෝසිලේන් සෙරමික් හෝල්ඩර් | 110.00 | 195.00 | 120.00 |
| 25 | E 40 - – පෝසිලේන් සෙරමික් හෝල්ඩර් | | 295.00 | 170.00 |
| 26 | 150 වොට් ඉග්නේටර් | | 395.00 | 425.00 |
| 27 | 250 W ඉග්නේටර්- 250 සෝඩියම් වේපර් බල්බ් සඳහා) - (GERMAN MAKES) | | 595.00 | 425.00 |
| 28 | පී. වී. සී. ඉලෙක්ට්‍රිකල් ඉන්සියුලේෂන් ටේප් රෝල් (SLS ප්‍රමිතිය) | 65.00 | 55.00 | 145.00 |
| 29 | කනෙක්ටර් බාර් (10Amp – 400 V) | | 65.00 | 45.00 |
| 30 | 125 W කෝබ්‍රාහෙඩ් වර්ගයේ සම්පූර්ණ ලාම්පු සවිකුරුව - (125 W Cobra Head Type Street Light Complete Set) | | 7950.00 | |
| 31 | වීථි පහන් කට්ටල (දේශිය) පී.අයි.පයිප්ප, ආවරනය, හෝල්ඩර්, බ්‍රැකට් හා ඇණ සහිතව | | | 1400.00 |
| 32 | 5 Amp ප්ලග් බේස් | 425.00 | 360.00 | 425.00 |
| 33 | 5 Amp ප්ලග්ටොප් | 100.00 | 95.00 | 100.00 |
| 34 | 13 Amp ප්ලග් බේස් | 420.00 | 375.00 | 425.00 |
| 35 | 13 Amp ප්ලග්ටොප් | 210.00 | 185.00 | 200.00 |
| 36 | 15 Amp ප්ලග් බේස් | 540.00 | 449.00 | 600.00 |
| 37 | 15 Amp ප්ලග්ටොප් | 220.00 | 187.00 | 200.00 |
| 38 | 5 වොට් පාට බල්බ් | | | 40.00 |
| 39 | ටු පින් හෝල්ඩර් | 75.00 | 85.00 | 75.00 |

ඒ අනුව අඩුම මිළ ඉදිරිපත් කල **අතුකෝරල ඉලෙක්ට්‍රිකල්ස්, පිටිගල, යූ.කේ.ඉලෙක්ට්‍රිකල්ස්, කොළඹ 11,එම්යන් ඉලෙක්ට්‍රිකල්, කොළඹ 11** වෙතින් එම උපකරණ මිළදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල **අතුකෝරල ඉලෙක්ට්‍රිකල්ස්, පිටිගල, යූ.කේ.ඉලෙක්ට්‍රිකල්ස්, කොළඹ 11,එම්යන් ඉලෙක්ට්‍රිකල්, කොළඹ 11** වෙතින් එම උපකරණ මිළදී ගැනීමට ගරු මන්ත්‍රී අමර ධනංජය මහතා විසින් යොජනා කළ අතර ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

## 05. ලිපිද්‍රව්‍ය සඳහා ලැබී ඇති මිළ ගණන් 2019

| විස්තරය | දුලාර ස්ටේෂනර්ස්, වක්වැල්ල පාර, ගාල්ල | රෙනුල ස්ටේෂනර්ස්, ගාල්ල | ඒ. ජේ. පී. ස්ටේෂනර්ස්, කලුවැල්ල |
|---|---|---|---|
| 1. A4 සුදු පාට ෆොටෝ කොපි පැකට්01 (ඇවලොන්) ගේජ් 80 | 850.00 | 850.00 | 850.00 |
| 2. ' 4 විවිධ පාට ෆොටෝ කොපි පැකට්01 ගේජ් 80 | 520.00 | 510.00 | 510.00 |
| 3. සයිබර් කලර් | 1175.00 | 1160.00 | 1160.00 |
| 4. ' 4 පාට ෆොටෝ කොපි පැකට්01 ගේජ් 80 - ලා පාට | 1000.00 | 980.0 | 980.00 |
| 5. - තද පාට | 1160.00 | 1140.00 | 1140.00 |
| 6. පෑන් (ඇට්ලස් චුට්) | 19.00 | 18.00 | 17.50 |
| 7. සයින් පෙන් | 70.00 | 68.50 | 65.00 |
| 8. පර්මනන්ට් මාකර් පෙන් | 90.00 | 90.00 | 85.00 |
| 9. රෝනියෝ ශීට් | 452.00 | 440.00 | 435.00 |
| 10. රාජකාරි ගමන් මලු (කාන්තා-පිරිමි) | | 9510.00 | 9500.00 |
| 11. පාට ඩිමයි කොල | 10.00 | 9.50 | 9.00 |
| 12. පොලිතින් අගල් 12 පීපී | 15.00 | 13.00 | 13.50 |
| 13. වයිට්බෝඩ් පෙන් | 90.50 | 92.00 | 90.00 |
| 14. ෆයිල් කවර සාමාන්‍ය (100) | 575.00 | 505.00 | 500.00 |
| 15. CR I පොත් (ඇට්ලස් ) | 57.00 | 55.00 | 52.50 |
| 16. CR II පොත් (ඇට්ලස් | 108.00 | 105.00 | 100.00 |
| 17. CR III පොත් (ඇට්ලස් ) | 145.00 | 145.00 | 140.00 |
| 18. CR IV පොත් (ඇට්ලස් ) | 183.00 | 185.00 | 180.00 |
| 19. CR V පොත් (ඇට්ලස් ) | 208.00 | 200.00 | 205.00 |
| 20. 3 ½ x 6 ලිපි කවර (නො 01) | 92.00 | 89.50 | 90.00 |
| 21. 9 x 4 ලිපි කවර (නො 01) | 159.75 | 158.50 | 160.00 |
| 22. 9 ½ x 4 ½ චෙක් කවර (නො 01) | 195.00 | 190.50 | 185.00 |

| | | | |
|---|---|---|---|
| 23. 12 x 10 ලිපි කවර (නො 01) | 520.00 | 505.00 | 500.00 |
| 24. 15 x 10 ලිපි කවර (නො 01) | 590.00 | 578.00 | 575.00 |
| 25. 9 x 6 ලිපි කවර (නො 01) | 300.00 | 305.00 | 300.00 |
| 26. චීප් බෝඩ් | 40.00 | 39.00 | 37.50 |
| 27. පෝස්ට් ස්ටික් (කුඩා No 1) | 65.00 | 65.00 | 60.00 |
| 28. ටිපෙක්ස් | 73.00 | 57.50 | 55.00 |
| 29. ඔයිල් පේපර් | 5.25 | 6.50 | 5.00 |
| 30. සෙලෝ ටේප් අගල් 2 | 44.50 | 43.50 | 40.00 |
| 31. ෆයිල් කටු පෙට්ටි | 25.00 | 25.50 | 24.00 |
| 32. ෆයිල් ලේස් (පොඩි No 2) (ලොකු No 1) | 220.00 | 230.00 | 215.00 |
| 33. ෆැක්ස් රෝල (No-210x30x12'5) | 230.00 | 250.00 | 220.00 |
| 34. 28. හයලයිට් පෙන් | 80.00 | 70.00 | 65.00 |
| 35. 29.භාෆ් ශීට් පැකට් | 463.00 | 465.50 | 460.00 |
| 36. ලීගල් ෆොටෝ කොපි පැකට් 01 | 970.00 | 933.00 | 930.00 |
| 37. කබන් තනිපිට පැකට් 01 | 400.00 | 395.00 | 390.00 |
| 38. කාබන් දෙපිට පැකට් 01 | 400.00 | 395.00 | 390.00 |
| 39. ෆීල්ඩ් නෝට් බුක් 01 | 65.00 | 43.50 | 40.00 |
| 40. බයින්ඩර් ගම් 250 ග්‍රෑම් | 100.00 | 100.00 | 95.00 |
| 41. බයින්ඩර් ගම් 500 ග්‍රෑම් | 168.00 | 170.00 | 165.00 |
| 42. පැන්සල් | 20.00 | 19.50 | 19.00 |
| 43. සෙලෝටේප් අගල් 1 | 73.00 | 23.50 | 20.00 |
| 44. බයින්ඩින් ටේපි අගල් 2 | 168.00 | 43.50 | 42.00 |
| 45. පෑඩ් තින්ත බොතල් | 100.00 | 74.00 | 72.50 |
| 46. ස්ටෙපිලර් කටු පැකට් නො 10 | 23.00 | 20.00 | 18.50 |
| 47. ෆයිල් පාස්නර් පෙට්ටි | 130.00 | 133.00 | 130.00 |
| 48. පින්ස් පෙට්ටි | 30.00 | 30.00 | 28.00 |

| | | | |
|---|---|---|---|
| 49. අඩිරූල් (ප්ලාස්ටික්) | 29.00 | 17.50 | 15.00 |
| 50. ස්ටැම්ප් පෑඩ් ලොකු | 130.00 | 130.00 | 125.00 |
| 51. රබර් බෑන්ඩ් (මධ්‍යම) | 495.00 | 280.00 | 250.00 |
| 52. ස්ටෙපිලර් මැෂින් නො 369 | 300.00 | 270.00 | 265.00 |
| 53. කතුරු (මධ්‍යම) | 96.25 | 97.50 | 95.00 |
| 54. මකන කෑලි | 10.00 | 12.50 | 10.00 |
| 55. බොක්ස් ෆයිල් | 183.00 | 178.00 | 180.00 |
| 56. කැල්කියුලේටර් (CASIO MJ – 120TG) Two way power | 1920.00 | 1859.00 | 1850.00 |
| 57. සාමාන්‍ය ගම් 200 මිලි | 45.00 | 43.00 | 40.00 |
| 58. ඩ්‍රොවින් පින්ස් පැකට් 01 | 18.00 | 17.00 | 16.00 |
| 59. A3 සුදු පාට ෆොටෝ කොපි පැකට්01 (ඇවලොන්) ගේජ් 80 | 1530.00 | 1540.00 | 1530.00 |
| 60. ස්ටෙප්ලර කටු නො 10 | 23.00 | Í8.00 | 16.00 |
| 61. | | | |
| 62. ස්ටෙප්ලර මැෂින් නො 10 | 130.00 | 128.50 | 130.00 |
| 63. පන්චර් | 325.00 | 295.00 | 275.00 |
| 64. බ්‍රිස්ටල් බෝඩ් | 20.00 | 24.00 | 22.00 |
| 65. මාකින් ටේප් | 55.00 | 100.00 | 85.00 |
| 66. ෆයිල් කලිප් | 25.00 | 26.00 | 24.00 |
| 67. පුද්ගලික ලිපිගොනු කවර | 75.00 | 70.00 | 65.00 |
| 68. රූල් සහිත ෆීල්ඩ් නෝට් බුක් | 73.00 | 73.00 | 72.50 |
| 69. Empty CD කවර | | 37.00 | 35.00 |
| 70. පෝස්ට් ස්ටික් | 85.00 | 87.00 | 85.00 |
| 71. ෆීල්ඩ් නෝට් බුක් (ස්පයිරල්) | 85.00 | 78.00 | 75.00 |
| 72. Front cover | 19.00 | 20.00 | 18.00 |
| 73. Back cover | 19.00 | 20.00 | 18.00 |

| | | | |
|---|---|---|---|
| 74. Magazin Holder අගල් 6<br>Magazin Holder අගල් 3 | 375.00<br>190.00 | 378.50<br>185.50 | 375.00<br>180.00 |
| 75. Clear Bag | 38.25. | 37.00 | 35.00 |
| 76. ඩබල් ටේප් | 60.00 | 58.50 | 57.50 |
| 77. රූල් රහිත පොත් | | 75.00 | 72.50 |
| 78. කතුරු (ලොකු) | 96.25 | 100.00 | 95.00 |

**ඒ අනුව අඩුම මිළ ඉදිරිපත් කල රේනුල ස්ටේෂනර්ස්, ගාල්ල, ඒ. ජේ. පී. ස්ටේෂනර්ස්, කලුවැල්ල වෙතින් එම උපකරණ මිළදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල රේනුල ස්ටේෂනර්ස්, ගාල්ල, ඒ. ජේ. පී. ස්ටේෂනර්ස්, කලුවැල්ල වෙතින් එම උපකරණ මිළදී ගැනීමට ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යොජනා කළ අතර ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමත්කව සභා සම්මත විය.**

**(ඊ)කාරක සභා වාර්තා**

- ❖ 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිදු කල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීම.
- ❖ 2019.01.24 දින පවත්වන ලද මුදල් කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම.
- ❖ 2018.12.27 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම.
- ❖ 2019.01.31 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම.
- ❖ පුස්තකාල උපදේශන කමිටු වාර්තාව ඉදිරිපත් කිරීම.

## (උ). ලැබීම් හා ගෙවීම් වාර්තා

**සභාව වෙත ඉදිරිපත් කරන ලද ලැබීම් හා ගෙවීම් වාර්තා පිළිගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී නෙලී වක්කැල්ල මහත්මිය විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය ස්ථිර කිරීමෙන් අනතුරුව ඒක මතිකව සභා ම්මත විය.**

**වෙනත් කරුණු :-**

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා.**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. ප්‍රථමයෙන්ම මම ගරු සභාපතිතුමන් ට ස්තුතිවන්ත වෙනවා. මොකද අපි මාස දහයක් තිස්සේ ඉල්ලපු වීථි ලාම්පු ටික අපට එතුමා ලබා දුන්නා. ඒ වගේම තමයි ඒ සඳහා යෙදුණු අපේ විදුලි කාර්මික ශිල්පී මහත්මයා, රියදුරු මහත්මා, රංජි මහත්මා පුදුම කැපවීමකින් තමයි ඒ කර්තව්‍ය සිදු කළේ. ඒ අය හවස 7.00 වෙනකම්ම වැඩ කළා. එහෙම කරලා තමයි ඒ කටයුතු අවසන් කළේ. පියල් මන්ත්‍රීතුමාත් ඇවිත් හිටියා. ඒ ගැන එතුමාට ස්තුති කරන්න ඕන. ඒ වගේම තමයි මේ අය වෙනත් රාජකාරියේ යෙදෙන කම්කරුවන්ට වඩා වැඩි

සේවයක් කරන්නේ. ඒ තුන්දෙනා වර්ෂාව අවස්ථාවේදීත් වැඩ කළා. ලෙඩ වෙන්නත් හේතු වුණේ ඒක. අපට ලබාදුන් බල්බ් 10 සවි කළේ ගිනි අව්වේ, ලයිට් කණු වල ගොඩවෙලා. ගොඩක් මහන්සියෙන් තමයි ඒ කටයුතු සිදු කළේ. ඒ නිසා මේ අයට කීයක් හරි වැඩි කරලා දෙන්න කියලා මම සභාවෙන් ඉල්ලා සිටිනවා. මම හිතන්නේ මේ අයට OT එකවත් වැටෙන්නෙ නැහැ.

ඒ වගේම ගරු සභාපතිතුමනි, දියවර ගම්මානයේ වතුර බහින්නේ නැති තැනක් තියෙනවා. අපේ ගරු බන්ධුල මන්ත්‍රීතුමා ඊයේ පෙරේදා වාරිමාර්ග දෙපාර්තමේන්තුවත් එක්ක ගිහිල්ලා ඒක සැලසුම් හැදුවා. එතුමාටත් අපි අපේ ස්තූතිය පුදකරන්න ඕන.

ඒ වගේම ගරු සභාපතිතුමනි, උඩුගම පොලේ හිග මුදල් සරත් නමැත්තා ගෙන් අය කර ගැනීමට පියවරක් ගත්තද? අපට ඒ පිළිබඳව හරි විස්තරයක් ලැබුණේ නැහැ. ඒ වගේම ගරු සභාපතිතුමනි, මාපලගම පොදු වැසිකිලිය දැන් කුමන තත්වයකද තියෙන්නේ? අපට විනෝදා පොත්හලේ මහත්මා කිව්වා ආපහු පොදු වැසිකිලිය විවෘත කරන්න හදනවා කියලා. එම ස්ථානය ශුද්ධ පවිත්‍ර කළා කිව්වා. ඒ මහතා කියන්නේ මේ හේතුව උඩ ඒ අයගේ කඩේ වහන්න වෙනවලු. ඒ අය කියන්නේ නැවත විවෘත කරනවා නම් එහා පැත්තෙන් අඩි හයක පාරක් තියෙනවා ඒ පැත්තට දොර තියන්න කියලා. එතුමා වෛද්‍ය වාර්තා ඉදිරිපත් කරලා තියෙනවා මේ සභාවටත්. වෛද්‍යවරයා පවා කියලා තියෙනවාමෙතනට මේක සුදුසු නැහැ කියල. අනිත් එක සභා පනතේ තියෙනවා, සෙනග ගැවසෙන ස්ථානයක ඉස්සරහට දොර තියන්න එපා කියලා. ඒවගේම තමයි ගරු සභාපතිතුමනි මුදල් යන පැත්තම විතරයි අපි බලන්නේ. මේ සභාවට යම් මුදලක් එනවා නම් ඒක අය කරගන්න සේවකයෙක් යවන්නේ නැති එකක් තියෙනවා. වරෙන්තු හා දඩ මුදල් සම්බන්ධව අපට උසාවි කීයකින් මුදල් හම්බ වෙනවද? ඒ විස්තර අපට ලබන මාසේ හරි දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම තමයි විදුලිබල මණ්ඩලයෙන් අපට මුදලක් මෙහෙට හම්බවෙන්න ඕන. මම හිතන්නේ ඒවා තවම ලබාගෙන නැහැ. මම නැවත වාරයක් ගරු සභාපතිතුමන්ට ස්තූතිය පුද කරනවා. අපේ වචනයට සවන් දීලා අපේ කටයුතුවලට සහයෝගය දෙන නිසා. ඒ වගේම දැන් මට හත්තක පිරිවෙනේ උත්සවයක් සඳහා යාමට ඇති නිසා, බැහැර වීමට අවසර දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා.**

ගරු සභාපතිතුමනි, මට ප්‍රකාශයක් කරන්න ඕන එතුමාගේ කතාව පිළිබඳ. පොදු වැසිකිලිය පිළිබඳව. එම වැසිකිලිය අවුරුදු පහක් හයක් විතර වහල තිබුණා. අපි මේ මෑතකදී සුද්ද කෙරුවා. කම්කරුවන් දාලා, අපේ අනුග්‍රහයෙන්, අපේ මුදලින් තමයි ඒ කටයුත්ත සිදු කළේ. වැසිකිළි කටේ ගල් පවා තිබුනා අපි ඒවා සම්පූර්ණයෙන්ම ඉවත් කළා. අපි දැන් ඒ සඳහා පුද්ගලයෙක් තෝරා ගෙන ඉන්නවා. එයාට ලැබෙන මුදලකින් එය නඩත්තු කරගෙන යන්න. ඒ වැසිකිලියේ දොර එහා පැත්තට දාන්න බැහැ. එක ඇතුලට ගිහිල්ලා ඔලුව දාලා බලන්න ඕන. එහෙමනම් වැසිකිළි කටක් ඇතුලෙන් එන්න ඕන. ඔය විරුද්ධ වෙන මනුස්සයා ඒසී කාමරයක ඉන්නේ. ඒ සී කාමරේට ගඳ එන්නේ කොහොමද? අනිවාර්යයෙන් හෙට අනිද්ද මහ ජනතාවගේ ප්‍රයෝජනය සඳහා යොදවනවා. අපේ මේ දේශපාලන විරුද්ධතාවයක් නෙවෙයි. වතුර ප්‍රශ්න හින්දා තමයි ඔය වැසිකිලිය අපවිත්‍ර වෙලා තිබුනේ. අලුතෙන් වතුර මෝටරයක් යොදවලා, බට ලයින් එකක් හදලා දැන් මාපලගමට අවශ්‍ය ජලය ලබා දීල තියෙනවා. එතකොට වැසිකිළියත් ප්‍රයෝජනයට ගන්න පුළුවන්. ඒ ගැන සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවටම ස්තූතිවන්ත වෙනවා. අපි එතනට පුද්ගලයෙක් දැම්මම එයා ඒක ශුද්ද, පවිත්‍රව තියාගනීවි. එක පුද්ගලයෙක් හැරෙන්න, ත්‍රීවිල් සංගමය ඇතුළු අනිත් සියලුම දෙනා මෙයට කැමතියි. මෙතනට බස් ගමන් වාර හැට දෙකක් එනවා. ඒ සියලු දෙනාම කැමතියි. ඒ වගේම විදුලිබලය ගැනත් ස්තූතිවන්ත වෙනවා. සාමාන්‍යයෙන් අපට සතුටු වෙන්න පුළුවන් මට්ටමින් ඒ කටයුතු කෙරුණා. ඒ

නිසා අපි සභාවේ සියලු දෙනාට ස්තුතිවන්ත වෙනවා. මෝටරයක් හයිකරලා ජලය ලබාදීම, විදුලිය ලබාදීම පිළිබඳව. තව තව පොඩි පොඩි අඩුපාඩු ටිකක් තියෙනවා. විදුලිය පිළිබඳ අනිත් කොට්ඨාස වලටත් යන්න ඕන නිසා, ඒ ටික පසුව කරලා දෙන්න. ඒ වගේම ලෙස්ලි මහතා, කැළුම් මහතා ඇත්තටම උනන්දු වෙලා රාත්‍රී කාලයේත් වැඩ කළා. කාලගුණය දවස් දෙකක් විතර හරස් වුණා. මමත් කියන්නේ අර ජයවීර මන්ත්‍රීතුමා කිව්වා වගේ අතිකාල දීමනා ලබා දෙන්න පුළුවන් නම් මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා.**

ගරු සභාපතිතුමා, නියෝජ්‍ය සභාපතිතුමා, සියලුම මන්ත්‍රී මණ්ඩලයෙන් හා නිලධාරි මහත්වරු ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම උඩුගම ප්‍රදේශයට අදාල ගැටලුවක් ගැන කතා කරන්න ඕන. උඩුගම ප්‍රධාන මාර්ගයේ ජලසම්පාදන මණ්ඩලය මගින් මාර්ගය දෙපස ජලය ලබාදීමේ දී, පසුගිය දවස්වල ඒ ජල නලයක් පුපුරල උඩුගම හෝමදොල හන්දිය ප්‍රදේශයේ පාර විශාල ප්‍රමාණයක් කඩාගෙන ගිහිල්ලා, අනතුරුදායක තත්ත්වයක් තිබුණා. ඔබතුමා ඒ ගැන දැනුවත් වුනා ද කියල නම් මම දන්නේ නැහැ. ඒ තත්ත්වය උඩ රාත්‍රී කාලයේදී මෝටර් සයිකල් වැටිලා අනතුරු සිදු වුණා. මම හොඳට දන්න පුද්ගලයෙක් අනතුරට පත්වුණා. මේ ගැන පොලිසියෙන්වත් කිසි අවධානයක් යොමුවන්නේ නැහැ. ඒ වගේම ජල සම්පාදන මණ්ඩලය, මහා මාර්ග අධිකාරියට මුදල් ගෙවනවා. නමුත් ඒ කිසිම කෙනෙක් ඒ ගැන නොසලකා හරිනවා. අඩුගානේ පාරේ ඒ ස්ථානයට ආවරණයක් වත් දන්නේ නැහැ. ඒ නිසා මෙම අනතුරු අවම කරගැනීමට මේ ප්‍රාදේශීය සභාව හරහා යම් පියවරක් හෝ නියෝගයක් කිරීම සුදුසුයි කියලා, මම මුලින්ම ප්‍රකාශ කරනවා. ඒවගේම ඒ සම්බන්ධව යම් පියවරක් ගන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම උඩුගම ප්‍රදේශය ගැන කතා කරනවිට, දැන් මාර්ග සංවර්ධනය වෙලා ගාල්ල සිට උඩුගම කැටගොඩ දක්වා මාර්ගය අලුතින් හැදිලා, සංවර්ධනය වෙලා තියෙන වෙලාවේ පොලිස් දෙපාර්තමේන්තුව විශාල ලෙස දඩ අය කරනවා. ඒක එතුමන්ගේ රාජකාරිය පැත්තෙන් කෙරෙන්න ඕන දේ තමයි. නමුත් උඩුගම බාර් හන්දිය ප්‍රදේශයේ වටරවුමක් නැති නිසා, නිරන්තරයෙන් පොලිසියෙන් ඇවිල්ලා ඒ ස්ථානයේ ඉඳගෙන, ඉරි කැපුවා. මාර්ගයට ප්‍රවේශ වෙන විදිහ වැරදියි ආදී දේ කියලා අධික ලෙස දඩ ලබාදෙනවා. අඩුම ගානේ අවවාද කරලා දඩයකට යන්නෙ නැතුව නිදහස් කරනවා නම් හොඳයි. අපි මේකට මැදිහත් වෙලා පොලිසිය සමග සාකච්ඡාවක් හරි ඉල්ලලා මේ සම්බන්ධව පියවරක් ගමු. මොකද දිනපතා මේ මාර්ගය භාවිතා කරන ත්‍රිවිල් රථ රියදුරන් පවා මේ දඩ වලට අහුවෙලා තියෙනවා. මට ඊයෙ එහෙම කෙනෙක් හමුවුණා. දඩ කොලයක් ගෙවලා ලයිසන් එක ගන්න පොලීසියට යන ගමන්, ඔහු මේ මාසෙට රුපියල් 3950.00 ක දඩ ගෙවලා තියෙනවා කිව්වා. ඒ ප්‍රදේශයේ කිසිම සානුකම්පිත ක්‍රමයකට නෙවෙයි දඩ මුදල් අය කරන්නේ. අවවාද කරල යවන්න පුලුවන් දේට පවා දඩ අය කරනවා. අපි ප්‍රාදේශීය සභා විදියට සාකච්ඡාවක් ඉල්ලලා මහජනතාව වෙනුවෙන් යම් ආරම්භයක් කරමු කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම තමයි උඩුගම හෝමදොල ප්‍රදේශයේ හෝමදොල නො. 2 ප්‍රදේශයේ කමලාවතී කියලා වයසක අම්මා කෙනෙක් මේ ප්‍රාදේශීය සභාවෙන් දූරියන් ගහක් කපන්න අවසර ඉල්ලා තියෙනවා. අවුරුද්දක් වගේ කාලයක් පුරාවට දහ අට වාරයක් ප්‍රාදේශීය සභාවට ඇවිල්ල තියෙනවා. ඒ අම්මට අවුරුදු 70 කටත් වැඩියි. උඩුගම හෝමදොලටත් එහා 34 ප්‍රදේශයේ, එතන ඉදල එන්න බස් රථයක් නැහැ. එතුමිය වයස නිසා ත්‍රිවිල් එකක එන්නෙ. මම හිතන්නේ හයර් එකට රුපියල් දාහක් ගන්නවා. ඒ වගේ 18 වතාවක් මේ ප්‍රාදේශීය සභාවට ඇවිල්ලා තියනවා. නමුත් අද වෙනකම් ඒ ගහ ඉවත්කිරීමට කටයුතු කරලා නැහැ. විශාල අවදානමක් තියෙනවා. මේ කාලේ දූරියන් ගෙඩි වැටිලා වහලත් කුඩු වෙලා. ඒ අම්මා සහ ගමේ අය සභාවට චෝදනා කරනවා. ඒ ගැන නැවත සලකා බලා

ලබන සභාවට පෙර මේක නිවැරැදි කරන්න කියලා අපේ ගරු සභාපතිතුමා ගෙන් මම මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා.

ඒ වගේම අපි මේ සභාවේ වියදම් වාර්තාව ගත්තට පස්සේ කල්පනා කරලා බැලුවා. මම මීට පෙරත් මේ සභාවෙ කතා කරල තියෙනවා. මේ සභාවට අවශ්‍ය කරන ඕනෑම සේවාවක්, පහසුකමක් මේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් ම ගන්න පුළුවන්කම තියෙද්දි, ලිපි ද්‍රව්‍ය පවා ගේන්නේ ගාල්ලෙන්. සමහර කාල වලට විදුලි බඩු ගෙන්නේ කොළඹින්. මේ ප්‍රාදේශීය සභාවට බදු ගෙවන නාගොඩ ප්‍රාදේශීය සභාව ඇතුලත තියෙන ස්ථාන වලින් මිලදී ගන්න බැරි පහසුකම් විතරක් වෙනත් ප්‍රදේශවලින් ගන්න කියලා ඉල්ලා සිටිනවා. මේ මිල ගණන් බැලුවම මීට වඩා අඩුවෙන් අපේ ප්‍රදේශයෙන් ගන්න පුළුවන්. ඒ නිලධාරි හරි, කවුරුහරි මේවා ගේන්නෙ මොන සම්බන්ධකම් උඩ ද කියලා මම දන්නේ නැහැ. නමුත් අපි දන්නවා ඔය දේවල් ඔයිට වඩා අඩුවට තියනව. අපි අපේ දරුවන්ගේ පාසල් පොත් මිලදී ගන්නකොට, අපි දන්නවා ඊට වඩා අඩු වට මේ ප්‍රාදේශයේ තියෙනව. මිල ගණන් කැඳවන කොට සභාවේ මන්ත්‍රීවරු දැනුවත් කරන්න කියලා අපි ඉල්ලුවා. ඒ පෝරම අපටත් ලබාදෙන්න කියලා,නමුත් ලැබුණේ නැහැ. මේ නිලධාරීන් ගිහිල්ලා කරන ක්‍රමේ නම් ඇත්තටම මම දන්නවා. ඒ අවශ්‍යතාවය කරන්නඕන තැනින් quotation එකක් අරගෙන තව දෙකක් වැඩි මිලට ගේනවා. ඇත්තටම වෙන්නෙ ඒකයි. ඒ වගේම කොට්ටවගම ප්‍රදේශයෙ මම දන්නේ නැහැ. ඉලෙක්ට්‍රික් බඩු කඩයක් තියෙනවා කියලා. ඒ ප්‍රදේශයෙන් බඩු අරගෙන තියෙනවා. අපේ මේ මාපලගම දයානි එකෙන් හරි, උඩුගම වෙනත් කඩේකින් හරි ඕව ගන්න පුළුවන්. අපේ බල ප්‍රෙද්ශයෙන් ඕවා ගන්න පුළුවන්. මොකද අපේ සභාවට බදු ගෙවන සහ මේ සභාවත් එක්ක යම් යම් සම්බන්ධකම් තියෙන, අපේ ප්‍රදේශයෙන් ගන්න පුළුවන් ඒවා ගැනීමේදී සලකා බලන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම නාකියාදෙණිය ඉඳලා හඟරංවල හරහා යටලමත්ත දක්වා එන මාර්ගය පාර කැඩිලා තිබුණා. අපි පසුගිය දවස්වල ඔයිල් ෆාම් ෆැක්ටරියේ නිරීක්ෂණ චාරිකාවට යනකොට දැක්කා. අපි ගියේ පාරක නෙවෙයි, කාණුවක. නමුත් ඒ පාරට මට දැනගන්න ලැබුණා. පසුගිය කාලේ ඒ වතු සමාගම විසින් රුපියල් ලක්ෂ 10ක මුදලක් ඩිපොසිට් එකක් ඒ මාර්ගයේ නඩත්තුව සඳහා ඇපයක් විදියට මේ සභාවේ තියලා තියෙනවා කියලා. නමුත් ඒ මාර්ගය දැන් යන්න බැරි තත්ත්වයට පත්වෙලා තියෙන්නෙ. මාර්ගය සඳහා දැන් ඒ මුදල වියදම් කිරීමේ හැකියාව තියෙනවා. මොකද ඒක ඇප මුදලක්.ඒ මාර්ගය කැඩුනොත් පාවිච්චි කරන්න පුළුවන්. මම දන්න තරමින් ඒක තාම සභාවෙ තියෙනවා. ඒක අපි ඇපයක් විදියට තියාගෙන ඉන්නේ නැතුව, ඒ අයත් දැනුවත් කරලා, ඒ මුදල් ආපහු දෙන්න නෙවෙයි. ලක්ෂ දහයකට වැඩි හානියක් වෙලා තියෙන මේ වෙලාවේ, අපිට ආරම්භයක් කරලා ඔවුන්ට දැනුම්දීමක් කරලා ඒක පාවිච්චි කරන්න පුළුවන්. ඒ අයගෙන් ඇහුවම කියන්නේ අපි ලක්ෂ 10ක මුදලක් දීලා තියෙනවා. ඒකෙන් ගන්න කියලා කියනවා. ඒ මුදල ඒ මාර්ගය සඳහා යොදවා නැත්නම් සොයාබලා එම මාර්ගය වෙනුවෙන් යොදවන ලෙස ඉල්ලා සිටිනවා. මොකද ඒ මාර්ගය දැඩි ලෙස හානි වෙච්ච මාර්ගයක් නිසා.

ඒ වගේම තමයි මේ සභාවේ අපි මාසෙකට දවසක් සභාවට ඇවිල්ලා, එන දවසෙවත් මේ සභාවෙ තියෙන වැසිකිළියෙ වතුරවත් නැහැ. සභාපතිතුමා, අපි 2011 හේ ආවට වඩා පොඩි වෙනසක් තියෙනවා. මොකද වෙනද ආවට පස්සෙ සභා රැස්වීම තියෙන දාට වත් මේ සභාවේ මීට වඩා පිළිවෙලක් තිබුන කියල හිතෙනවා. මොකද සේවකයෝ ඉන්නවා. නමුත් අර එහා පැත්තට ගියාට පස්සේ කිසිම පිළිවෙලක් නැහැ. කුණු ගොඩවල් ගහලා, ඒ විදියටම තියෙනවා. ඉස්සරහ විතරක් මෙහෙම තිබුනට වැඩක් නැහැ. සින්ක් එකක වතුර එන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, සභා වාරෙ දවසට මෙහෙම නම් අනිත් දවස් වලට කොහොමද කියලා හිතාගන්න පුළුවන්. උප සභාපතිතුමනි, නිරන්තරයෙන් මහජනතාව ගැවසෙන ස්ථානයක් මේක මීට වඩා ක්‍රමවත් වෙන්න ඕන. අඩුම ගානේ

අපි එන දවසටත් මෙහෙම නම් මේවා නඩත්තු වෙන ආකාරයක් පේන්න නැහැ. අපි ගම හදන්න කලින් මෙතනින් ආරම්භයක් ගන්න ඕන. ඒක නිසා ඒ ගැන මීටත් වඩා අවශ්‍ය සේවකයන් යොදවලා ඒ කටයුතු කරන්න කියල ඉල්ලා සිටිනවා. මේවා අමුතුවෙන් කියන්න ඕන දේවල් නෙවෙයි. සභාපතිතුමා දන්න දේවල් සහ හිතේ තියන දේවල්. නමුත් ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැති එකේ යම් ගැටලුවක් තියෙනවා. ඔබතුමාට තනියෙන් බැරුව ඇති. මේ ඉන්න නිලධාරීන්ගෙන් හා සේවකයන්ගෙන් ප්‍රයෝජනයක් අරගෙන, මීට වඩා ක්‍රමවත් විදියට මේ ආයතනය පවත්වාගෙන යන්න ඔවුන්ට උපදෙස් දෙන්න කියල අපි මේ මන්ත්‍රීවරු විදියට ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමා අපි මේ සභාව පටන් ගත්ත තෙක් ගෝණදෙනිය ප්‍රදේශයේ වීථි පහන් අලුත්වැඩියා කරලා තිබුණෙ නැහැ.පසු ගිය දිනවල බදව ගත්තු කැළුම් මහත්මයත්, විදුලි කාර්මික ශිල්පියත් ඇවිල්ලා ඒ කටයුතු සිදුකරලා ගියා. දැන් 90% ක් විතරම ඒක නිවැරදි කරන්න කටයුතු කරලා තියෙනවා. විදුලි පහන් පත්තු වෙන එකේ ගෞරවය ඔබතුමාට සහ මේ සභාවට හිමි වෙන්න ඕන. ඉතින් ඒ කටයුත්ත නිරන්තරයෙන් සොයා බලා ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යන්න කියලා ඉල්ලා සිටිමින්, ඒ ගැන නැවතත් ඔබතුමාලට ස්තුතිය පුද කරමින්, මම පුංචි කාරණා කීපයක් කිව්වේ. ඒ කාරණා ගැන සැලකිල්ලක් දක්වන්න කියල ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා.**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. තරංග මහත්තයා කිව්වා වගේ හෝමදොල නොම්මර 02 ප්‍රදේශයේ කමලාවතී මහත්මියගේ දූරියන් ගහ ඉවත් කරලා දෙන්න කියලා මමත් ගරු සභාපතිතුමාටත්, ලේකම්තුමියටත් කිහිපවිටක්ම දුරකථනයෙන් කතා කරලා කිව්වා. ඇවිල්ලා කිව්වා. නමුත්, තරංග මහත්මයා කිව්වා වගේ එතුමිය ත්‍රිවිල් එකකින් 18 වතාවක් විතර මෙතනට ඇවිල්ල තියනවා. ඒ ආච්චි තනියම ගෙදර ඉන්නේ. ඒ දූරියන් ගහ තියෙන්නෙ ගේ අයිනෙමයි. මැටි ගහපු පුංචි ගේක තමයි ඉන්නේ. මම අදත් ලේකම්තුමියට කිව්වා මේක කරල දෙන්න. එහෙම නැත්නම් මොනවා හරි වුනොත් තනිකර සභාවෙන් වගකීම භාරගන්න කියලා. මමත් ඒ මිනිස්සුන්ගෙ පැත්ත ගන්නවා කියලා කිව්වා. දැන් දූරියන් ඉදිලා මිදුලට වැටෙනවා. වහල පවා කුඩු වෙලා. ඒ නිසා නැවත වතාවක් සභාපතිතුමා ගෙන් ඉල්ලීමක් කරන්නේ, මේ ගහ ඉවත් කරලා දෙන්න කියලා. කවුරු හරි කපලා අරන් යන්න කැමති කෙනෙක් ඉන්නවනම්, එහෙම කෙනෙකුට භාර දෙන්න. අපිට දෙපැත්තම ඕන. නමුත් ඒ ආච්චිට මොනවා හරි කරදරයක් වුනොත්, සභාවක් විදියට අපි ඒකෙ වගකීම භාර ගන්න ඕන ඒක නිසා දිගින් දිගටම ඔබතුමාගෙනුත්, ලේකම්තුමියගෙනුත් මේ ගහ ඉවත් කරලා දෙන්න කියලා ඉල්ලුවෙ.

ඒ වගේම තවත් හෝමදොල ජන උදාන ගම්මානයෙ ගස් තුනක් ඉවත් කරලා දෙන්න කියලා,සභාවෙන් ඉල්ලීම් කරල මාස 6 ක් 7 ක් විතර වෙනව. ඒ මිනිස්සු සභාවෙන් කරන්නෙ නැත්නම්, ඉහලට දැනුම්දීමක් කරනවා කියලත් කිව්වා. අද උදෙත් මට මතක් කළා. නමුත් සභාපතිතුමාටත් කිව්ව, ලේකම්තුමියටත් කිව්ව.කිසිසේත්ම ඒකට සාධාරණයක් වුණේ නැහැ. නැවතත් ඒ පිළිබඳ අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරමින්,විශේෂයෙන්ම දූරියන් ගස පිළිබදව ඔබතුමාගෙ අවධානය යොමු කරල ඉතා ඉක්මනින් එය ඉවත් කරල දෙන්න කියන ඉල්ලීම කරනවා බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රීනී කේ. කේ. අයි. නෙරංජලී මහත්මිය.**

ගරු සභාපතිතුමාගෙන් ද, මන්ත්‍රීතුමන්ලාගෙන්ද, මන්ත්‍රීතුමියන්ලාගෙන් ද, සියලු දෙනාගෙන්ම අවසරයි. මගේ අවස්ථාව මම යොදාගන්නෙ, මම ගිය සභාවාරයෙත් කතා කළා. අප නිවසට යන මාර්ගයේ කඩයක් ඉදිකිරීම සම්බන්ධව. ඒ පිළිබඳව ඔබතුමා ගත්ත තීරණය කුමක්ද කියලා මම දන්නේ නැහැ. නමුත් මට ආරංචියක් ආවා. එතුමා කියලා තියෙනවා. සභා වාර්තාවේ පිටපතක් එතුමාට හම්බ වෙනවයි. ඒක ආවට පස්සෙයි මට කතා කරන්නේ කියලා. අවන්ත මහත්මයා වාර්තාව දෙන්න අපේ ගෙදර පැත්තේ යනකොට එතුම වාර්තාවේ පිටපතක් අර කියන පුද්ගලයාට දෙයිද කියන එක මම දන්නෙ නැහැ. මම ඔබතුමාට මේ පිළිබඳ මාස දෙකකට විතර උඩදී දුරකථනයෙන් දැනුම් දුන්නේ. ගිය වාරේ තමයි සභාවේ කතා කළේ. මේ වනතුරුත් නිසි අවධානයක් යොමුවෙලා නැතෙයි කියලා මම හිතනවා. ඒ ගැන නැවතත් මම මතක් කරනවා. මොකද ඒ ගමේ පුද්ගලයන් ඇවිල්ල කියන්නේ මට. ඉදිරියේදී තව පාරට ගන්න ලේස්ති වුණොත් මේ පාරේ යන්න අපහසුතාවයක් ඇති වෙනවයි කියලා. ඒ ගැන මතක් කරනවා.

ඒ වගේම තමයි අපේ ලක්රුවන් සම්පත් මහත්මයා කිව්වා එතුමාට විරුද්ධව පාර සම්බන්ධ නඩුවක් තියෙනවා. ඒක අස්කරගන්න ඒ ගැන එතුමා කතා කළා. මේ ගැන මොකක් හරි කතා කරන්න කියලා. ඒ නඩුවට යන පුද්ගලයත් එක්ක කතා කළාම නඩුව අයින් කරගන්න එතුමා කැමැත්ත පළකර තිබුණා. මෙතුමාට ඇවිත් හමුවන්න කියලා, කියලා තිබුණා. ඊට පස්සේ මෙතුමා යන්න ඇති. ඒ ගැන නම් මම ඊට පස්සෙ කියන්න දන්නෙ නැහැ.

තවත් මට ස්තුතියක් කරන්න තියෙනවා. මොකද 71 වෙනි නිදහස් උළෙලට අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා, අප සියලු දෙනාට ආරාධනා පත් එවලා තිබුණා. අපි ඒ ආරාධනා පත්‍රය අනුව හැත්තෑ එක් වෙනි ජාතික නිදහස් උළෙල නැරඹුවා. ඒ ගැන අපි වජිර අබේවර්ධන මැතිතුමාට මේ අවස්ථාවේදී ස්තුතිය පුද කරනවා.

ඒ වගේම හැමදාම කතාකරන අර මාන පඳුරු ගැනත් කියන්න තියෙනවා . තව දෙයක් තමයි කැප්පිටියාගොඩ පාලම අසලට විදුලි පහනක් අවශ්‍යයි කියලා මම කිහිප වතාවක්ම කිවුවා. නමුත් තවම නැහැ. මොකද උදේ හතරට තමයි පුද්ගලයන් කොළඹ බස් එකට යන්න එතැනට එන්නේ. කරුවලේ තමයි ඉන්න වෙන්නෙ.අපි හතරවෙනිදත් කොළඹ බස් එකට යන්න ගිහිල්ල කරුවලේ තමයි එතන හිටියෙ. ඒ ගැනත් මතක් කරමින්, මගේ කතාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය.**

ගරු සභාපතිතුමා, ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. කැප්පිටියගොඩ පාලම ළඟ තියෙන විදුලි පහන අපි පසුගිය කාලය තුළදී ප්‍රතිසංස්කරණය කළා. පසුගිය කාලය පුරාවටම ඒක පත්තු වුනා. දැන් මම හිතන්නේ පසුගිය දවස්වල වෙන්න ඇති මොකක් හරි හේතුවක් නිසා නැවත වතාවක් එකේ ආලෝකය නැති වෙලා යන්න ඇත්තෙ. 95% කටත් වැඩි ප්‍රමාණයක් අපේ වසම තුළ තියෙන විදුලි පහන් ඔක්කෝම අපි නැවත ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සිදු කළා. මම ඒ පිළිබඳව අපේ ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. කෙසේ වෙතත් එතැන වෙලා තියෙන්නේ කරපු දේ නැවත වතාවක් අක්‍රිය වීම. ඒක පත්තු වෙනවා, නැති වෙනවා. ඒක බල බල නිතරම කරන්න අමාරුයි. ඒ පිළිබඳව නැවත වතාවක් ඒ බල්බ් එක හදා දෙන හැටියට ඉල්ලීමක් කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මම දිගටම වගේ ඉල්ලීමක් කළේ, අපේ මේ කැප්පිටියාගොඩ ප්‍රදේශය තුළ තොටුපළවල් කිහිපයක් තියෙනවා. එයින් එකක් දෙකක් හරි ජනතාවට ප්‍රයෝජනයට ගන්න පුළුවන් විදියට සකස් කරල දෙන්න පුලුවන් කමක් තියෙනවා නං ඒ ගැන සතුටු වෙනවා. පසුගිය

කාලය තුළ දැඩි නියං කාලෙ නිසා, ජලය පිළිබඳව ජනතාවට බොහොම අපහසු තාවයක් තිබුණා. එනිසා ඔබතුමාගේ අවධානය ඒ පිළිබඳව යොමු කරමින්, ඒ කරුණ අපට ඉටු කරලා දෙන්න කියන ගෞරවනීය ඉල්ලීමත් ඉල්ලමින්, සියලුම දෙනාට බොහොමත්ම ස්තුතියි.

**ගරු මන්ත්‍රී අමර ධනංජය විලේගේ මහතා.**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. සභාපතිතුමනි, ගෝණදෙනිය අම්බලම හන්දිය දැන් බෝගහ හන්දිය කියලා හඳුන්වන්නේ. එතැන කලින් අම්බලමක් තිබිලා තියනවා. ඒ සඳහා රජයේ ඉඩමක් තිබිලා තියනවා. මේ වන විට ඒ බෝධිය අවට සම්පූර්ණයෙන්ම එතන ඒ ඉඩම් හිමියා විසින් තේ වගාව සිදු කරළා තියෙනවා. අම්බලමට තිබ්බ ඉඩම මම හිතන්නේ ප්‍රාදේශීය සභාව සතු වෙන්න ඕන. ඒ ඉඩම නිරවුල් කරලා ලබා දෙන්න පුලුවන්ද කියලා මම දැනගන්න කැමතියි. ඒ වගේම තමයි ගෝණදෙනිය පිට්ටනිය ප්‍රතිසංස්කරණය කරන්න මම යෝජනාවක් දාලා තියෙනවා. ගෝණදෙනිය පිට්ටනියෙ කළුගල් බාල තියෙනවා. කළුගල් බාපු පුද්ගලයාට මම කීප වතාවක්ම දැනුවත් කළා. කළුගල් ටික ඉවත් කරගන්න කියලා. නමුත් තවම එය සිදුවෙලා නැහැ. දැන් වසරකට වැඩියි. නමුත් මේක සභාව දැනුවත් ද දන්නේ නැහැ. වසරකට ආසන්න කාලයක් පිට්ටනියෙ ගල් ටික බාලා තියෙනවා. ගල් කියුබ් තුනක් හතරක් විතර තියෙනවා. එක්කෝ ඒක සභාවට හරි අරගන්න. මොකද සභාවෙ ඉඩමක තියෙන්නේ. අරගෙන සභාවේ කටයුත්තකට යොදා ගන්න. නැත්නම් ඒ පුද්ගලයාට ඉවත්කර ගන්න කියන්න. ඒ වගේම මම තව දැනගන්න කැමතියි. පිට්ටනිය ඉදිරිපස තියෙනවා අපේ සභාවට ඉඩමක්. ඒක නඩු කටයුත්තක් සිදුවෙනවා. ඒ නඩු කටයුතු සාර්ථකව කෙරෙනවා ද? ඒ ඉඩමේ අයිතිය අපට ලබා ගැනීමේ කටයුතු සිදු වෙනවාද? කියලා මට දැනගන්න අවශ්‍යතාවය තියෙනවා.

**ගරු මන්ත්‍රීනී කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය.**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, මාර කන්ද ප්‍රදේශයේ වැලි පලක් තියෙනවා. ඒ වැලි පොලේ වැලි සෝදලා වතුර පාර ඇළට යන විදියට තමයි හදලා තියෙන්නෙ. ඒ නිසා ඇළේ වතුර මඩම මඩ පාටයි. ඒ නිසා ප්‍රදේශයේ ජනතාව ගොඩක් පීඩාවට පත් වෙලා තියෙනවා. ඒ ජනතාව රෙදි සෝදන්නේ, නාන්නේ ඇළෙන්. ඒ නිසා ඉක්මනින් මේ සඳහා පියවරක් ගන්න කියලා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒත් එක්කම සභාපතිතුමනි ඉස්කෝලෙ යන ළමයි ගෙදරින් හොදට කකුල් හෝදල පිහදාල සපත්තු මේස් දාගෙන ඇවිල්ල අර ජයතිස්ස අබේසුන්දර මහතාගේ නිවස අසල වතුර පිරෙන ස්ථානයෙදි ඒව ගලවලා, මඩ වතුරේ ගිහිල්ලා, මඩ වතුරත් එක්ක තමයි ආපහු මේස් සපත්තු දාගෙන යන්නෙ. ළමයි කිහිප දෙනෙක්ගේ කකුල් තුවාල වෙලා. අද උදේ මම එනකොට කිව්වා. කොහොම හරි ස්කුටර් බයිසිකලෙන් වත් ළමයෙක් එක්කගෙන යන්න බැහැ.එතනින් ඒ බයිසිකලයට වතුර යන නිසා. ඒ නිසා ඒක ලොකු ප්‍රශ්නයක්. ගරු සභාපතිතුමනි, හැකි ඉක්මනින් අදාළ බලධාරීන් දැනුවත් කරලා, කටයුතු කරන්න කියලා මම ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම මට දුවගෙ පාසලට යන්න අවශ්‍ය නිසා මෙම ස්ථානයෙන් වේලාසන බැහැර වීමට අවසර ලබාදෙන මෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා.**

ගරු සභාපතිතුමනි, ප්‍රාදේශීය සභා මැතිවරණය පවත්වා අද වනවිට වර්ෂයක් වෙනවා. මේ කාලවකවානුව තුළ නාගොඩ ප්‍රාදේශීය සභාව හැටියට අපි යම් මට්ටමකින් සතුටු වෙනවා. ඒ වගේම තව බොහෝ වැඩ කොටසක් මේ කාලය තුලදී සිදුකිරීම සඳහා අවකාශ තිබෙනවා. මම පළමුවෙන්ම සඳහන් කරනවා. නාගොඩ ප්‍රාදේශීය සභාව හැටියට අපි අවුරුදු හතරකට මේ ස්ථානයට මහජනයාට

සේවය කිරීම සඳහා, තෝරා පත් කරලා, ජනතාව ලොකු බලාපොරොත්තු රාශියක් තියාගෙන තමයි අපි එවල තියෙන්නෙ. ඒ නිසා මේ ප්‍රාදේශීය සභාව තුළ අපි විසි හත් දෙනෙකුට මහජනයාගේ මුදල් වලින් දීමනාවක් ගෙවනවා වගේම, මේ ප්‍රාදේශීය සභාව තුළ සේවය කරන සියලු සේවකයන්ට, මේ රටේ අහිංසක මිනිස්සුන්ගෙ බදු මුදල් වලින් එකතු කරන මුදල් වලින් තමයි අපි හැමදෙනාටම, රජය සේවකයන් හැටියට පඩි ගෙවන්නෙ. අපි පමණක් නොවෙයි සමස්ත සියලු රාජ්‍ය සේවකයන් හිතට එකඟව, යම් සේවාවක් ජනතාව වෙනුවෙන් ලබාදීමට ඇඳී බැඳී සිටිනවා. මේ ක්‍රියාවලියේදී ගරු සභාපතිතුමා, ඒ වගේම මේ සියලු නිළධාරී මණ්ඩලයට සියලු දෙනාගෙ සහයෝගය අවශ්‍යයි. අනිත් රාජ්‍ය ආයතන වලට සාපේක්ෂව, මේ ප්‍රාදේශීය සභාවට ආවම අපට කළකිරුනු ස්වභාවයක් දක්නට ලැබෙනවා. මම කාටවත් දෝෂාරෝපණය කරන්නේ නැහැ. සියලු දෙනා රාජ්‍ය සේවකයන් වශයෙන්, තමන්ගෙන් ඉටු විය යුතු යුතුකම් හරියට, හෘද සාක්ෂියට එකඟව අනිවාර්යයෙන් සිදු කරන්න ඕන. ඒ පිළිබඳව දැඩි අවධානයකින් මම මේ වෙලාවේ සඳහන් කරනවා. ඒ වගේම අතිකාල දීමනා ගෙවීම සම්බන්ධයෙන් කතාකරනවනම්, සේවා කාලය තුළදී යම් සේවාවක් කර ගන්න බැරි වුණා නම්, ඒ සේවාව නැවත ලබාගැනීම වෙනුවෙන් තමයි අතිකාල ගෙවන්නේ. ඒ ගෙවීම් සම්බන්ධයෙන් යම් ක්‍රමවේදයක් අනිවාර්යෙන් තියෙන්න ඕන. රාජ්‍ය සේවකයන්ට අතිකාල ගෙවීමට විරුද්ධව මම කිසිම වෙලාවක අකුල් හෙළන්නේ නැහැ. නමුත් අපි යම් වැඩ කොටසක් කරන විට, ඒ වැඩ කොටසට යම් වැඩ එකක ප්‍රමාණයක් නැත්නම්, යම් ප්‍රමාණයක් අපි ගණනය කළ යුතුයි. මොකද අපේ ප්‍රාදේශීය සභාව ඉතා අඩු ආදායම් ප්‍රමාණයක් ලැබෙන ඉතාම දුප්පත් ප්‍රාදේශීය සභාවක්. ඒ නිසා අපි ගරු සභාපතිතුමා, මන්ත්‍රී මණ්ඩලය ඇතුළු නිලධාරි මණ්ඩලය කල්පනා කරන්න ඕන. අපි රජයට, ප්‍රදේශයට යම් සේවයක් කරනවා වගේම, මහජනයා වෙනුවෙනුත් යම්කිසි දෙයක් කරන්න අපේ සිත් තුළ තියෙන්න ඕන. ප්‍රාදේශීය සභාවල සේවය කරන නිලධාරීන්ට හොඳ පුණ්‍ය කර්මයක් කර ගැනීමේ අවස්ථාවන් වැඩියෙන් උදාවෙලා තියෙනවා. නමුත් පසුගිය අවුරුද්ද තුළ එය දකින්න ලැබුණේ නැහැ. ඒ නිසා ඒ පිළිබඳ බලවත් කණගාටුව ප්‍රකාශ කරනවා. අපිත් ඒකට වගකිව යුතුයි. අපෙනුත් මේ කටයුතු සඳහා යම් පැහැර හැරීමක් සිදු වෙන්න ඇතැයි කියා මා විශ්වාස කරනවා. ඉදිරි අවුරුදු 3 ක කාලයේදී පක්ෂ පාට භේදයකින් තොරව, අධිෂ්ඨානයකින් යුතුව යම් වැඩපිළිවෙළක් හදාගෙන කටයුතු කරමු කියා මා ආරාධනා කරනවා.

ඉනෝකා මන්ත්‍රීතුමිය ප්‍රකාශ කළා වගේ, පාරේ නඩුව සම්බන්ධයෙන් කතා කරනවා නම්, දැනට අවුරුදු හතක් තිස්සේ මම නඩුවට යනව.ඔහු ප්‍රාදේශීය සභාවෙන් ඉල්ලන්නේ කාරණා දෙකයි. එකක් මාර්ගයේ කොන්ක්‍රීට් ටික ඉවත් කරලා වැට ගහන්න කියන ඉල්ලීමත්, අනික කොන්ක්‍රීට් කරපු වෙනුවට ලක්ෂ 10ක වන්දියක් සභාවෙන් ඉල්ලන්නේ. ඇත්තටම උඩවැලිවිටිය ග්‍රාම නිලධාරී වසමේ ඉන්න ජනතාව ගැන මම කනගාටු වෙනවා. ඒ වගේම අපි ස්තුතිවන්ත වෙනවා නිශාන්ත මුතුහෙට්ටිගම ගරු නියෝජ්‍ය අමාත්‍යවරයා සභාපති වෙලා ඉන්න කාලේ එනම් දෙදාහ වර්ෂයේදී දී තමයි පාර කැපුවේ. ඊටපස්සෙ අපි 85% ක් විතර කොන්ක්‍රීට් කළා. ඊට පස්සේ ඉනෝකා මන්ත්‍රිතුමිය ඒ කාල පරිච්ඡේදය තුළ වගකිව යුතු ප්‍රමාණයකින් ඒ පාර සංවර්ධනය කරලා තියෙනවා. ඉතින් මම කිහිප අවස්ථාවකදිම ඔබතුමියලගෙ කීම අනුව එතුමා හමුවෙන්න ගියත්, එතුමා යම් වෙලාවල් වල මාව මග ඇරලා තියෙනවා. මම මේ සඳහා වියදම් කරල තියෙන්නෙ. ඉස්සරහටත් අමාරුවෙන් හරි මම ඒක කරනවා. නමුත් ඔබතුමිය ඇතුළු ගමේ සියලු දෙනා එකතුවෙලා ඔහුත් සමඟ සාකච්ඡා කරන්න. මොකද මේක ගමේ පොදු කටයුත්තක්. එම මාර්ගය මම මීට කලිනුත් ගරු සභාපතිතුමාට සඳහන් කරමින් සිටියේ සින්නක්කර ඉඩම් වලින් තමයි හැමෝම දීල තියෙන්නෙ. ඒ වගේම ඔය පාර අපට කිසි අයිතිවාසිකමක් නැහැ. මිනිස්සු ඒ පාර පිට කරගෙන තියෙන්නේ. අපට ඕන ප්‍රමාණය j.c.b. එකෙන් කපලා තමයි අපි ඒ ප්‍රමාණය වෙන් කරගෙන තියෙන්නේ. එනිසා ඔබතුමිය සඳහන් කරපු අනවසර ඉදි කිරීමට අපට කළ හැකි කිසිම දෙයක් නැහැ. ප්‍රාදේශීය සභාව මේ පාර පවර ගෙනත් නැහැ. ඒ වගේම මේ ප්‍රාදේශීය සභාව j.c.b. එකෙන්

අපි කපපු ටික ඇරෙන්න ඊට එහා ගිය දෙයක් අපි සභාව තුළින් අනුමත කරගෙන මොකක් හරි වැඩ පිලිවෙලක් කරලා ඕන අපි යම් වැඩපිළිවෙලකට එතනට ක්‍රියාත්මක වෙන්න ඕන. ඒ පිළිබඳවත් මේ වෙලාවේ මම සඳහන් කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි,මම මුළු සභාවෙම අවධානය යොමු කරනවා. උඩවැලිවිටිය ප්‍රදේශයේ මේ වන විට ඉඩම් මැනීම් කටයුතු සිදුවෙනවා. විශේෂයෙන්ම, ඉඩම් මැනීම් කටයුතු වලදී අපේ සභාවට බලපාන විශේෂ කාරණයක් තමයි. මාර්ග වෙන්කිරීම. එම පාරවල් වෙන් කිරීමේදී, එක් ස්ථානයකින්, උදාහරණයකට පටන්ගැන්මේදී අඩි විස්සක් දාලා තිබුනොතින්, අවසන් වෙන්නේ අඩි 10 කින්. අන්න ඒ වගේ ලොකු ගැටළු සහගත තත්වයක් මතුවෙලා තියෙනවා. ඒ සම්බන්ධව මට නිරන්තරයෙන් ගොඩක් පැමිණිලි ලැබෙනවා. ඒ වගේම අද එන්.වී. ආරියදාස මහතා විසින් ගරු සභාපතිතුමාට පැමිණිල්ලක් ඉදිරිපත් කළා. එතුමගේ ඉඩම මැනලා ඉවර වුණාට පසු, නැවත වතාවක් කාගේ හරි බලහත්කාරකමට අඩි 18 ක වෙන්කරපු පාර නොසලකා, නැවත එම මහතාගේ වැසිකිලිය කඩාගෙන යන විදියට පාරක් නම් කරලා තියෙනවා. මම හිතන්නේ මේ පාරවල් නම් කිරීමේදී ප්‍රාදේශීය සභාවට තමයි බලය පැවරෙන්නේ. එනිසා මේ සම්බන්ධ විශේෂ මැදිහත්වීමක් කරන්න කියලා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒ වගේම මට තවත් එක ඉල්ලීමක් කරන්න තියෙනවා. හැබැයි ඒක ද්වේෂ සහගත ලෙස ඉල්ලන ඉල්ලීමක් නෙවෙයි. ඒ මැනුම් කටයුතු සිදුකරන මිනින්දෝරු මහතා ඉතාමත් හොඳ මිනින්දෝරු මහතෙක් පක්ෂග්‍රාහීව කටයුතු කරන පුද්ගලයෙක් නෙවෙයි. නමුත් ඒ ප්‍රදේශයේ ඔහුට ඥාතීත්වය තියෙන පිරිස වැඩියි. මැනීම් කටයුතු සිදු කරද්දී ඒ මහතා ඉතා අපහසුතාවයට පත් වෙලා තියෙනවා. ඒ මහතා ඉතා හොඳ කෙනෙක් වුවත්, වෙනත් බලපෑම් නිසා යම් අසාධාරණයක් සිදුවෙනවා නම්, ඒක නැති කිරිම සඳහා අපේ ගරු ඇමතිතුමාට සඳහන් කරලා හරි යම් පියවරක් ගන්න. මේ මැනීම් කටයුතු සිදු වුණාට පසු ආපහු වෙනස් කරන්න බැහැ. එහිදී අසරණ තත්ත්වයට පත් වන්නේ මිනිසුන්. ඒ නිසා මේ සඳහා විශේෂ වැඩපිළිවෙළක් සිදු කරන්න කියලා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම ආරියදාස මහතාගේ ප්‍රශ්නය සම්බන්ධයෙන්, එම වැසිකිලිය බේරාගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම්තුමිය සමඟ සාකච්ඡා කරලා මේ කටයුත්තට යම් මැදිහත්වීමක් කරන්න කියන ඉල්ලීම මම ගරු සභාපතිතුමාට ඉදිරිපත් කරනවා.

එමෙන්ම මේ ප්‍රාදේශීය සභාවේ, ප්‍රාදේශීය සභා වාරය තුළ දී මන්ත්‍රීවරු වගේම, සභාවේ ඇතිවන කටයුතුවලදී, ඒ කටයුතු සම්බන්ධයෙන් පසු විපරමක් කරලා ඒ සඳහා යම් උත්තරයක් සොයලා මොනවහරි කටයුත්තක් කරන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද යම් සභාවාරයක ප්‍රකාශ වුන දේවල් එම මන්ත්‍රීතුමා හෝ මන්ත්‍රීතුමිය විසින් නැවත නැවත ඉදිරිපත් වෙන්නේ ඒ වගේ පසුවිපරමක් නැති නිසා. අපට දක්ෂ කාර්ය මණ්ඩලයක් ඉන්නවා. ඒ අය හරි සම්බන්ධකරගෙන පසුවිපරම් කමිටුවක් ඇතිකර, මේ සභාවේ කථා වුන දේවල් වලට ලබන සභාවට කලින් උත්තරයක් හොයන්න කටයුතු කරන්න කියලා ගෞරවනීය ඉල්ලීම කරනවා.

ඒ වගේම උඩවැලිවිටිය මාර්ගය තණ කොළවලින් වැසී ගෙන ගිහින් තියෙනවා. ඒ සඳහා මැෂින් කිහිපයක් අපට ලබාදෙන්න. අපි ස්වේච්ඡා සංවිධාන කිහිපයක් හරි යොදාගෙන ඒ කටයුත්ත කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා ඔබතුමාගේ සහය, ශක්තිය ලබා දෙන්න කියලා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, පොඩි ස්තූතියක් කිරීමක් වගේම යෝජනාවක් තියෙනවා. උඩවැලිවිටිය බටහිර ප්‍රදේශයේ පළාත් සභාවෙන් ලබා දුන් පානීය ජල යෝජනා ක්‍රමයෙ ළිඳ අවුරුදු 12 කින් විතර ඉහලා තිබුනෙ නැහැ. ඒක විශාල ළිඳක්. මම ගරු සභාපතිතුමාට මේ වෙලාවෙ ඔබතුමාටත්, ඒ ළිඳ ඉහින්න සම්බන්ධ වුනු කාර්ය මණ්ඩලයටත් විශේෂයෙන් ස්තූතිවන්ත වෙනවා. නියාගම ප්‍රාදේශීය ලේකම්

කාර්යාලයෙන් පවා වතුර මෝටර් ගෙනැල්ලා ඔබතුමාගේ කාර්ය මණ්ඩලය ගිහිල්ලා, ඉතාම උනන්දුවෙන් ඒ කටයුත්ත කළා. මේ ළිඳේ වතුර බොන්න පවා එපාය කියලා තිබුනෙ. ඒ පිළිබඳව මම ඔබතුමාට හා කාර්ය මණ්ඩලයට ස්තුතිවන්ත වෙනවා. ඒත් එක්කම උඩවැලිවිටිය අපේ චන්ද්‍ර සහබන්දු සභාපතිතුමා ඉන්න කාලෙ ආරම්භ කල ජල යෝජනා ක්‍රමයේ බට ටික කපලා එක එක්කෙනා පැති පැතිවලට ජලය අරගෙන . දැන් ප්‍රධාන ටැංකියට ජලය එන්නෙ නැහැ. මම ඉල්ලීමක් කරනවා. කාර්මික නිලධාරියෙක් යොදවලා අවශ්‍ය ඇස්තමේන්තුවක් සකස්කර දෙන ලෙස. පළාත් සභාවෙ සම්පත් අතුකෝරල ගරු මන්ත්‍රීතුමා ඒ සඳහා ප්‍රතිපාදන ලබා දෙන්නම් කියලා ඉක්මණින් ඇස්තමේන්තුවක් සකස් කර දෙන ලෙස ඉල්ලා සිටියා. ඒ සඳහා කාර්මික නිලධාරී මහත්මයෙක් යොදවලා ඒ කටයුත්ත කර දෙන්න කියලා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම ඊයේ මධ්‍යම රාත්‍රියේ ඉඳලා තෙල් මිල සූත්‍රයට අනුව වැඩිවෙලා තියෙනවා. ඒ ගැන අපේ කනගාටුව පළ කරනවා. ඒ නිසා ආර්ථික අපහසුතාවලට ලක් වෙලා තියෙනවා. අපේ රට කෘෂිකාර්මික රටක්. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගියාම ඇඟේ හැප්පෙන ගානට නිලධාරීන් සිටියත්, ගමට ගිහිල්ලා කෘෂිකර්මාන්තය, වැවිලි කර්මාන්තය වර්ධනය කරන්න කිසි නිලධාරියෙක් ඉදිරිපත් වෙන්නේ නැහැ. වගා කරන්න පුළුවන් ඉඩම්වල කැලේ වැවිලා. ඒ නිසා මේ ප්‍රාදේශීය මට්ටමින් ඉන්න නිලධාරීන් දැනුවත් කර මොකක් හෝ වැඩපිළිවෙළක් කරන්නට රජයට අවධානය යොමුවේවායි කියලා මේ වෙලාවේ සිහිපත් කරමින්, සියලු දෙනාට සුබ අනාගතයක් පතමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා.**

ගරු සභාපතිතුමනි, සභාවේ සියලු දෙනාගෙන් අවසරයි. ඉතාම කෙටියෙන් පුංචි ඉල්ලීමක්, දෙකක් කරන්න තමයි සූදානම් වෙන්නේ. පළමුවෙන්ම උඩුගම අලුත්වත්ත මංසන්ධියේ මගේ කොට්ඨාසයේ මීට පෙර පෙර පාසල පවත්වාගෙන ගිය ප්‍රජා ශාලා ගොඩනැගිල්ල දැනට භාවිතයක් නැති කම හේතුවෙන් අභාවයට යමින් පවතිනවා. අපි පහුගිය දවස්වල ගිහින් ඒ ගැන සොයා බැලුවා. වහලත් කොටසක් අභාවයට ගිහිල්ල තියෙන්නෙ. මේක මහා විශාල මුදලක් යන කාර්යයක් නෙවෙයි. විශාල මුදක් වැය කිරීමට සිදුවෙන්න පෙර පුංචි අලුත්වැඩියාවන් කිහිපයක් සිදු කරලා, එකී කටයුතු නිම කරලා දෙන්න කියලා ප්‍රදේශයේ බහුතරයක් මගෙන් ඉල්ලීමක් කළා. ඒ අනුව මම මේ වෙලාවේ ඒ පිළිබඳව සොයලා බලලා, අලුත්වැඩියාව සිදු කරලා දෙන්න කියන ඉල්ලීම සිදුකරනවා. ඒ සම්බන්ධව සභාවට යෝජනා කරනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අපි හැමෝම වසරක් ගෙවී යන වෙලාව සමරණ වෙලාවෙ අපේ මැතිවරණයට පෙර ගම් වල මිනිස්සුන්ගෙ ගොඩක් බලාපොරොත්තු තිබුණා. අපට මහා පරිමාණයෙන් වැඩ කරගන්න බැරි වුනාට, පුංචි පුංචි වැඩ, කරන්න පුළුවන් වැඩ නොකිරීම සහ වැඩ කරගන්නට නොහැකි වීම, අපොහොසත් වීම පිළිබඳ කනගාටුවක් තියෙනවා. ඒවගේම මම විශේෂයෙන් ඔබතුමාගෙන් දැනගන්න කැමතියි. මේ සභාවේ මීට පෙර කතා වුණා. පරිසර කමිටුවක් පිළිබඳව. ඉතින් ඒ පරිසර කමිටුවට, පළමු සභාවේදීම අපිව තෝරා පත් කර ගත්තා. ඊට පසු මම අවස්ථාවකදී, දෙකකදී ඔබතුමාගෙනුත්, ලේකම්තුමියගෙනුත් කමිටුව ගැන විමසීම සිදු කළා. මේ කමිටුව රැස් වෙනවද? රැස් කරන්නේ කවුද? කොහොමද මේකෙ වගකීම් මොනවද? කියලා නමුත් අවුරුද්දක් ඉක්ම ගිහිල්ලා පරිසරය පිළිබඳ නියම අවබෝධයක් ලබාගැනීමේ හැකියාව අඩුම තරමේ පරිසර කමිටුවේ ඉන්න අපට වත් නැහැ. එහෙනම් ඒ සඳහා මොනව හරි විදිහකට මේ කාරණා සංශෝධනය වෙන්න ඕන. ඒ වගේම මට මතක නැහැ. පරිසර කමිටුවට ඉන්නේ කවුද කියලා. පරිසර කමිටුව රැස්වෙලා යම් යම් තීන්දු තීරණ ගත්ත කිව්වහම, අපට පුංචි ගැටළුවකුත් මතු වෙනවා. මොකද අපි පරිසර කමිටුවෙ ඉන්න නිසා. ඒ නිසා එක්කෝ ඒ නම වෙනස් කරන්න. පරිසර කමිටුව

මෙතන මන්ත්‍රීවරුන් ඉන්න එක නම් එහෙම නමක් දාන්න. නැත්නම් සම්පූර්ණ වගකීම යන්නේ අපට. මම ඒ යෝජනාව කරන ගමන්ම, පරිසරය පිළිබඳව දැනුවත් වීම අපට අවශ්‍යයි. ඒවට ගන්න පියවර පිළිබඳ ගැටලු අපි සාකච්ඡා කළ යුතුයි. නමුත් වසරක කාලයක් තුළ එහෙම කිසි ගැටලුවක් අපේ කමිටුවෙ සාකච්ඡා කරල නැහැ. එකවරක්වත් කමිටුව කැඳවලත් නැහැ. ඒ නිසා පරිසර කමිටුවේ සාමාජිකයෙක් හැටියට මම අද දවසේ කනගාටුවට පත් වෙනවා. ඒවගේම ඔබතුමා ඒ පිළිබඳ සොයා බලා තීන්දුවක් ගන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම මට මතකයි මම සභාවට ආපු දෙවන මහා සභා වාරෙදි ගරු සභාපතිතුමාගෙන් පුංචි ඉල්ලීමක් කළා. උඩුගම දකුන අලුත් වත්ත ප්‍රදේශයේ මීට පෙර කුණු එකතු කරන්න වාහනයක් ගියා. මොකක් හරි ගැටලුවක් හේතුවෙන්, එක තාවකාලිකව නතර වෙලා තිබුණා. හැබැයි මම ඉල්ලීමක් කළා ඒ පිළිබඳ මොකක් හරි පියවරක් අරගෙන නැවත වරක් ඒ ප්‍රදේශයේ කුණු ගන්න කියලා. මොකද ඒ ප්‍රදේශවාසීන් මගෙන් කිහිප අවස්ථාවකදිම ඒ පිළිබඳ ඉල්ලා සිටියා. මම ඒ පිළිබඳව අවස්ථා කිහිපයකදී විමසූ විට, ඒ පිළිබඳ සැකැස්මක් සැලසුමක් සකස් කරනවයි කියලා කිව්වා. ඉතින් මම කනගාටු වෙනවා. අවුරුද්දක් ගිහිල්ලත්, තවම සැලැස්ම හදලා නැතුව ක්‍රියාවට නංවන්න බැරි වුන එක ගැන. මේ වගේ පුංචි දෙයක් වත් කරගන්න බැරිව, අපි ඒ ප්‍රදේශයන්ට ගියහම ලොකු අපහසුතාවයන්ට පත්වෙනවා.

ඒ එක්කම පසුගිය වැසි සමයේ අපේ ප්‍රදේශවල සමහර මාර්ගවල පස් කණ්ඩි ආපු අවස්ථාවේදී අපට ඒවා ඉවත් කරලා දෙන්න කියලා ඉල්ලීමක් කළා. නමුත් එය ඉටු වුණේ නැහැ. මේ වෙලාවේ මම පුංචි ඉල්ලීමක් කරනවා. උඩුගම නැගෙනහිර බංගම මාර්ගයේ ඉතාම භයානක අනතුරු වෙන්න පුළුවන් මට්ටමේ අවස්ථා කිහිපයක් තියෙනවා. කණ්ඩිය ඇවිල්ලා පාර අවහිර වෙලා. ඒ නිසා දැන් අපට සභාවේ මුදලින් ඒක කරන්න බැරිනම්, ඔබතුමා සභාව හැටියට මාර්ග සංවර්ධන අධිකාරියෙන් හරි ඉල්ලීමක් කරලා, ඒ පස් කණ්ඩි ටික ඉවත් කරලා කරලා දෙන්න කියන ඉල්ලීම මම මේ අවස්ථාවේ සිදු කරනවා.

ඒ එක්කම මං හිතනවා අපේ වෙරංග මහත්මයා, සමන් මහත්තයාටත් අමතක වෙන එකක් නැහැ. මට ප්‍රායෝගිකවත් අත්විඳින්න සිදු වන කාරණයක්. අපේ මේ මන්ත්‍රීතුමිය සිහි කලා වගේ උඩුගම හෝමදොල මංසන්ධිය පිළිබඳව පුංචි ගැටලුවක් තියෙනවා. එතන උදේට මහ විශාල පිරිසක් රුස් වෙනවා. ඔය අතරේ මමත් ඉන්නවා. උදේ 4.30, 5.00 විතර වෙනකොට එතන ඉතාමත් කළුවරයි. අපේ සභාවේ පොල පවතින ස්ථානයත් එතන. උදේ 4.30, 5.00 වෙනකොට උඩුගම පොලිස් ස්ථානයේ නිලධාරීන් දරුවෝ එක්කරගෙන හැමදාම එන දෙමව්පියෝ පරීක්ෂාකරන මට්ටමට තමයි පත්වෙලා තියෙන්නේ. එතන සහ ඒ වගේම පොලොන්නරුව කඩේ ඉස්සරහ පාලම ලඟට මම හිතනවා අනිවාර්යෙන් ලයිට් දෙකක් සවිකරලා, ඒ ස්ථාන ආලෝකමත් කළ යුතුයි. එතන විශාල පිරිසක් ගැවසෙනවා. ඒ ගැන මම ප්‍රායෝගික දන්න නිසා තමයි කියන්නේ. එතන ඉන්න සමහර දෙමව්පියන් අපි ගැන සඳහන් කරනවා. ඒක අපට පොඩි ගැටලුවක්. මේ දෙන්නගෙම කොට්ඨාසෙට අයිති නිසා, මම හිතනවා. එහෙම සිහිපත් කළාට කමක් නැහැ. ඔබතුමාගේ අවධානය ඒ පිළිබඳව යොමු කරල එක ඉටුකර ගන්නට කටයුතු කරාවි කියන සිහිපත් කිරීම මේ වෙලාවේ කරන ගමන්, ඔය කාරණා කීපය පිළිබඳව ඔබතුමාගේ කාරුණික අවධානය නැවත නැවත යොමු කරන්න කියලා සිහිපත් කරනවා.

ඒ වගේම තව පුංචි කාරණයක් සිහිපත් කරන්න තියෙනවා. අපේ පාසලේ පැවති ක්‍රීඩා උත්සවයට මම සියලු මන්ත්‍රීවරුන්ට ආරාධනා කළේ නැහැ. උඩුගම ප්‍රදේශයේ ඉන්න අපේ මන්ත්‍රීවරුන්ට ආරාධනා කළා. සභාපතිතුමාත් සම්බන්ධ වුණා. මට දැන් අපේ ගනේවත්ත මන්ත්‍රීතුමා ෆේස් බුක් එකේ ගිය කාරණයක් පිළිබඳ පෙන්නුවා. මොකද මගේ විද්‍යාලය පුංචි විද්‍යාලයක්. අපට ක්‍රීඩා

පහසුකම් අඩුයි. උපකරණ අඩුයි. අපේ විද්‍යාලයේ ක්‍රීඩා උත්සවයේදී හෙල්ල වෙනුවට ගිනිසීරිය පොල්ලක් විසිකරලා තියෙනවා. දැන් මේක හැමතැනම කතා වෙන කාරණයක්. සියලු පාසල් වලට සම අවස්ථා දෙනවා. හොඳ පිහිනුම් තටාක විවෘත කරලා, තව ලක්ෂ 25ක් 50 ක චෙක් එකක් දීලා යන්නේ. ඒ විෂමතාවය මම දන්නේ නැහැ. මොන හේතුවක් නිසා, මොන රජය පැවතියත්, හැමතැනම විෂමතාවය තියෙනවා. අඩුපාඩුව මගේ විද්‍යාලයේ විතරක් නෙවෙයි. හැම තැනම තියෙනවා. එවැනි අඩුපාඩු අවස්ථාවකදී අසල්වැසි පාසල්වලින් අපි ඒ උපකරණ හුවමාරු කර ගන්නවා. නමුත් අපට අර උස පනින මෙට්ටය සහ හෙල්ලය කියන උපකරණය දෙන්න කැමැති නැහැ. තැනකින් තැනකට ඒවා ගෙනියපුවම ගැටළුවක් වෙන නිසා මම කිව්වා ඒ ඉසව්ව ඉවත් කරන්න කියලා. නමුත් මමත් නොදැනුවත්ව ක්‍රීඩා භාර ගුරු මහත්වරුන් ඒක සිදු කරල තිබුණා. ඒකෙ අවසානයේ පුංචි විස්තරයක් දාලා තිබුණා. මමත් ඒක බැලුවා. ඒකෙ දේශපාලඥයින්ට තමයි දොස් කියලා තිබුනෙ. මැතිවරණය පිළිබඳව, චන්ද කාලේ පිළිබඳව, පොදුවේ සියලු දේශපාලඥයින්ට දොස් කියලා, අවසානයේ සඳහන් කරලා තිබුනා මේ විද්‍යාලයේ විදුහල්පතිතුමත්, නාගොඩ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් කියන කාර.ණය ඉතින් ඒකෙදි ජනතාව දන්නේ නැහැ. ඔබට, අපට ඒකට ගන්න යම් පියවරක් නැති විත්තිය. මම ඒක සිහිපත් කළේ. ඒ ඒ සැබෑ තත්ත්වය අවබෝධ කරගන්න. අඩුපාඩුකම් තියන විද්‍යාලවල ශක්තිය තියෙන්නේ විදුහල්පතිවරයා තමන්ගේ පෞද්ගලික ශක්තියෙන් තමයි ඒවා දිගට කරගෙන යන්නෙ. ඉතින් ඒ නිසා ඒ කාරණය මම මේ වෙලාවේ සිහිපත් කරනවා. ඔබට අපට එවැනි දේවල් වලදී කල හැකි කාරණයක් නැහැ. අපි මේවා දැනුවත් කරලා තියෙන්නෙ. අදාල සම්පත් ලැබීමේ තියෙන ක්‍රමානුකූල තත්ත්වයක් නැති සහ විෂමතාවය පිළිබඳ ගැටළුවක් තිබෙනවා කියන කාරණයත් සිහිපත් කරනවා.

ඒ වගේම ඊයේ දවසේ මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමා එතුමගේ ලේකම්තුමා එවලා හෙල්ල දෙකක් සහ අවශ්‍ය ක්‍රීඩා උපකරණ කිහිපයක් ලබා දුන්නා. ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කිරීම පිළිබඳව එතුමන්ට මම විශේෂයෙන්ම දරුවන් වෙනුවෙන්, විද්‍යාලය වෙනුවෙන් කෘතවේදීත්වය හිමි කරනවා. ඒ වගේම ෆේස්බුක් දාලා අවධානය යොමු කරවීම පිළිබඳ වත් ස්තුතිය පිරිනමනවා. විශේෂයෙන්ම ඉතිරි අඩුපාඩු ටිකත් සම්පූර්ණ කරලා දෙන්න මගෙන් තියෙන අඩුපාඩු ලේඛනයක් ඉල්ලුවා. අපි ඉදිරියේදී සකස් කරලා යවනවා. ඒ පිළිබඳව එතුමාට නැවතත් ස්තූතිවන්ත වෙනවා. සියලු දෙනාට තෙරුවන් සරණ ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

### ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා.

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. ඒ වගේම අපේ නිලධාරි දෙපළ, මාධ්‍යවේදීතුමන් ඇතුළු සෑම දෙනාගෙන්ම අවසරයි. මටනම් ඉතින් මොකුත්ම කතා කරන්න දෙයක් නැහැ. මොකද මේ පහුගිය සමරපු නිදහස අපි නෙමෙයි සමරන්න ඕන. මට හිතෙන්නේ එය සමරන්න ඕන සුද්දා කියලා. ඒ වගේ කතා තමයි මෙතන කියන්න වෙන්නේ. මොකද සුද්දා අපෙන් නිදහස් වෙලා ගිහිල්ලා වසර හැත්ත එකක් වෙනවා. අපි අමාරුවේ වැටිලා වගේ මටනම් පේන්නෙ. මේ වෙලාවේ ඒක කියන්නත් අවශ්‍ය වෙන්නේ නැහැ. උදේ පාන්දරම කේක් කැල්ලක් දීල අපිව පිනවල අපේ ධනංජය මල්ලිගේ අවුරුදු 30 උපන් දිනය සැමරුවා. මේ අවුරුද්ද ඇතුලත එතුමාගේ ඉදිරි වැඩ කටයුතු සාර්ථක වේවා කියලා ප්‍රාර්ථනා කරමින්, මට මෙම ස්ථානයෙන් බැහැරවීමට අවසර ලබා දෙන්න. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා.**

ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. අපේ මාධ්‍යවේදීතුමා ඇතුළු සභාවේ කාර්ය මණ්ඩලයෙන් අවසරයි. මම මුලින්ම මේ වෙලාවේ ස්තුතිවන්ත වෙනවා. පසුගිය මස 25 වැනිදා මගේ නිවසේ මගේ දියණියගේ පොඩි උත්සවයක් තිබුණා. ඒ වෙනුවෙන් සහභාගී වුනු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාට ස්තුතිවන්ත වෙනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, දෙවැනි කාරණය හැටියට මම සඳහන් කරනවා. මුලන ආනන්දාරාම විහාරස්ථානයේ අත්‍යවශ්‍යම කටයුත්තක් ඉෂ්ට වෙනවා. ඒ විහාරස්ථානයෙහි මුල ඉඳලම චෛත්‍යරාජයාණන් වහන්සේ නමක් සිටියේ නැහැ. ඉතින් අපට ඒ අවස්ථාව ලබා ගන්න හැකි වුණා. චෛත්‍යරාජයාණන් වහන්සේට මුල්ගල් තැබීමේ උත්සවය දාහතර වෙනිදා උදේ 8ට විහාරස්ථානයේ පැවැත්වෙනවා. ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීතුමන්ලාට, මන්ත්‍රීතුමියන්ලාට ආරාධනා පත්‍ර රාජ්‍ය මට්ටමෙන් ලබාදුන්නා. ඒ සඳහා සියලුම දෙනාට මම සහභාගි වෙන්න කියලා ඉතාමත් ගෞරවයෙන් ආරාධනා කරනවා. ඒ වගේම ගරු සභාපතිතුමා උත්සව සංවිධානයේදී සංවිධාන කමිටුවට මුල ඉඳලම සහභාගි වුණා. ඒ වගේම ප්‍රාදේශීය සභාව හැටියට කෙරෙන්න ඕන ඒ සියලු සහයෝගයන් සභාවේ මැදිහත්වීමෙන්, ඒ කටයුතු දැනට ඉටු වෙමින් පවතිනවා. ඉදිරියටත් ඉෂ්ට සිද්ධ කරන්න තියෙනවා. මම නැවතත් සභාපතිතුමාට ඉල්ලීමක් කරනවා. මටත් වැඩිය එතුමගේ දායකත්වය මේ විහාරස්ථානයට තියෙනවා. ඉදිරියේදී ඒ ප්‍රවාහන කටයුතුවලදී හෙට දිනයෙ දෙන්න පුළුවන් උපරිම සහයෝගය දෙන්න. මොකද ඒ ප්‍රදේශයේ යාන වාහන තියෙන අය බොහොම අඩුයි. ලක්ෂ 35ක පමණ විශාල වියදමක් දරමින්, ගමේ දායකයන්ට බරක් නොවී, එක්සත් ජාතික පක්ෂ නියෝජ්‍ය නායක, නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය, සජිත් ප්‍රේමදාස මැතිතුමන් ගේ දායකත්වයෙන්, ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමන්ගේ, විශේෂ ඉල්ලීමක් පරිදි සිදු වෙනවා. නාගොඩ ප්‍රාදේශීය සභාව, නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, නාගොඩ පොලිසිය ඇතුළු සියලුම දෙනා එකතු වෙලා මේ කටයුතු සිදු කරන්න සහයෝගය දෙනවා. සියලු දෙනාට සම්බන්ධ වෙන්න කියලා නැවත වාරයක් මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මෙතනදි කතා වුනා මාපලගම මංසන්ධියේ වෙළෙඳ සංකීර්ණයේ තිබෙන වැසිකිළි පද්ධතිය නැවත ජනතාවට විවෘත කරන්න. අපේ පියල් හිරිමුතුගොඩ මන්ත්‍රීතුමා ඇතුළු අය, ඒක දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රශ්නගත වැඩක්. ඇත්තටම ඕක පොදු වැසිකිලියක් නෙවෙයි. පොදු වැසිකිළියක් ඉදි කරන්න අපට පහුගිය දවස්වල යෝජනා ආවත්, විවිධ විරෝධතා මැද එය මගහැරී ගියා. මෙම ස්ථානයේ කොහොම හරි මේ අවුරුද්දේ අපි පොදු වැසිකිළි පද්ධතිය ආරම්භ කරන්න කටයුතු කළ යුතුයි. සභාපතිතුමනි, මොනවහරි කරල විවිධ බාධා තිබුණත් ඒක අත්‍යවශ්‍ය කටයුත්තක්. මේ වෙලාවේ අපි දැඩි සේ විරුද්ධ වෙනවා. ඒ වෙළෙඳ සංකීර්ණයට තියෙන වැසිකිළි පද්ධතිය පොදුවේ විවෘත කිරීම සම්බන්ධව. ඒ වෙළඳ සංකීර්ණයේ ව්‍යාපාරිකයින්ට තමයි එය සකස් කරලා තියෙන්නේ. ඒ අයට විවෘත කරලා තියන්න. පොදුවේ විවෘත කළොත්, නැවත වාරයක් ගැටළුවක් ඇති වෙයි. මොකද නැත්නම් අර පිටිපස්ස පැත්තෙන් උළුවස්සක් දාලා හදන්න බැරි ය කියන එක බොරු. එහෙම කවුළුවක් දාන්නත් පුළුවන්. එතකොට කිසි ගැටලුවක් නැහැ. එහෙම හරි කරලා, මේක අද ඊයේ ඇති වූ ප්‍රශ්නයක් නෙවෙයි. දීර්ඝ කාලයක් තිස්සේ එන ගැටලුවක්. නැවත ඒක ආරම්භ කරලා, හරියට භාවිතා නොකරන නිසා තමයි ප්‍රශ්න වැඩිහරියක් ඇති වෙන්නේ. ඒ කටයුත්ත එහෙම සිද්ධ කරන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද නැත්නම් අපටත් මැදිහත් වෙන්න සිදුවෙනවා. ඕක නැවත වාරයක් විවෘත කරලා, ඒවායින් එන ප්‍රශ්ණ ප්‍රදේශයේ ජනතාවගෙන් එනකොට අපටත් කතා නොකර ඉන්න බැරි වෙනවා. ඒ ගැන මම වෙන මොකුත් කියන්නේ නැහැ.

ඒ වගේම මුලන වාඩිය කන්ද පාර මම ගිය සභා වාරයෙදි වගේම සභා කීපයකදිම කතා කළා. ඒ මාර්ගයේ බෝක්කු දෙකක් අබලන් වෙලා තියෙනවා. දැනට කොන්ක්‍රීට් එකත් පුපුරලා තියෙනවා. ඒ මාර්ගයේ ගමන් කරනකොට ඔබතුමා දන්නවත් ඇති. ඔබතුමාගේ අවධානය යොමු කරලා ප්‍රාදේශීය සභාවේ මාර්ගයක් හැටියට පිළිසකර කළ යුතුයි. නැත්නම් පාර මීට වැඩිය අබලන් වෙනවා. මොකද විශාල බර වාහන මාර්ගයේ ගමන් කරනවා. ඉතින් ඉතිරිටිකත් කැඩිලා අබලන් වෙන්න පුළුවන්.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මාපලගම මංසන්ධියේ බුදුමැදුරක් ඉදි කරන්න වෙළඳ ප්‍රජාවේ අයගේ සාකච්ඡාවක් තියෙනවා. ඔබතුමා හමුවෙන්නත් ඇවිල්ලා ගිහිල්ලා තියෙනවා. ඒ ගැන අපටත් සිහිපත් කළා. අපි උපරිම සහයෝගය දෙන්නම් කියලා කිව්වා. ඒක අත්‍යවශ්‍ය කටයුත්තක්. මොකද මාපලගම නගරය කියන්නේ පහුගිය කාලයක් තිස්සේ යම් යම් කතාබහට ලක්වෙච්ච නගරයක්. අද බොහොම හොඳ සන්සුන් නගරයක් හැටියට ඉදිරියට යනවා. ඒ වගේ නගරයක මේ වගේ බුදුමැදුරක් හදලා ප්‍රදේශයේ වෙළඳ ප්‍රජාවටත් වතාවත් කරන්න පුළුවන්. මොකද මම දන්නවා. මේ වෙනකොට නාගොඩ මංසන්දිය තියෙන බුදුමැදුරෙ වතාවත් කරන වෙළඳ ප්‍රජාව ඉන්නවා. ඒ වගේම අපටත් මාපලගම මංසන්ධියෙත් ඒවගේ බුදුමැදුරක් හදලා වතාවත් කරන්න අවකාශය ලැබුණොත් හොඳයි කියලා හිතනවා. සභාව හැටියට පූර්ණ දායකත්වය ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වගේම මාපලගම ආරියදාස ගොඩගම මැතිතුමන් නියෝජනය කරන වැඩිහිටි සමිතියක් තියෙනවා. මේ ප්‍රදේශයේ වැඩිහිටි සමිති වල නාගොඩ කොට්ඨාශයේ සමිතිවල සභාපති වරයා හැටියට එතුමා කලක් කටයුතු කළා. දැන් එතුමා නියෝජනය කරන වැඩිහිටි සමිතියෙ සමිති ශාලාවක් හදලා තියෙනවා. සභාවට ඉල්ලීමක් කරල තියෙනවා. සමිති ශාලාවට අවහිර වන ආකාරයෙන් නැදුන් ගස් කිහිපයක් තියෙන බවත්, එතුමන් ඒ අය සමග කතා කරලා තියෙනවා. ඒක ඉවත්කර ගන්න කියලා ඉල්ලීම් කළා කිව්වට මම ඒ ගැන දන්නෙ නැහැ. සභාවට ලිපියනම් කියවුණේ නැහැ. එහෙම ඉල්ලීමක් කලොත්, ඒ සඳහා මැදිහත් වීමක් කරන්න. මොකද ගස් ගැන මෙතන මීට ඉහතදීත් කතා කළා. ඒ වගේ වැඩිහිටියන් යම් ඉල්ලීමක් කළොත්, ඒ සඳහා ප්‍රමුඛත්වය දීලා සභාව මැදිහත් වෙලා ඒ කටයුතු ඉටුකර දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම මාපලගම ජනිත් හෝටලය ඉදිරිපිට තියෙන අපේ විශාල පිරිසක් භාවිතා කරන ගිංගඟේ තොටුපළක් තියෙනවා. මේක ටික කාලයක් තිස්සේ ප්‍රතිසංස්කරණ කරලා දෙන්න කියන ඉල්ලීම කළා. මම සභාවට යෝජනාවක් දැම්මා. මේකට ලොකු මුදලක් යන්නේ නැහැ. රුපියල් 25000.00 ක් 30000.00 ක් පමණ මුදලක් වැයවේවි. විශාල පිරිසක් මේ තොටුපළ ප්‍රයෝජනයට ගන්නවා. ගම්වැසියන් විසින් සභාවේ දී මේ සම්බන්ධව ඉල්ලීමක් කරන්න කියලා කිව්වා. මේක ඉටු කළොත් ඒ ප්‍රදේශයේ ජනතාවට විශාල සහනයක් වෙනවා. එනිසා ඒ කටයුත්ත ඉටු කරල දෙන්න කියල සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මීට වැඩිය මම කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අවසාන වශයෙන් ඉල්ලා සිටින්නෙ අපේ ප්‍රදේශයේ ආනන්දාරාමය විහාරස්ථානයේ චෛත්‍යරාජයාණන් වහන්සේට මුල්ගල් තියන උත්සවයට ඔබතුමන් සියලු දෙනාගේ සහභාගිත්වය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා. ඔබ සියලු දෙනාට තෙරුවන් සරණයි.

**ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා.**

ගරු සභාපතිතුමනි, මම නැගී සිටියේ වෙනත් කරුණු යටතේ කතා කරන්න නෙවෙයි. මේ අවස්ථාවේ උඩලමත්ත ප්‍රදේශයේ මළගමක අවසාන කටයුතු සිදු කරන්න ප.ව. 2.30 ට සංවිධානය වෙලා තියෙනවා. ඒ කටයුතු සංවිධානය කරන්න භාර දීල තියෙන්නෙ මට. ඉතින් ඒ නිසා සභා රැස්වීම අවසන් වන තුරු ඉන්න බැරි වීම ගැන සමාව ඉල්ලනවා. මා හට බැහැර යාමට අවසර ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය.**

ගරු සභාපතිතුමන් ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. සභාපතිතුමනි, මම විශේෂයෙන්ම නැගී සිටියේ අද සභාවට ඉදිරිපත් වුණා. දුර්ගන්ධය නැති කරන ඔයිල් එකක් ගැන කඩිනමින් ඒක සුදුසු දෙයක් නම්, පරිසරයට හිතකර දෙයක් නම් ඇප්තොප් වත්තට ඒක ඉක්මනින්ම ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඊළඟට ඒ කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ ලොකු වියදම් යන දේවල් නෙවෙයි. පොඩි පොඩි අඩුපාඩු ගොඩක් තියෙනවා. එතන සේවකයෝ වැඩ කරන්නෙ ගොඩක්ම මානසික පීඩනයකින්. ඒ අය ගඳ උහුලාගෙන ඉන්නේ. ඊළඟට එයාල ඉල්ලන දේවල්, සබන් කැල්ල, ග්ලවුස් දෙකවත්, නියමිත පරිදි ලැබෙන්නේ නැහැ. ඒ එක්කම එතන කුණු එකතු කරන තැන වතුර පිරෙනවා. ඒකත් කොන්ක්‍රීට් ටිකක් දාලා ඉක්මනින් හදලා දෙන්න ඕන. මම ගිය සතියේ එතැනට ගියා. පෝර ගබඩා කරන්න කියලා අලුතෙන් ගොඩනැගිල්ලක් හැදුවා. නමුත් ඒකෙ එක පොර කොට්ටයක්වත් නැහැ. ඊළඟට හදපු පොහොර ටිකක් තියෙනවා. කිරන්න තරාදිය නැතිලු. දැන් මාස එකහමාරක් දෙකක් තිස්සේ එතන තරාදියක් නැහැ. අන්න ඒ වගේ අඩුපාඩු ටිකක් තියෙනවා. ඒ මනුස්සයා ගොඩක්ම පීඩනයකින් තමයි වැඩ කරන්නේ. මොකද කතාකරන්න කෙනෙක් නැහැ. පාරේ යන මනුස්සයෙක්වත් ගඳ නිසා එතන නවතින්නේ නැහැ. ඒ වගේම හීන් දැලක් ඉල්ලනවා. මම හිතන්නේ මේවා ලොකු වියදම් යන ඒවා නොවෙයි.

අපේ අර ආයුර්වේද මධ්‍යස්ථානයට පස් වගයකුයි, කොම්පෝස්ට් පොහොරයි ඉල්ලනවා. එයාලගේ පස සාරවත් නැහැයි කියලා. පැල හිටවන්න පස් ටිකක් ලබාදෙන්න පුළුවන්කමක් තියෙනවා නම් හොඳයි. ඒ කියන්නේ එතන බාරහන්දියේ ආයුර්වේද මධ්‍යස්ථානය ඇත්තටම ළස්සනයි. ඖෂධ පැළෑටි වගයක් ඉන්දන්න එයාලා පස් ඉල්ලන්නේ. ඒනිසා ඒ ගැන අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය.**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. ඒ වගේම ගරු සභික මහත්ම මහත්මීන්ගෙන්ද අවසරයි. ඇත්තටම අද අපේ කොට්ඨාසයේ තුන්දෙනාටම තිබුණේ එකම ප්‍රශ්නයක්. අපේ අර සණස ඉඩම මීට ඉස්සර වෙලා තරංග මන්ත්‍රීතුමා ඒකෙ තොරතුරක් ඉල්ලුවා. ඊට පස්සේ ගිය සමිතියෙදිද කොහෙද අපට මේ තියෙන නඩු ටික කිව්වා. ඇත්තටම සභාපතිතුමා, ඒ ඉඩමේ නඩුව යන බව කියනවා. ඒත් නඩුවේ මෙතෙක් කලකට වෙච්ච කිසිම තොරතුරක් මොකක්ද කියලා අපි දන්නෙ නැහැ. අපි තුන්දෙනාටම තියෙන ප්‍රශ්නයක් ඒක. එක කොට්ඨාශයේ ඉන්න නිසා අපේ අමර ධනංජය මන්ත්‍රීතුමාටත් මේ ප්‍රශ්නය තියෙනවා. ඉතින් මම ඉල්ලා සිටින්නේ සභාපතිතුමනි, සභාවෙන් නඩුවට ගියාට මේ වෙනකොට කුමක්ද වෙලා තියෙන්නෙ කියලා පැහැදිලි කිරීමක් කරනවා නම් හොඳයි. එතකොට අපට කියන්න පුළුවන් මේ නඩුවට ඉදිරිපත් වෙලා මේ වෙනකොට මෙන්න මේ දේ තමයි මෙතන සිදු වෙන්නේ කියන එක. ඒ නිසා ඒ නඩුවට මොකක්ද වෙලා තියෙන්නෙ කියලා දැනුවත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ වගේම ගයන්ති මන්ත්‍රීතුමිය කතා කළා වගේ, කොම්පෝස්ට් අංගනය අපට ආදායමක් ලැබෙන තැනක්. ඒ ස්ථානයට මමත් පහුගිය දවස්වල ගියා. පහුගිය දවස්වල පැවිල්ල තිබුණා. කොම්පෝස්ට් විශාල ප්‍රමාණයක් තිබුන වෙලිලා. ගොඩක්ම කොම්පෝස්ට් එතුමා හලලා ඉවර කරලා තිබුනා. එතුමාට නියමිත වෙලාවට බැග් ලැබිලා නැහැ. තරාදියක් නැහැ. කොම්පෝස්ට් නියමිත වෙලාවේදී වේලුනාට පස්සේ පැකට් කරගන්න ඕන. යන්තම් වර්ෂාව වැටුන ගමන් ඒවා තෙත් වෙනවා. එවිට ඒවා පැකට් කරගන්න බැරුව යනවා. ඉතිං අපට ඒ ආදායම අවශ්‍ය වෙලාවේදී ගන්න බැරි වෙනවා. එතනින් ලොකු ආදායමක් ගන්න පුළුවන්. මම මේ අවුරුද්දේ මුලදී ම යනකොට එහා පැත්තෙ තිබුණ කොම්පෝස්ට් ගොඩ වේලිල.ඒ ගොඩ එහෙමම තියෙනව. මම අපේ ගරු සභාපතිතුමාට කියන්නේ පොඩි අවධානයක් යොමු කරලා, තව සේවකයෙක් හරි

යොදවලා  හලලා ඉවරයක් කරලා, පැකට් කරලා, ගබඩා කරලා තිබුන නම් අද හොඳ ආදායමක් එතැනට එකතු වෙනවා. අවශ්‍ය වෙලාවෙදි අවශ්‍ය සේවකයෝ යොදවලා, කොම්පෝස්ට් අංගනයෙන් ලබා ගන්න පුළුවන් ආදායම ලබාගන්න පුලුවන් නම් හොඳයි කියන එක තමයි මම කියන්නේ. ඒ කියන්නේ කොම්පෝස්ට් තිබුනට අපට නියමිත වෙලාවේදී ගන්න බැරි එක තමයි දැන් තියෙන්නේ. වහිනකොට ඔක්කොම එකතු වෙලා, ගොඩගැහිලා, දැන් හලා ගන්න බැහැ. පැකට් කරන්න බැහැ. ඒක නිසා තමයි අර ගඳ එන්නේ. ඒවා පැකට් කරලා, ගබඩා කරල තියෙනවා නම් ගඳක් එන්නේ නැහැ. ඉතින් ඒකටත් අවධානය යොමු කරන්න කියලා සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම තමයි සභාපතිතුමනි, ඇත්තටම කනගාටුවට කරුනක් අපි සභාවට මොනව හරි වැඩක් කරගන්න ආවහම, අපට ඔබතුමා ළඟ වාඩිවෙන්න තැනක් නැහැ. ඉන්න තැනක් නැහැ. අපිව කවුරුත් පිළිගන්නේ නැහැ. කතා කරන්නේ නැහැ. අපිට ඉන්න තැනක් කොහේ හරි මේසයක් දාලා හදලා දෙන්න. අපි ඔබතුමාගේ පුටුව ඉස්සරහ වාඩිවෙලා ඉන්න විට තව කෙනෙක් ඔබතුමා හමුවෙන්න ආවම ඒ වෙලාවට අපට යන්න තැනක් නැහැ. අපි අර සේවකයාගේ පුටුවෙන් වාඩිවෙනවා. මේ නිලධාරියගේ පුටුවෙන් වාඩි වෙනවා. අපි ඇත්තටම අන්ත අසරණයි. ඒ වගේම අපි මොනවා හරි අවශ්‍යතාවයකට ආවම, ගිය සැරේ මම වාර්තාවක් ගන්න ආවට පස්සේ වාර්තාව දෙන්නම් කියලා පැය දෙකක් මෙතන රස්තියාදු කරවලා, අන්තිම මොහොතේ දෙන්න බැහැ කියලා කියනවා. ආයිත් අපි පාරට බැහැලා, බස් එකට නැග්ගම කියනවා. මන්ත්‍රීතුමිය හෙට උදේට එන්න දෙන්නම් කියලා. සභාපතිතුමනි, මේ මම ඇවිල්ලා වාර්තාව ඉල්ලලා පැය දෙකක් මෙතන හිටියට, ඔබතුමාට ලියුමක් එව්වේ සති දෙකකට කලින්. මේවා අපේ  අයිතිවාසිකම්. මේවා නිලධාරී මහත්මියන්ට දන්වන්න. මම එවෙලෙම ඇවිල්ලා ඉල්ලුවේ නැහැ. සභාපතිතුමා දෙන්න කිව්වත්, නිලධාරිතමිය දෙන්නෙ නැහැ. ඉතින් මම කියන්නේ අපි අපේ වැඩකටයුතු වලට ආවම, අපි මෙතනට එන්නෙ මොකටද? අපේ අයිතිවාසිකම් ගැන හිතලා අපට ඒවා ලබා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම සභාපතිතුමනි, අපේ ප්‍රදේශවල පාරවල් අයින්වල කැලෑවල් වැවිලා තියෙනවා. ඇත්තටම බොහොම අමාරු අපහසුතාවක් තියෙන්නෙ. ඒ නිසා ඒවත් සුද්ද පවිත්‍ර කර දෙන මෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම අර කුරුපනාව ෆැක්ට්‍රිය පාර  ශ්‍රමදාන මට්ටමින් හදලා තියෙනවා. එතනට කොරි පස් එකක් දාලා තියෙනවා. තවත් කොරි පස් එකක අවශ්‍යතාවය තියෙනවා. ඒ කොරි පස් එක  අපට ලබාදෙනවා නම් හොඳයි. ඒ ගැන අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා. ස්තුතියි.

### ගරු මන්ත්‍රී  නන්දන නිශාන්ත මහතා

ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, ඔබතුමා සමහරවිට දැනුවත් ඇති. අර කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හරහා ලක්ෂ 14 කින් පාරක් කොන්ක්‍රීට් කරලා තියෙන්නේ. ඒකේ වතුරපාර සම්පූර්ණයෙන්ම එන්නේ පාරට. දැන් පොඩි හියුම් පයිප්ප දෙකක් විතරක් අපට ලබා දෙන්න. ඔබතුමාගෙන් පොඩි ඉල්ලීමක් කරන්නේ. මේකට රුපියල් පන්දාහක් යන්නෙත් නැහැ.  අපට ලොකු ඒව එපා. මේ චූටි වැඩේ විතරක් කරලාදෙන්න. බෝවිටියමුල්ල පාසල් කන්ද මාර්ගය යා කරන තැන උඩ පාර කොන්ක්‍රීට් කරලා තියෙන්නේ. යට පාරට දැන් වතුර පාර එනවා. අඩි එක හමාරක සිළිංඩර් දෙකක් දැම්ම නම් ඇති. ඒ වගේ පොඩි දේකට අපිට මුදල් වෙන් කරගන්න බැරි තත්වයක් තියෙන්නේ. එහෙම වෙන් කරන්න මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නැති නිසා. ඒ ගැන අවධානය යොමු කරල දෙන්න.

ඒ වගේම මාපලගම අලුත් පහළ පාලම දැන් යන්න බැරි තත්ත්වයටම ශබ්ද වෙනවා. ඒකෙ ඇණ ටික තද කරල දෙන්න. මේ වෙනකොට යකඩ කෑලි දෙක තුන නැතිවෙලා තියෙනවා. ගහ හරහා

තියෙන පොඩි යකඩ පාලමේ. මේකෙ ඇණ ටික තද කරල පාලමේ සද්ද වෙන එක නවත්තන්න පුළුවන්. ඒ පිළිබඳව ඔබේ අවධානය යොමු කරන්න කියලා කියනවා.

ඒ වගේම මෙතනින් නික්මුණ අපේ චන්දිමා මන්ත්‍රීතුමිය කියපු එක ඔබතුමා එච්චර ගණන් ගත්තේ නැහැ. අර මලාමුරේ, පියල් මන්ත්‍රීතුමා දන්නවා. ඒ ඇළේ නාන්නවත් බැහැ. අන්න ඒකට තමයි අර විදුහල්පතිතුමා කියපු කමිටු තියෙන්නෙ. අවුරුද්දක් වෙලත් සභාවේ එහෙම කමිටුවක් රැස්වෙලා නැහැ. ඒවයින් තමයි අද මේවා තහනම් කරන්න ඕන. ජනතාව පීඩාවට පත්වෙනවා නම්, ඒවට තීන්දු ගන්න ඔබතුමාට බලය තියෙනවා. ඔබතුමා ඒව පාවිච්චි කරන්නෙ නැහැ. ඒ හින්දා කරන්න ඕන මොකක්ද කියලා අපි  කියනවට වඩා හොඳයි. ඔය පනත බලලා කරන්න පුළුවන් දේ කළා නම් සභාපතිතුමනි. මොකද එයාලා හම්බ කරනවා වගේම කිසිම මිනිහෙක් ගැන හිතන්නේ නැති තත්ත්වයට පත්වෙලා තියෙන්නෙ. ඒ හින්දා ගල්කොරියක් ගත්තත්, වැලි පලක් ගත්තත්, ජනතාවට වෙන පීඩාව බරපතලයි ඒවා නිසා.  පරිසර කමිටු තියෙනවා ඒවා නමට විතරයි. මේ ප්‍රාදේශිය සභාතුල කිසිම කමිටුවක් කිසිම දවසක රැස්වෙලා නැහැ.මෙතන ඉන්න මන්ත්‍රීවරයෙක් ගෙන් ඇහුවොත් ඔයා ඉන්නෙ මොන කමිටුවේද කියලා, මතක නැතුව ඇති. මොකද කවදාවත් මුදල් කමිටුව ඇරෙන්න වෙන කිසිම කමිටුවක් මේකෙ ඇතුලෙ රැස් වෙලා නැහැ. කමිටුවක් කියන්නේ මොකක්ද කියලා මේ ඉන්න මන්ත්‍රීවරුන් දන්නෙ නැහැ. ඉතින් ඒ හින්දා මේවා තියෙන්නේ මේකට. ගරු සභාපතිතුමනි, ඒකත් සිහිපත් කරමින්, කනත්තගොඩ යටලමත්ත මාර්ගයේ අළුතින් පාලමක් දානවා. ගරු සභාපතිතුමනි, බොහෝවිට මේ දාහත් වැනිදා මුල් ගල් තියන්න පුළුවන් වේවි කියල මම විශ්වාස කරනවා.  ඒ සඳහා සියලුම මන්ත්‍රීවරුන්ටත් මම ආරාධනා කරනවා. හැමදෙනාටම සුභ දවසක්.

**ගරු මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා.**

ගරු සභාපති තුමනි,ගාලු දිස්ත්‍රික්කයේ කෙනෙක් වජිර අබේවර්ධන මැතිතුමා.එතුමා කුමන දේශපාලන පක්ෂයක වුවත් පළාත් පාලන අමාත්‍ය වරයා ලෙස පත් වීම පිළිබඳව අපේ ගෞරවය ස්තුතිය පළ කරනවා.එසේම එතුමා පත් කළ බලධාරීන්ටත් අපේ ගෞරවය ස්තුතිය පුද කරනවා.මගේ පළමු යෝජනාව ලෙස මම ඉදිරිපත් කරනවා.හෙද සේවයට බදවා ගන්නව වගේ ග්‍රාම නිලධාරීන් බදවා ගැනීමේදීත් පිරිමි 90% ක් හා කාන්තාවන් 10% ක් ලෙස බදවා ගැනීම් සිදු කරන ලෙස ද්වදේශ කටයුතු ඇමති වරයා ලෙස වජිර අබේවර්ධන මැති තුමාගෙන් ඉල්ලීමක් කරන්න කියල මම ඔබ තුමාගෙන් ඉල්ලා සිටිනව.අඩු ගානෙ 50% ක් පිරිමි 50% ක් කාන්තාවන් ඉදිරි බදවා ගැනීම් වලදි බදවා ගන්නා ලෙස ඉල්ලීමක් කරන්න කියල මම ඔබ තුමාගෙන් ඉල්ලා සිටිනව.නැත්තම් ලොකු ගැටලුවලට මුහුණ පාන්න සිදු වෙනව.මේ බව පැහැදිලි කර යවන්න කියා ඉල්ලනව.

අනිත් ගැටලුව කාර්මික නිලධාරීන් සම්බන්ධවයි.නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගත්තොත් තාක්ෂණ නිලධාරීන් පස් දෙනාම කාන්තාවන්.අඩු ගානෙ එක් අයෙක්වත් පිරිමි කෙනෙක් ඉන්න ඕන.ක්ෂේත්‍ර රාජකාරිවල නිරත වීමේදී බයිසිකල්වල යන්නෙ නැති කාන්තාවන් නිසා ඉතා අසීරුවට පත්වෙනව.ඇස්තමේන්තුවක්  සකස්කර ගන්න කඩිනම් වැඩ පිළිවෙලක් සකස් කර ගන්න බැහැ. නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගත්තොත් සහකාර ඉංජිනේරු හැර සියලු දෙනාම කාන්තාවන්.මෙම ගැටලුව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට හෝ දන්වා යැවීම සුදුසුයි.නැතහොත් ඉදිරියෙදි සංවර්ධන කටයුතු වලදි ලොකු ගැටලු රාශියකට මුහුණ පාන්න සිදු වෙනව.සංවර්ධන වැඩවලදි ප්‍රමාදය වැලැක් වීමට නම් පිරිමි පාර්ශවය අත්‍ය වශ්‍යයි.මේ පිළිබදව අදාල පාර්ශවයන් දැනුවත් කිරීම කඩිනමින් සිදු කර මටත් පිටපතක් දෙන්න. ගුරුවරු හෙදියන් ගැහැනු අය හිටියට කමක් නැහැ.මේ සම්බන්ධව න්‍යාය පත්‍රයට ඇතුලත් කළ නොහැකි වුවත් ගරු සභාවෙන් ඉල්ලා

සිටිනවා. යෝජනාවක් ලෙස පිළිගෙන මේ සම්බන්ධව කඩිනම් පියවර ගන්න කියල.හිටපු සභාපති වරු හැටියට අපි දන්නවා ඔබ තුමාටත් හොදක් අහන්න බැහැ.නමුත් අද දින කතා වුන කාරණා දිහා බැලුවම. කාර්යාලය තුල විධිමත් භාවයක් නොමැති වීම නිසා පවතින අඩු පාඩු මතු කරන්න සිදු වුනා. ඒවා පිළිබද මීට වඩා අධීක්ෂණයක ඉන්න. නිලධාරීන් ප්‍රමාණය දැන් වැඩියි. ඒ අනුව කටයුතු කාර්යක්ෂම විය යුතුයි.ඒ වගේම මුදල් නැත්නම් මුදල් සොයා ගැනීමත් කළ යුතුයි.

ඔබ තුමා ඉතාමත් කාර්යය බහුලයි.නමුත් කාර්යාල වැඩ කටයුතු පිළිබදව පසු විපරම් කළ යුතුයි.දැඩි අධීක්ෂණයක සිටිය යුතුයි.කාර්යාලයේ රැදිල විෂය නිලධාරීන් ගෙන්වා ලිපිගොනු පරික්ෂා කර බලන්න කියා ඉල්ලනව.මන්ත්‍රී වරුන්ගේ යෝජනා නොසලකා හැරීම බරපතල ප්‍රශ්නයක්.මන්ත්‍රී වරු ඔබ තුමත් සමග කණ්ඩායම් හැගීමෙන් ඉන්නව නම් ඔවුන්ගේ යෝජනා පිළිබදව සොයා බැලිය යුතුයි.යෝජනාව ඉදිරිපත් කර ඊලග සභාවට ඇස්තමේන්තු යොමු විය යුතුයි. මාස 48 යි සභා කාලය පැවැත්වෙන්නෙ. එක යෝජනාවකට මාස 08 ක් ගත වුව හොත් වැඩ කටයුතු සිදු කිරීම අපහසු වෙනව.මෙය මහජනතාව සමග ගැටෙන කාර්යාලයක් නිසා නිලධාරීන්ට ඒ පිළිබද දැනුවත් කරන්න.ඔබ තුමා ලබන සතියෙම වැඩ පිළිවෙලක් දියත් කරන ලෙස ඉල්ලනවා.ඔබ තුමා රෑ දවල් නොබලා මහන්සි වෙලා වැඩ කරන කෙනෙක්, නිවැරදි මගට ගන්න උවමනාවකින් කටයුතු කරන්න කියල ඉල්ලනව.ඔබ තුමා අවුරුදු හතරම කරන්න අපි විරුද්ධ නැහැ.මේ වගේ හැමෝම එකතු වෙලා උදවු කරන සභාවක් වෙන කොහේවත් නැහැ.ඔබ තුමාට 26 දෙනා වගේම, ඒ නැතත් 14 දෙනා හරි උදවු කරනව.චන්ද්‍රසිරි වනිගරත්න මන්ත්‍රී තුමාගේ යෝජනාව මම ස්තිර කරනවා. මම කොට්ඨාසෙ මන්ත්‍රී තුමා හැටියට මම හරස් වෙන්නෙ නැහැ. එතුමා යෝජනා කළා නම් ඒ වෙනුවෙන් උපරිම සහය ලබා දෙනවා.එතුමා යෝජනා කළ අලුත් වත්තෙ ගොඩනැගිල්ලෙ භාදා දෙකක් තියෙනව.එකක් ඉදිවෙන්නෙ නැති බුදු කුටියක් හදල තියෙනව.ඒ බුදු පිළිමයට දූවිලි වැදි වැදි තියෙනව.එක්කො මේක ඉවත් කරන්න ඕන.නැත්නම් වැදුම් පිදුම් කරන්න පුලුවන් විදිහට සකස් කරන්න ඕන.අනිත් එක ඒ ඉඩමෙම ගෙයක් හදල තියෙනව.ඒ අයට මොකක් හෝ වැඩ පිළිවෙලක් කරල දීල ඒක ඉවත් කර ගන්න කටයුතු කරන්න ඕන.ඒ දෙක තිබුනත් කමක් නැහැ මෙතුම කියපු විදිහට වහල හදල අඩු පාඩු සකස් කරල දෙන්න කියල ගෞරවයෙන් ඉල්ලනව.

දකුණෙ පාසලේ ඉතා ප්‍රසංසනීය ක්‍රීඩා උත්සවයක් පැවැත් වුනා.මටත් ආරාධනා කළා.ආරාධනාව 12.30 ට තිබුනෙ 11.00 උත්සවය පටන් ගත්ත.ඒ නිසා යන්න බැරි වුනා.ඉතා මනරම්ව එය කළා අපේ ගෞරවය සුතුතිය පුද කරනවා.සභාවේ කටයුතු සාර්ථකව කර ගන්න සියලු දෙනාට ශක්ති ධෛර්යය ලැබේවා කියමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.සියලු දෙනාට තෙරුවන් සරණයි.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, අජිත් එඬේර ආරච්චි හිටපු සභාපතිතුමා ගෙනා වැදගත් යෝජනා අපි ඒකමතිකව සම්මත කරනවා. ඒ වගේම මං පළමුකොටම සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද අපේ ගෙවල් මාර්ගයේ යන්න බැරිව තිබුණේ. පුළුවන් විදිහට හරි j.c.b. එකක් දාලා මේ මොහොත වන විට සකස් කිරීමක් සිදු කරලා තියෙනවා. අනාගතයේදී රජයෙන් ආධාර අරගෙන කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. හොඳ වැඩක් කළොත් ඒකෙ ගෞරවය ඔබතුමාට ලැබිය යුතුයි. ඒ වගේම මේ වෙලාවේ මම හිතුවා. රටේ හොඳ වැඩක් කරගෙන යනවා. අපේ දේශපාලන මතිමතාන්තර තියෙනවා. නමුත් අපි සියලු දෙනාම අනාගත පරපුරක් රකින්න ඉන්න, අනාගතය වෙනුවෙන් වැඩ කරන අපි සියලු දෙනාටම සතුටුවිය හැකි කරුණක් තියෙනවා. මේ වෙනකොට මෙතනින් ඒ පණිවිඩය එයි කියලා මම හිතුවා. මේ මොහොත වන විට මේ රටේ විතරක් නෙවෙයි. ලෝකයේ අපරාධකාරයෙක් වන ඒ වගේම මේ රටට විසබීජයක් වුන මධූෂ් කියන පුද්ගලයා අත්අඩංගුවට අරගෙන තියෙනවා. ඒකෙ ගෞරවය ආණ්ඩුවටත්, ඒ වගේම රටේ

ජනාධිපතිවරයාට අපි නිහතමානීව පුදකළ යුතුයි. මේක කොඩිවිනයක්. දරුවෙක් හදනවා, දරුවෙක් සමාජගත කරනවා, පාසලට යවනවා, දරුවා වැඩිහිටියෙක් වෙනවා, මේ මොහොත වන විට අපට ඒ එක කාරණයක් ගැන බලාපොරොත්තු තියන්න බැරිව හිටියේ. මෙන්න මේ පියවරෙන් පියවර ඇත්තටම මෙහෙම යනවනම් හොඳයි. ජනාධිපතිවරයා ප්‍රකාශයක් කළා. මත් වතුර ඒ කියන්නේ කසිප්පු ප්‍රදේශයක තිබුනොත්, පොලිස් අධකාරිවරයා, පොලිස් ස්ථානාධිපතිවරයා ඒ සම්බන්ධව වග කිව යුතුයි කියලා ජනාධිපතිතුමා ප්‍රකාශයක් කරලා තිබුණා. පොලිසියට නිදාගන්න බැරි වෙනවා. අපි කොච්චර ගිහිල්ලා කියනවද? දුරකථනයෙන් කියනකොට ඒ උදවියට ඒ පණිවිඩ යනවා. මේක සමාජගත වෙලා තියෙන්නේ. අපෙන් නෙවෙයි. පැහැදිලිවම අපේ සභාපතිතුමත් විශේෂයෙන් සම්බන්ධ වෙච්ච කරුණු කාරණා වලදී අපි දැක්කා. ඉතින් ඒ නිසා මේ බොහොම හොඳ තීරණයක් අරගෙන තියෙනවා. මත්ද්‍රව්‍ය උවදුර ආවොත් අනාගතයේදී මේක හරියට ප්‍රභාකරන්ට වැඩිය දරුණු යුද්ධයක් වෙනවා. පැහැදිලිව ඉස්සර මේ වගේ දේවල් දකින්න තිබුනෙ නැහැ. හික්කඩුව, උණවටුන වැනි ප්‍රදේශවල විතරයි තිබුණේ. අද අපේ ගම්වල අහිංසක දරුවෝ සැහෙන පිරිසක් මේ නිසා අමාරුවේ වැටිලා තියෙනවා. එහෙමනම් අපි නිහතමානීව මේ වෙලාවේ ඒ ගෞරවය ලැබිය යුතු සියලු දෙනාටම ස්තුතිය පුද කරනවා. ඒ වගේම මධූෂ් ලංකාවට ගෙනාවොත් උන්දා සිදුරෙන් රිංගනවා. එහෙමනම් මම හිතනවා ඩුබායි රටේ දිම ඒ මුස්ලිම් ආගමේ දඬුවම ෂරියා නීතිය අනුව ගල් ගහලා, එල්ලලා, ගෙළ කපලා හරි ඒ රටේදී ඒ දඬුවම ලබා දිය යුතුයි කියන යෝජනාව මම මේ අවස්ථාවේ ගේනවා. මොකද මෙහෙට ගෙන ආවොත් සමහරවිට බොහොම ආරක්ෂාකාරීව හිරගෙදර ඇතුළේ තියාගෙන මේ ව්‍යාපාරය කරනවා. ඒකට සාක්ෂි තමයි එදා අල්ලන්න යන කොට ඒ නිලධාරීන් එක්ක එදා ඔවුන් ඒ හෝටලේ ඉඳලා තියෙනවා. ඒ පිළිබඳව මම විශේෂයෙන් මතක් කළේ, අද අපේ රටේ කොඩිවිනයක්. අපි පුංචි තැනින්, ගමෙන්, ප්‍රාදේශීය සභාවෙන් අපි මේ හඬ ගෙනියන්න ඕන. මේක පාර්ලිමේන්තුවේ විතරක් නෙවෙයි. ගම්සභාව ඉදලා, පළාත් සභාවෙ ඉඳලා, පාර්ලිමේන්තුව දක්වාම මේ හඬ ගෙනියන්න ඕන. එහෙම උනොත් තමයි මේකට නිරතවෙන රාජ්‍ය නිලධාරීන්, පොලිස් දෙපාර්තමේන්තුව වගේ අය මේක ක්‍රියාත්මක කරන්නේ. එහෙනම් ඒ ගෞරවය පුද කරමින් මේ අවස්ථාවේ ඒ පිළිබඳ ඊට වැඩිය කරුණු දක්වන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

ඊළඟට ඇත්තටම අපේ මේ මන්ත්‍රීවරුන් විශේෂ කරුණු මතක් කළා. මේ කමිටු රැස්වීමේ දී ඒ කර්මාන්ත කමිටුව කියන එක පරිසර කමිටුව විය යුතුයි. ඊළඟට පරිසර කමිටුවට පිටින් නිලධාරී ඇවිල්ලා මෙතන සාකච්ඡා කළාද? ඒ සාකච්ඡා වුණේ මොනවද? කියන එක මේ ගරු සභාව දැනගන්න ඕන. අපට ගෙවීමක් කරන්න එනවා. අපි මේ වගකීමකින් මේ අත්සන් කරන්නේ, වගකීමකින් කතාකරන්නේ. මේ සභාවෙන් අපි අනුමත කරන්නේ රුපියල ද, රුපියල් දාහද ඒ වගකීම අපි දරාගෙන තමයි කරන්නේ. එහෙමනම් මෙතනට එනවා නම් ටිකක් දාලා, නම් ඇත්තෙත් නැහැ. පරිසර කමිටුව රැස්වුණා. කමිටුව වැරදියි කමිටුව මොකක්ද කියලා නිලධාරියා දන්නේ නැහැ. ටයිප් කරනවා. පරිගණකයට දාලා කොලේ හරිගස්සනවා. මෙතන මොකක්ද වුණේ කියලා දැනුවත් වෙලා නෙවෙයි මේ කරලා තියෙන්නේ. එහෙමනම් පිටින් නිලධාරි ආව නම් විශේෂයෙන් සටහන් විය යුතුයි. එතකොට තමයි මේ වගකීම අපට දරා ගැනීමට හැකියාව තියෙන්නෙ. නැත්නම් තමුන්නාන්සේලා අපි දරා ගන්න ඕන නැහැ. පරිසර කමිටුව නෙවෙයි අපි හිතමු වෙන කමිටුවක් කවදාද? කුමක් සඳහාද? ප්‍රගතිය කුමක්ද? කියන එක ගැන අපි දැනුවත් විය යුතුයි. ඕක තමයි ඇත්ත උත්තරය. එහෙමනම් සභාපතිතුමා ඔබතුමා මෙන්න මේ හැම දෙයක්ම නිලධාරී කෙරෙහි විශ්වාසය තියලා කටයුතු කරනවා. මම කනගාටුවෙනවා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු නිලධාරීන්ට හැල්ලු විය යුතු නැහැ. මේක තමයි මධ්‍යස්ථානය. මෙතන තමයි යෝජනා ගේන තැන මෙතන තමයින් තමයි මාසික වැටුප ගේන්නෙ. ඕන නම් අපට ඒක නවත්තන්නත් පුළුවන්. මේ සභාවට යම්කිසි නිලධාරියෙක් වැරැද්දක් කරාද, අපි මේ මාසයේ වැටුප නවත්තනවා කියලා තීන්දුවක් ගන්න අපට පුළුවන් ආයතනයක්. කිසිම මන්ත්‍රීවරයෙක් පාට පක්ෂ මොනම දෙයක්වත් තිබිය යුතු වන්නේ නැහැ.

මෙතන තමයි මන්ත්‍රී ගරුත්වය ආරක්ෂා විය යුතු තැන. ඒ මන්ත්‍රීතුමිය කිව්ව විදියට ඒ මන්ත්‍රීතුමිය හැල්ලුවට පත් වෙලා තියෙනවා. ඒ ගැන මම කනගාටු වෙනවා. මෙ ආයතනය තුල අපේ ගරුත්වයත්, මන්ත්‍රීවරියන්ගේ ගරුත්වයත් තියෙන්න ඕන. මන්ත්‍රීවරුන්ට මේ පණිවිඩයක් එන එකක් නැහැ. මේ අය මන්ත්‍රීවරියන් කියන්නේ තාම කුළුදුල් උපතක්. ඒ අය අපි ආරක්ෂා කරන්න ඕන. ඒ උදවිය තාම දැනුවත් නැහැ. අපි දැනුවත් පුද්ගලයන් හැටියටත් නිලධාරී හැටියටත්, මේ අය ආරක්ෂා කරන්න කියලා ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. අපේ අජිත් එඩේරආරච්චි හිටපු සභාපතිතුමා කිව්වා වගේ ආරක්ෂා කරන්න. මේක දෙන්න තුන්දෙනයි අපි දන්නේ. ඉතින් ඒක නිසා ඒ පිළිබඳවත් මම තමුන්නාන්සේලාට මතක් කරනවා. විශේෂයෙන්ම අපි පක්ෂයක් බලන්නේ නැහැ. මන්ත්‍රීවරයෙකුට, මන්ත්‍රීවරියකට මෙම ආයතනයෙන් නොවෙයි වෙන ආයතනයකින් හරි අපහසුතාවයට පත් වුණාද අපි එකා වගේ නැගිටිනවා කියන පණිවිඩය දෙනවා. එදාට අපි ගාව පක්ෂයක්, පාටක් නැහැ. ඒ වගේම පොල් ආදායම කොහොමද දන්නෙ නැහැ. සභාපතිතුමා ඔබතුමාගේ වැඩපිළිවෙළ සාර්ථක ඇති කියලා මම හිතන්නේ. ඒ ගැන දැනගන්න ඕන. පොල් කිව්වම මට පොල්ලත් මතක් වුණා. ඔබතුමා ඇත්තටම සතුටු වෙන්න ඕන. facebook එකේ කවුද ඔය පණිවිඩය දැම්මේ. ඔබතුමා හොඳ තීරණයක් අරගෙන තියෙන්නෙ හෙල්ල වෙනුවට පොල්ල විසි කරේ නැත්නම් මනුෂ නානායක්කාර මහත්මයා අද ක්‍රීඩා භාණ්ඩ එවන්නේ නැහැ. ඒක නිසා ඒ දුක දැක්කා. ඇත්තටම කවුරු කළත් වැදගත් දෙයක් කරල තියෙන්නෙ. මුල් කතාවේ දීම පොල්ල වෙනුවට හෙල්ල ආපු එක ගැන අමතක වීම ගැන ඇත්තටම අපි කණගාටු වෙනවා. මනුෂ නානායක්කාර මහත්මයා යූඑන්පී එකට ආපු හින්දද අමතක නැති වුනේ ? හෙල්ල ඉස්කෝලෙට ඇවිල්ල තියෙද්දි මේ හෙල්ල දකිද්දී මතක් වෙන්න ඕන. ඒක මේ මන්ත්‍රීවරය මතක් කරනකම් එ්ක මතක් වුනේ නැහැ. ඒක නිසා හෙල්ලයි පොල්ලයි හරියට බලාගන්න කියන එක තමයි මම ඔබතුමාට මේ වෙලාවේ කියන්නේ. ඒ පිළිබඳ තරහකින් නෙමෙයි මම කියන්නෙ. මොකද මනුෂ නානායක්කාර හිටපු ඇමතිවරයා අපෙන් අහවි තමුන්නාන්සේලාගේ කොට්ඨාසයට පොල්ලක් දැකලා මම හෙල්ලක් එව්වා. සභාවේ මොකක් වත් ඒ ගැන හඬක් නැනේ කියලා. ඉතින් ඒක නිසා ඒ පිළිබඳවත් මතක් කරමින්, ඒ වගේම අවුරුද්දක් වෙනවා ආපස්සට හැරිලා බලමු. අජිත් මන්ත්‍රීතුමා කිව්වා මාස 48 ක් කියලා. නැහැ තව මාස 36 යි තියෙන්නෙ. මේ මාස 12 තුල අපි අපේ කොට්ඨාශ තුල වෙච්ච දේ බලන්න ආපස්සට. එතන තමයි අපි දන්නවා. මේක අපහසු කාර්යයක් අපි ඉද්දී අපි යම් වැඩ කොටසක් කළා. නමුත් ජනතාව අතට ඒක යන්නේ බොහෝම අමාරුවෙන්. අපේ නරක දේ විතරයි ඇහිඳින්නෙ. හොඳ දේ ජනතාව ඇහිඳින්නෙ නැහැ සභාපතිතුමනි. තමුන්නාන්සේටත් ඒ ටිකම තමයි වෙන්නෙ. ඒක නිසා අවුරුද්දක් ආපස්සට හැරිලා බලන්න. මටනම් වීථි ලාම්පුවක් හැරුණුකොට වැදගත් දෙයක් තාම හරියට ක්‍රියාත්මක වෙලා නැ.හැ ඇත්ත උත්තරේ එකයි.ඔබතුමා නිකන් බලන්න එක පාරක වැඩ හරියට නිම කරන්න බැරි වුණා. මෙතන තමුන්නාන්සේලාට ෂීට් එකට ඇවිල්ලා තනියම කරන්න බැහැ. ඒකට තාක්ෂණ නිලධාරි ඉන්නවා. පරිසර නිලධාරි, නොයෙකුත් නිලධාරීන් ඉන්නවා. අජිත් මන්ත්‍රීතුමා කිව්වා වගේ එදා මේකේ හයදෙනයි වාඩිවෙලා හිටියේ. මේක අපි මන්ත්‍රීවරුන්ට රැස් වෙන්න තිබුනේ.මේකේ එක වැඩක් අතපසු නොකර 100% නොවෙයි 75%ක් අපි වැඩ කරගෙන ගියා. ඕක තමයි ඉතිහාසය.දැන් මන්ත්‍රීවරු 27 දෙනෙක් ඉන්නවා. නිලධාරීන් ඒ වගේ දෙතුන් ගුණයක් ඉන්නවා. එහෙම නම් නිලධාරි අතින් අද ලොකු වෙනසක් සිදුවෙලා තියෙනවා. එදා තාක්ෂණය මේ වගේ දියුණු නැහැ. ටයිප්රයිටරය තිබුණේ. එක අකුරක් වැරදුනොත් ඒක නැවත කරනවා. ඒ වගේ බොහොම නොදියුණු මට්ටමක එදා තිබුණේ. අද තාක්ෂණය දියුණුවෙලා. නමුත් අපේ කටයුතු අඩාල වෙලා. ඒක නිසා ඒ ගැනත් මම සඳහන් කරනවා. තමුන්නාන්සෙගෙ ඉදිරිගමනට අද අවුරුද්දක් වෙනවා. ඊළඟ අවුරුද්දට මේ පණිවිඩය දෙනවා. මෙතුමා කිව්වා වගේ, වෙන සභාවල ගල් මුල් එනකොට, අද තමුන්නාන්සේලා අපි එකට අත්වැල් බැඳගෙන යනවා. අපි ආඩම්බර විය යුතුයි. මෙතුමා කිව්වා තෙල් මිල ගැන. ඒකටත්

උත්තරයක් දෙන්න ඕන. තෙල් මිල රුපියල් 7කින් වගේ වැඩිවෙලා තියෙනවා. ඉතිහාසයක් තිබුනා ඩොලරය බහිද්දි, බොරතෙල් මිල අපි අධිකරණයට ගිහිල්ලා, අධිකරණයෙන්වත් මේක අපට අඩු කරගන්න බැරිවුනා. අඩු කලත් අඩු කලේ නැහැ. තමුන්නාන්සේ තෙල් මිල ගැන කතා කළාට රට ලූනු මිල, පරිප්පු, හාල්මැස්සෝ, හාල් පාරිභෝගික භාණ්ඩ මිල ගැන කතා කලේ නැහැ. අද රට ලූනු කිලෝ එකක් 65යි සීනි 105 යි පෙට්‍රල් ලීටරයකින් රුපියලක් දෙකක් වැඩි වුනාට අද ඉතිහාසය වෙනස් කරලා තියෙනවා. කුණු කඳු කඩා වැටුනා, ගංවතුර ආවා, දළඹුව ආවා, මේ හැම කරදරයක්ම වෙලත් අද එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කොන්ද කෙළින් තියාගෙන පාරිභෝගිකයට රිදවලා නැහැ. රාජ්‍ය සේවකයාට රුපියල් දහදාහක් වැඩි කළා. එන අය වැයෙන් තව පන්දාහක් වැඩිකරනවා. අපි කෑ ගහනවා විතරයි. ආණ්ඩුව හොරා ගණිපු වෙලාවේ ජීවිත පරිත්‍යාගයෙන් අපි කොළඹ ගිහිල්ලා මේක රැක ගත්තෙ. වතුකම්කරුවන්ට රුපියල් හත්සියයක් දුන්නා. දාහක් දුන්නොත් කරන්න බැහැ. ඒක නිසා පොදුවේ සියලු පාරිභෝගික භාණ්ඩ මිල අඩු කළා. ඒ වගේම ඉඩම් ඇමතිතුමා මෙහෙත් ඉන්නවා. ස්වදේශ කටයුතු ඇමති තුමා එහෙන් ඉන්නවා. අද මේ මොහොත වන විට වැලිවිටිය, ඌරල වගේම අනෙකුත් ප්‍රදේශවත්ල ඉඩම් මැනීම් කටයුතු කරගෙන යනවා. තමන්ගේ මරණ සහතික ලියන්න භූමියක් නැතුව හිටපු අහිංසක ජනතාවට තව මාස තුනක් යන්න ඉස්සරවෙලා සියලුම දෙනාට ඉඩම් ඔප්පු ලබා දෙනවා. මේ ගෞරවයත් ගාලු දිස්ත්‍රික්කයේ හිනිදූම ආසනයේ නියෝජිතයෙක් හැටියට ඉඩම් ඇමතිවරයාට අපේ ගෞරවය මේ වෙලාවේ පුද කරනවා. මේ ටික තමයි කියන්න තියෙන්නේ. තව තිබුනත් අපි කියන්නේ නැහැ. වතුර වලවල් ටික වැසේවා, තමුන්නාන්සේගේ ශක්තිය ගන්න චන්දිමා මන්ත්‍රීතුමිය කියපු වළ ජේ.සී.බී.එකක් දාලා වහල දාන්න. සම්බන්ධීකරණ කමිටුවේදී මෙතුමා කතාකළා. මමත් එතන හිටියා. එතනදි අපේ නන්දන මන්ත්‍රීතුමා කිව්වා වගේ ශක්තිය ගන්න විසි හත් දෙනා අත උස්සනවා නම් කිසි ප්‍රශ්නයක් නැහැ. අපි 27 දෙනා එතනට එන්නම්. වැඩ ශක්තිමත් ලෙස කරගෙන යන්න කියලා ඉල්ලා සිටිමින්, ඒ වගේම මෙන්න මේ ටික තමයි ඇත්තටම කිවයුතුව තිබුනේ. ඒක නිසා මේ වෙලාවේ තමුන්නාන්සේලා අපි අවුරුද්දක් බොහොම සමගියෙන්, සදාචාරාත්මකව, ලෙන්ගතු බැඳීමකින් ඒ ගමන ඇවිත් තියෙනවා. මොන වචනෙ එහාට මෙහාට වුණත්, අපි සියලු දෙනාම එකම මතයක ඉන්නෙ ජනතාවට සේවය කරන්න. එහෙම නම් ඒ ශක්තිය සියලුදෙනාටම ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරමින්, ඒ ශක්තිය සභාපතිවරයාටත් ලැබිලා, මේ ගමන මේ ආපු වගේම අපට ඉදිරියට යන්න අවශ්‍ය ශක්තිය තමුන්නාන්සේලාට ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, තමුන්නාන්සේලා සියලු දෙනාට සුභ වසරකට ආසිරි පතමින් මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි මට අද වැඩිය කතා කරන්න අවශ්‍ය නැහැ. ඒත් මට මතක් වුණා ගිය සභාවේ අපි ගරු මන්ත්‍රීවරු කටුපොල් ඇළට ඉවත් කරලා අපේ මන්ත්‍රීවරු ඒක බලන්න ගියා. ඒක අත්වැරදීමකින් සිදුවුන බව වතු සමාගමේ නිලධාරීන් ප්‍රකාශ කලත්, ඒක අත් වැරදීමක් නෙවෙයි. එයාලා හිතලම කරන දෙයක්. එදා වහීව් කියලා හිතාගෙන තමයි කටුපොල් ඇරියෙ. වැස්සෙ නැහැ ඇලේ ආවා. ඒ වගේම පහුගිය දිනවල ඊටපස්සෙ වර්ෂාව වැහැලා ගලාගෙන යන වෙලාවට මේගොල්ලෝ පිට කරනවා. හැම ගංවතුරකටම මේ කටුපොල් පිට කරනවා. ඒ වගේම ගිය මාසේ පහළොස් වැනිදා මේ සිද්ධිය වුනේ. එදා ඉඳලා සතියක් විතර ඇලේ ඔක්කොම මාලු මැරුණා. ඒ වගේම ඇලේ පරිසර හිතකාමී වඳවීගෙන යන බොහොම දුර්ලභ ගණයේ මාළුවන් හිටිය. උන් එකෙක්වත් නැහැ. අඩුම ගානේ ඇටකිච්චෙක්වත් නැහැ. අපේ ගෙදර ඉස්සරහින් ඇල බැහැගෙන යන්නෙ. අපි දකිනවා පිලිහුඩුවා ගහේ ඉඳගෙන බලා ඉඳලා මාළු අල්ලනවා. දැන් පිළිහුඩුවා නිකම් බලාගෙන ඉන්නවා. අල්ලන්න මාළු නැහැ. ආසාවට පොඩි ළමයෙකුට පෙන්නන්නවත් ඇලේ මාළුවෙක් නැහැ. ගරු සභා පතිතුමනි ඔබතුමාගේ අවධානය මේ සම්බන්ධව යොමු කරන්න කියල

ඉල්ලා සිටිනවා. මේ කටු පොල් මිශ්‍ර වතුර නිසා විශේෂයෙන් අපේ ප්‍රදේශයේ තේ මැරෙනවා. වහින්න ගත්තම ගංවතුර ගලන දාට විශේෂයෙන් මේ කටුපොල් පිටකරනවා. මම ළඟ ඒ පින්තූරත් තියෙනවා.මේ අපද්‍රව්‍ය මිශ්‍ර වතුරට තේ වගාව යට වුණාම ගං වතුර බැහැල ගියාට පස්සේ තේ ඔක්කොම මැරෙනවා. මිනිස්සු කතා කරන්නේ කටුපොල් කර්මාන්ත ශාලාවෙ සේවකයින් ගැන. ඔවුන්ගේ ජීවත්වීම ගැන. අපේ ජීවත්වීම ගැන කතා කරන්න කෙනෙක් නැහැ. තේ වගා හිමියන්ගේ රැකියාව නැති වෙනවා. ඒ මිනිස්සු කරන කියන දේවල් නැති වෙනවා. ඒ පිළිබඳ සභාවේ අවධානය යොමු කරනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි ඊයේ පෙරේදා ඌරල මළගෙදරකදී කතාවකදීත් කතා කළා. පාරට කුණු ගෙනැල්ල දාන එක පිළිබඳව. ඒ කුනු මිනිස්සු ගෙනැල්ල උදේ පාන්දර රුක්මල් ගොඩින් ඇළට දානවා එක්කෝ ඌරල පාලම ලඟින් ඇළට දානවා. උදේට බස් එකට යන ගමන් කුණු ටික ගෙනැල්ලා දාන්නෙ ඇලට. ඉතින් ඒවගේ ජනතාවක් ඉන්නවා. සභාපතිතුමනි ඇල අයින්වල කෘෂි කර්ම දෙපාර්තමේන්තුවෙන් කරනව වගේ කෝටුවලින් කොම්පොස්ට් කොටුවක් හදන්නත් පොලිතින් දාන්න වෙනම තැනක් හදන්නත් මම යෝජනාවක් ඉදිරිපත් කරනවා. මම ඒ කිට්ටුව රුක්මල් ගොඩ පුස්සවෙල මහත්තයත් එක්ක කතා කළා. එයා කියනවා එයාලා ඒක නඩත්තු කරන් නම් හදලා දෙන්න කියල. යටින් පෝර ටික ඇදලා ගන්නත් පුළුවන්.පොලිතීන් ටික ඒ අය පුච්චලා දාන්නම් කිව්වා උදව්වක් වශයෙන්. එහෙම ප්‍රජාවගේ සහයෝගය අරගෙන කුණු ගේන මිනිසුන්ට කුණු දන්න තැනක්, දිරන කුණු වෙනමයි පොලිතින් ප්ලාස්ටික් දාන්න වෙනම තැනකුයි හදන්න කියලා මම යෝජනාවක් කරනවා. එතකොට කුණු අරගෙන එන්න යන්න ඕනත් නැහැ. ගෙනැල්ල ඇළට නොදා මේ කොටුවට දාවි. ඒ පිළිබඳවත් මතක් කරමින්, ඒ වගේම madush ගැන කතා කරන්න හිටියත් අපේ විපක්ෂ නායකතුමා කතා කළා. ඒ වගේම මම ස්තුතිවන්ත වෙනවා. වසන්ත මන්ත්‍රීතුමා අපට ගෙදරට ආරාධනා කරල සංග්‍රහ කළා. ඔබතුමාටත් දියණියටත් සුභ අනාගතයක් කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම අපේ ධනංජය මන්ත්‍රීතුමාගේ උපන් දිනය වෙනුවෙන් එතුමාටත් සුබ අනාගතයක් කියල පතනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි පුස්තකාල ඉස්සර සෙනසුරාදා ඉරිද දවස් වල වරුව වගේ ඇරලා තියෙනවා. දැන් එහෙම නැහැ. මම හිතන්නේ පත්තර බලන්න ඉරිද දවස්වලත් ඇරලා තිබුණා. ඒක නිසා දැනුත් ඉරිදා දින වරුවක්වත් ඇරලා නිවාඩු දවසේ මිනිස්සුන්ට පත්තර බලන්න අවස්ථාව ලබා දෙන්න කියලා ඉල්ලනවා. ඒ පිළිබඳ අවධානය යොමු කරාවි කියලා බලාපොරොත්තු වෙනවා. ඔබතුමාගේ යම් අඩුපාඩු කම් ඇති. ඔබතුමා ඇත්තටම සාර්ථක සභාපති වරයෙක් හැටියට මම නම් දකිනවා. ඔබතුමා දැන් තේරුම් අරගෙන අවබෝධයකින් වැඩ කරගෙන යනවා. මම හිතන්නේ මීටත් වඩා ඉදිරි වර්ෂයේ ඔබතුමා සාර්ථකව මේ කටයුතු කරාවි කියලා මම හිතනවා. ඔබතුමා සැහෙන කැපවීමක් බොහොම ඉවසීමෙන් කළා. නිසා තමයි පක්ෂ විපක්ෂ හැමෝගෙම සහයෝගය ඔබට ලැබෙන්නේ. සභාපතිතුමා මේ ගෙන යන වැඩපිළිවෙල ශක්තිමත්ව කරගෙන යන්න ශක්තිය ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, සියලු දෙනාටම සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු මන්ත්‍රීවරුනි, හිටපු සභාපතිතුමා අජිත් මහත්තයගෙ යෝජනාව ගරු අමාත්‍ය වජිර අබේවර්ධන මැතිතුමාට යවන්න කටයුතු කරන්නම්.පිරිමි පාර්ශවය රාජ්‍ය සේවයේ දී විශේෂයෙන්ම ග්‍රාම නිලධාරී සේවයේ අඩු වීම විශාල ගැටලුවක් පැය 24 රේ සේවාවල කාන්තාවන්ට නියැලීම බොහෝ අසීරුයි.

ඒවගේම හිටපු සභාපති චන්ද්‍රසහබන්දු මහතාගේ යෝජනාව ඉතාමත් අත්‍යවශ්‍ය කාරණයක්.ගාල්ල බන්ධනාගාරයේ 65% ක් ඉන්නෙ මත්ද්‍රව්‍ය වැරදි කාරයො.99.9% ක්ම සිංහල, බෞද්ධ තරුණ අය.මේ මත්ද්‍රව්‍ය නිසා විනාශ වෙන්නෙ සිංහල බෞද්ධයො.මත්ද්‍රව්‍ය පිළිබඳව ජනාධිපතිතුමා ඇතුලු

ඒ කාර්යය සාධක බලකායන් දැන් වර්තමානයේ දියත් කරන කටයුත්ත ඉතා වැදගත්.මත්ද්‍රව්‍ය නිසා විනාශ වෙන්නෙ සිංහල බෞද්ධ තරුණ පිරිසයි.එම විනාශය අපි නතර කළ යුතුයි.

සභාව පත්වෙලා දැනට වසරක් ගෙවිල තියෙනව මම හැකි උපරිමයෙන් වැඩ කර ගෙන ගියා.පසුගිය සභා වාරවල මුදල් තත්වය හොඳයි.මන්ත්‍රී ප්‍රතිපාදන ගලාගෙන ආව.අද අපේ මන්ත්‍රී වරුන්ට ප්‍රතිපාදන නැහැ.මෙතන තිබෙන මුදලින් තමයි බල්බ් එක හරි දාන්න ඕන. අපට විදුලිය සඳහා අවුරුද්දක් තුල 150,000.00 ක් වගේ තමයි ලැබිල තියෙන්නෙ.මුලු ලයිට් ප්‍රමාණය වන එක්දහස් තුන්සිය ගණනින් හත්සියය ඉක්මවා අලුත්වැඩියා කරල තියෙනව.පසු ගියකාලෙ රෑ 8.30 පමණ වෙනකම් ලයිට් හැදුවා.මහන්සිය වැඩි කමට ලෙස්ලි අසනීපත් වෙලා.

මෙම සභාවේ 13 දෙනෙක් සිටින විට පස් හය දෙනෙක් ගෙන් තමයි ප්‍රශ්න ඇති වෙන්නෙ.නමුත් මම ඒකාධිපති පාලකයෙක් ලෙස වැඩ නොකරන නිසා දැන් 27 දෙනාම මට කරදර කරනව.මම කාටත් ඇහුම් කන් දීල කටයුතු කරන නිසා තමයි මට මෙහෙම වෙන්නෙ.අපේ බැදීම් තියෙනව ඒ බැදීම් වලට යටත් වෙන්න වෙනව.ඒ මගේ මනුස්සකම.අපෙන් සමහර වෙලාවට අතපසු වීම් වෙනව.විශේෂයෙන්ම අනතුරුදායක ගස් පැමිණිලි වලදි විවිධ ගැටලු වලට මම මුහුණ දෙනව.ඇතැම් අය 18 වතාවක් ඇවිත් තියෙනව.සමහර වෙලාවට දෙපාර්ශවයම කැදවල අපි ගැටලු විසදනව.දින 14 කින් ගස කපන්න ලිපිය යැවූ විට මාත් සමග පෞද්ගලිකව තරහ වෙනව.මන්ත්‍රී තුමන්ල දෙපාර්ශවය වෙනුවෙන්ම මට කතා කරනව.එවිට මම බොහොම අමාරුවෙන් ප්‍රශ්න විසදිය යුතුයි. අපට ඉදිරියෙදි ලැබෙන්න මුදලක් නැහැ.මේ මුදල් හරි පරිස්සමින් වියදම් කරන්නෙ.මීට පස්සෙ ලයිට් එකක්වත් දාන්න බැරිවේවි.වනිගරත්න මන්ත්‍රී තුමාගේ පාසලේ ක්‍රීඩා උත්සවයට වතුර බවුසර් ඉල්ලුවෙ සංවිධායක කමිටුවෙ කෙනෙක්.මම කිව්ව මන්ත්‍රී තුමාට ඉල්ලන්න තිබුන කිය ල.ඒ වගේ අතපසු වීම් වෙනවා. මම වතුර බවුසරේ දුන්න.

චන්දිමා මන්ත්‍රී තුමිය කියපු වැලි සෝදන තැනට අපි ගිහිල්ල අවසන් නිවේදනය දුන්න.ඊලගට කටුපොල් පිළිබදව 15 වැනිදට කර්මාන්ත ශාලාවට ගිහිල්ල අවසන් තීරණයක් ගන්න මන්ත්‍රී තුමන්ලාට එදිනට සහභාගි වෙන්න කියලා.මම ඉල්ලා සිටිනවා.

අරුණ ශාන්ති මන්ත්‍රීතුමිය 2018 විගණන වාර්තාව ඉල්ලුවා. ඒක තවම අපට ලැබිල නැහැ. 2016 – 2017 වාර්තා තමයි ලබා දුන්නෙ.සමහර ලේඛන ලබා දීමට බැරි කාරනා තියෙනවා. මාපලම පාර පිළිබද සියලුම තැන්වල දීර්ඝ කාලීනව කතා වුනා. නමුත් අපට කළ හැකි දෙයක් නැහැ.මෙවරත් PRD එකට කියන්නම්. කෙනෙක් කසිප්පු විකිනුවට අපට කසිප්පු අල්ලන්න බැහැනෙ. අපි පොලිසියට කියන්න ඕන. ඒ වගේ සමහර ගැටලු අපි අදාල ආයතනවලට දැනුම් දෙනවා.

මාපලගම වැසිකිලිය ඉදිරියෙදි ඉදිකිරීමට කටයුතු කරගෙන යනවා. මාපලගම ජල ප්‍රශ්නය විසදීමට අලුත් මෝටරයක් සවිකර ආයුර්වේදයට සහ වැසිකිලියට ජලය සැපයීම සිදු කළා. පියල් මන්ත්‍රීතුමා ඒ පිළිබදව වැඩි සැලකිල්ලක් දක්වනවා. ඒ වගේම පිට්ටනියෙ දාපු ගල් මම ඉවත් කරවන්නම්.

මන්ත්‍රීතුමන්ලාගේ ඉල්ලීම් තිබුනට අපට සිටින කම්කරුවන් පස් හය දෙනාගෙන් මේ සියල්ල කරන්න අපහසුයි. උඩුගම පන්සලේ පෙරහැරට වැඩ කරන්න යැවුවා, මුලන පන්සලේ උත්සවයට වැඩ කරන්න යැවුවා. ඇප්තොප් එකේ දයානන්ද බයිසිකලෙන් වැටිල අත කැඩිල නිසා ඒකට සහයට යැවුවා. සෞඛ්‍ය කම්කරුවන් ඉල්ලල යෝජනා දැම්මෙ ඒ නිසයි .ඒ වුනත් පඩි ගෙවන්න මුදල් අවශ්‍යයි. තල්ගස්වල ඉඩම් කිහිපයකට මැනුම් නියෝග ඇවිල්ල තියෙන්නෙ. ඒවා මුදල් ගෙවලා ලබා ගත යුතුයි. ඒ සදහා මුදල් අවශ්‍යයි. අපි භුක්ති විදින බොහෝ ඉඩම්,දේපොල අපට අයිතිය නැහැ. උඩුගම උපකාර්යාලයත් ඒ වගේමයි. මුලන ආනන්දාරාම පන්සලේ චෛත්‍යයට මුල් ගල් තබන උත්සවයට සියලුම දෙනා සහභාගි වෙන්න. ඒ පන්සලත් ,ඉස්කෝලෙත් මගේ තාත්තා මූලික

වී හදල තියෙන්නෙ. සජිත් ප්‍රේමදාස ගරු ඇමතිතුමා ලක්ෂ 35 ක් යොදවල වෙහෙර හදල දෙනවා. එයට අපි ස්තූති වන්ත වෙනවා. මගේ තාත්ත කරපු සේවාව මට කරන්න බැරි වුනාට දේශපාලකයෙක් වශයෙන් මම උදවු කරනවා. සභාව පත්වෙලා වසරක් ගත වෙන මොහොතෙ මාර්තු 28 වැනිදාට මම බලාපොරොත්තු වෙනවා පෙරපාසල් ළමුන්ගේ නිල ඇඳුම් ලබාදීමත්, 1991 සිට පත්වුනු මන්ත්‍රීවරුන්ට, සභාපති වරුන්ටත් උපහාර උළෙලක් පවත්වන්න. ඒ සඳහා අනුග්‍රාහක බවතුන් හොයා දෙන්න. ඒ සඳහා සහය දෙන්න කියල ඉල්ලනවා. මෙම සභාව දකුණු පළාතටම ආදර්ශයක්. මම මේ ආයතනයට නොපැමිණියේ දින 10 -15 ක් පමණයි. ඔබතුමන්ලා පෙන්වා දුන් අඩු පාඩු සම්පූර්ණ කරගෙන ඉදිරියෙදි යහපත් සභාවක් හැටියට පත් කරන්න මම කටයුතු කරනවා. මූල්‍ය තත්වය හොඳ වුනොත් මීට වැඩිය වැඩ කොටසක් කරන්න පුලුවන්. එහෙනම් ලබන සභා වාරයේ හමුවන තුරු සියලු දෙනාට සුභ අනාගතයක් පතමින්, සභාවේ කටයුතු මෙතෙකින් නිමා කරනවා. බොහොමත්ම ස්තූතියි.

සභාපති,

නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී                                        දිනය:- ..............................